# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,497 - 2026 ජූලි මස 10 සිකුරාදා - 2026.07.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු … … | - | විභාග, විභාග ප්‍රතිඵල ආදිය … … … … … | - |

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජූලි මස 31 දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජූලි මස 17 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

0000 - B 82808 - (2026/07)
E - 01

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෂඪ වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයින් සඳහා නීති සහ උපදෙස්

1976 අංක 19න් සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ විධිවිධානයන්ට සහ වරින්වර පනවනු ලබන නීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට සියලු විභාග අපේක්ෂකයින් බැඳී ඇත.

1976 අංක 19 සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ 20 වගන්තිය මගින් විභාග කොමසාරිස් ජනරාල්වරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත කොන්දේසි හා සීමා කිරීම් නියම කරනු ලැබේ.

සියලු විභාග අපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතු අතර මෙම නීති කිසිවක් උල්ලංඝනය කරන විභාග අපේක්ෂකයකුට විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි පහත දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකි ය.

(i) විමර්ශනයට භාජනය වූ මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම
(ii) විමර්ශනයට භාජනය වූ විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සකු කිරීම
(iii) මුළු ජීවිත කාලයටම විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන සියලු විභාගවලට පෙනී සිටීම තහනම් කිරීම
(iv) නිශ්චිත කාලවකවානුවක් සඳහා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවලට පෙනී සිටීම තහනම් කිරීම
(v) අත්හිටවූ විභාග තහනමක් සහිතව ලිපියක් නිකුත් කිරීම
(vi) සහතික පත්‍රය යම්කිසි කාලසීමාවක් තුළ තහනම් කිරීම
(vii) ප්‍රසිද්ධ විභාග පනත යටතේ අපරාධ නඩුවක් පැවරීම සඳහා විභාග අපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ එම ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම
(viii) විභාග අපේක්ෂකයා රජයේ සේවකයකු වන අවස්ථාවකදී විභාග අපේක්ෂකයාගේ ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් අදාළ විභාග අපේක්ෂකයාගේ පත්වීම් බලධාරියා වෙත (විනය ක්‍රියා මාර්ග ගැනීම සඳහා) වාර්තා කිරීම

විභාගයට පෙර හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ මොනයම් අවස්ථාවකදී වුවත් එවැනි විභාග අපේක්ෂකයකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

1. සියලුම විභාග අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී සහ විභාග පරිශ්‍රය තුළදී විභාග ශාලාධිපතිට සහ ඔහුගේ කාර්ය මණ්ඩලයට ද අනෙකුත් විභාග අපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස හැසිරිය යුතුය. එසේම, විභාග අපේක්ෂකයන් විභාග පරිශ්‍රයේ දේපළවලට හෝ විභාග කාර්ය මණ්ඩලයේ පෞද්ගලික දේපලවලට කිසිදු අන්දමකින් හෝ අලාභ හානි නොකළ යුතු ය.

2. විභාග අපේක්ෂකයින් විභාගය පවත්වාගෙන යන කාලසීමාව තුළදීත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතිගේ සහ ඔහුගේ කාර්ය මණ්ඩලයේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයට උත්තර ලිවීම ආරම්භ කර පැය භාගයක් ගත වූවාට පසු කිසිදු විභාග අපේක්ෂකයකු විභාග ශාලාවට ඇතුළු කර ගනු නොලැබේ. විභාගය අවසන් වන තුරු ද කිසිම අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටව යාමට ඉඩ ලබා දෙනු නොලැබේ. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට නියමිත වේලාවට සහභාගී වීමට කටයුතු කළ යුතු ය.

4. සෑම විභාග අපේක්ෂකයකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුය. තමන්ට නියම කරන ලද අසුන හැර වෙනත් තැනක අසුන් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදු වේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළතදී විභාග කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතා බහ කිරීම හෝ පණිවිඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන් ම තහනම් වේ.

6. විභාග අපේක්ෂකයකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ අපේක්ෂකයාගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම ලිවීම, උත්තර පත්‍රය හඳුනාගත හැකි වන අයුරින් යම් සලකුණක් හෝ සටහනක් යෙදීම, උත්තර පත්‍රවල අසභ්‍ය හෝ අනවශ්‍ය දේ ලිවීම, උත්තර පත්‍ර සමග මුදල් නෝට්ටු ඇමිණීම සපුරා තහනම් වේ. අන්‍ය විභාග අපේක්ෂකයකුගේ විභාග අංකය තම උත්තර පත්‍රයේ ලිවීම ද වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංක ලියා ඇති උත්තර පත්‍ර ද ප්‍රතික්ෂේප කිරීම සිදු කෙරෙනු ඇත.

7. තමන් වෙත විභාග ශාලාවේදී සපයන කඩදාසි (විභාගය පැවැත්වෙන දිනයට අදාළව නිරීක්ෂකගේ කෙටි අත්සන හා දිනය යොදා ඇති පිළිතුරු ලිවීමේ කඩදාසි) හැර ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙනත් තැනක හෝ කිසිවක් නොලිවිය යුතු ය. මෙම උපදෙස්වලට පටහැනිව කටයුතු කිරීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සලකනු ලැබේ.

8. විභාග අපේක්ෂකයින් වෙත සපයනු ලබන කඩදාසි හෝ පිළිතුරු ලියන පොතක් හෝ ඉරා දැමීම හෝ පොඩි කිරීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක් ම පැහැදිලිව කපා හැර උත්තර පත්‍රයට ඇමිණීම හෝ විභාගය අවසානයේ පිළිතුරු පත්‍ර සමග භාරදීම හෝ ලබා දෙන උපදෙස් පරිදි සිදු කළ යුතුය. විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටතට ගෙනයාම තහනම් වේ. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක නැවත ලියවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතු ය.

9. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම් ය. මෙම සියලු ද්‍රව්‍යයන් විභාග කොමසාරිස් ජනරාල් සතුවන අතර මෙම නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවක් ලෙස සලකනු ලැබේ.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන ලිපි ද්‍රව්‍ය හා එක් එක් විභාගයේදී ළඟ තබා ගැනීමට ලිඛිතව අවසරදී ඇති ද්‍රව්‍යයන් හැර වෙනත් සටහන් පොත්, සටහන් ඇතුළත් කොළ හෝ කොළ කැබලි යනාදිය විභාග ශාලාව තුළ විභාගයට පෙනී සිටින අවස්ථාවේදී තමා සන්තකයේ හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතු ය. එසේම විභාග ශාලාව තුළ දී ජංගම දුරකථන, විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග (Electronic Communication Devices) තමා සන්තකයේ හෝ සමීපයෙහි තබා ගැනීම සහ එම උපකරණ / උපාංග භාවිතා කර බාහිර පාර්ශ්වයන්ගේ උදව් ලබා ගැනීම හා විභාගය පැවැත්වෙන අතරතුර වෙනත් පාර්ශ්ව හා සමාජ මාධ්‍ය වෙත තොරතුරු යැවීම වංචනික ක්‍රියාවක් සේම දඬුවම් ලැබිය හැකි වරදක් වන්නේ ය.

11. විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග ඉහත 10 ඡේදයේ විස්තර කර ඇති කාර්යයන් සඳහා භාවිතා කර අසු වුවහොත් එම උපකරණ / උපාංග අදාළ විමර්ශන කටයුතු අවසන් වන තුරු විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ භාරයට ගැනීමට කටයුතු කරනු ලැබේ.

12. විභාග ශාලාවේ අසුන් ගැනීමෙන් පසු විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අවස්ථාවේදී කිසිම විභාග අපේක්ෂකයකු ළඟ, විභාගය සඳහා ගෙන ඒමට අවසර ලබාදී නොමැති කිසිදු ද්‍රව්‍යයක් හෝ උපකරණයක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන් ම තහනම් ය. විභාග ශාලාධිපති හෝ කාර්ය මණ්ඩලය නියම කළහොත් සෑම අපේක්ෂකයකුම තම සන්තකයේ තිබෙන දෑ සහතික කිරීමට සහ පරීක්ෂා කිරීමකට යටත් වන අතර මෙම අවශ්‍යතා කඩ කිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට උත්සහ දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. යම් අපේක්ෂකයකු වෙනත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ සංඥා මගින් හෝ වෙන කිසිවකින් හෝ කොපි කිරීම හෝ කොපි කිරීමට ප්‍රයත්න දැරීම හෝ වංචා සහගත ලෙස කටයුතු කිරීම හෝ වරදක් වන්නේ ය. වෙන අයදුම්කරුවකුට උදව් දීම ද වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් හෝ විභාග කාර්ය මණ්ඩලයෙන් හෝ උදව් ලබා ගැනීම ද වරදක් වන අතර උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසියට යටින් තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතු ය.

14. විභාගය ආරම්භ වී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයකුට ඉඩ දෙනු නො ලැබේ. එහෙත් වැසිකිළි/කැසිකිළි යාමට අවශ්‍යතාවයක් උදෙසා විභාග අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටතට යන්නට වුවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර කාර්ය මණ්ඩලයේ නිලධාරියකුගේ සුපරීක්ෂාකාරිත්වය යටතේ අපේක්ෂකයාට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එලෙස පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු/ඇය සෝදිසියකට භාජනය විය යුතු ය.

15. විභාග ශාලාවේ පිළිතුරු ලිවීමට පටන් ගැනීමට පෙර හෝ පසුව නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවක් වන්නේය. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ ව්‍යාජ අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීම වංචනික ක්‍රියාවක් ලෙස සලකනු ලැබේ.

16.විභාග අපේක්ෂකයකු හෝ විභාග අපේක්ෂකයකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

17. විභාග අපේක්ෂකයන් පහත උපදෙස් පරිදි ක්‍රියා කළ යුතු ය. ඃ

(i) සෑම විභාග අපේක්ෂකයෙකුම තම ප්‍රවේශ පත්‍රයේ අත්සන සහතික කර ගැනීමත්, ඉල්ලුම් කරන ලද විෂයයන් හා ප්‍රවේශ පත්‍රයේ සඳහන් විෂයයන් අතර නොගැලපීමක් පවතින්නේ නම් විභාග දෙපාර්තමේන්තුව විමසා විභාගයට පෙර සංශෝධනය කර ගැනීමත් සිදු කළ යුතු ය.

(ii) විභාගය පටන් ගැනීමට පැය බාගයකට (1/2) පෙර විභාග ශාලාව වෙත පැමිණීම සුදුසු වන අතර විභාග ශාලාව නිශ්චිතව නොදන්නා විට විභාගය පටන් ගන්නා දිනට කලින් ඒ පිළිබඳ සොයා බලා නියම ස්ථානය නිශ්චිතව හඳුනා ගැනීම යෝග්‍ය වේ.

(iii) විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍රය ඉදිරිපත් කර තම අනන්‍යතාව තහවුරු කළයුතු ය.

(අ). අනන්‍යතාව ඔප්පු කිරීමට අවශ්‍ය ලේඛන විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට කටයුතු කරන අතර, යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ පිළිබඳ විභාග ශාලාධිපති දැනුවත් කර විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීම කටයුතු කළයුතු ය.

(ආ). සෑම අපේක්ෂකයකුම තම අනන්‍යතාව පැහැදිලිව පෙනෙන ලෙස සම්පූර්ණ මුහුණ හොඳින් හඳුනාගත හැකිවන අයුරින් විභාගය පැවැත්වෙන කාලසීමාව තුළ විභාග ශාලාවේ රැඳී සිටිය යුතු ය.

(iv) විභාග අපේක්ෂකයන් බ්ලූටූත් වැනි විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග (Electronic Communication Devices) භාවිතා නොකරන බව සහතික කර ගැනීම සඳහා විභාග ශාලාවේදී තම දෙකන විවෘතව පැහැදිලිව පෙනෙන ලෙස තබාගත යුතු ය.

(v) විභාග ශාලාවේදී ඔබට ලබා දෙනු ලබන කඩදාසි හැර වෙන මොන ම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුය. ඉතිරිවන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ මේසය මත තබා යා යුතු ය.

(vi) විභාග අපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, මකන, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතු ය.

(vii) තමන් භාවිතා කරන පිළිතුරු ලිවීමේ පොත සහ සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය පැහැදිලිව සඳහන් කළ යුතු ය. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද, පිරිසිදුව ද උත්තර ලිවිය යුතු ය. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු එම ප්‍රශ්නයේ ම අනෙක් කොටස පටන් ගැනීමට පෙර එක් රූලක්වත් හිස්ව තිබිය යුතුය. සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.

(viii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන් කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුය. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතු වන බැවින් ප්‍රශ්න අංක නිවැරදිව යෙදීමට කටයුතු කළ යුතු ය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද, සෑහෙන පමණ විශාලව ද තිබිය යුතු ය.

(x) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරාගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින් සඳහන් කර ඇති උපදෙස් හොඳින් කියවා බැලිය යුතුය. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට අනුව පිළිතුරු ලබාදී නොමැති අවස්ථාවලදී ලකුණු ලබා දීම සිදු කරනු නොලැබේ.

(xi) එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද පොතට අමතරව ලියන කඩදාසි පිටු අංක පිළිවෙළ අනුව එකතුකර වම් පැත්තේ ඉහළ කෙළවරේ නොගැලවෙන සේ ගැටගැසීම / ඇමිණීම කළයුතුය. පිළිතුරු පත්‍රය භාරදීමට පෙර සියලුම පිළිතුරු ලියූ කොළ අමුණා තිබේද යන්න තහවුරු කරගත යුතුය. පිළිතුරු පත්‍ර භාරදුන් පසුව විභාග මධ්‍යස්ථානයෙන් බැහැරට ගෙන ගිය කිසිදු පිළිතුරු ලියූ කඩදාසියක් ඇගයීමට ලක් කරනු නොලැබේ.

(xii) ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට හෝ ඔහුගේ කාර්යය මණ්ඩලයේ නිලධාරියකුට භාරදිය යුතුය. උත්තර පත්‍ර එකතු කරන තුරු ඔබගේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම්විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකි ය.

(xiii) යම් කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතිට හෝ ඔහුගේ කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකුට කථා කිරීමට අවශ්‍ය වූ විට අන් අයට බාධාවක් නොවන සේ දෙවරක් මේසයට තට්ටු කිරීමෙන් සංඥා කළ යුතු ය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

සිංහල මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

**වවුනියාව දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ:-

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ / අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර ඒ සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 වන අතර, වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

06. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.-* අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

07. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

08. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

09. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

10. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 අගෝස්තු මස 10 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 ජුනි මස 13 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| වවුනියාව | වවුනියාව දකුණ | සින්න චෙට්ටිකුලම් කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ වවුනියාව දකුණ කොට්ඨාසයේ (සාමාන්‍ය) විවාහ රෙජිස්ට්‍රාර් ධුරය (සිංහල මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වවුනියාව |

07 - 103

---

**අධිකරණ සේවා කොමිෂන් සභාව**

ගොවිජන සමාලෝචන මණ්ඩල පිහිටුවීමට අවශ්‍ය සමාලෝචන මණ්ඩල සාමාජිකයින් (මූල මණ්ඩලයක්) පත්කර ගැනීම

2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 42අ(1) වගන්තිය අනුව සමාලෝචන මණ්ඩල ස්ථාපිත කිරීමේ කාර්යය සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් නීති ක්ෂේත්‍රයේ සහ ගොවිජන ක්ෂේත්‍රයේ පුළුල් දැනුමක් ඇති තැනැත්තන් අතරින් තැනැත්තන් නව දෙනකුට නොවැඩි සංඛ්‍යාවක් ඇතුළත් මූල මණ්ඩලයක් වසර තුනක කාලසීමාවක් සඳහා පත් කරනු ලැබිය යුතු ය.

ඒ අනුව අවශ්‍ය ගොවිජන සමාලෝචන මණ්ඩල සාමාජිකයින් පත් කර ගැනීම සඳහා මනා චරිතයකින් සහ යහපත් සෞඛ්‍ය තත්ත්වයකින් යුත් වයස අවුරුදු 70 ට නොවැඩි පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවීමට අධිකරණ සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත:-

1. විශ්‍රාමලත් විනිශ්චයකාරවරුන්;
2. වසර දහයකට වැඩි පළපුරුද්දක් සහිත නීතිඥවරුන්
3. ගොවිජන සේවා නීතිය පිළිබඳව කටයුතු කරන හෝ කටයුතු කරනු ලැබූ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ විධායක මට්ටමේ අවුරුදු දහයක පළපුරුද්දක් ලැබූ තැනැත්තන්,

සියලුම අයදුම්පත් **2026 සැප්තැම්බර් මස 10 වැනි දින හෝ ඊට පෙර** අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත එවිය යුතු ය.

මූල මණ්ඩල සාමාජිකයකු සඳහා 2023 වර්ෂයේ දී ගෙවනු ලැබූ දීමනා පහත පරිදි වේ.

මාසික දීමනාව - රු. 50,000/-
ප්‍රවාහන දීමනාව - රු. 10,000/- (මාසිකව) ගෙවනු ලැබේ.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි.

**ප්‍රසන්න අල්විස්,**
ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2026 ජුලි මස 02 වැනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

07 - 132

**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය පුරප්පාඩු**

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ පහත තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|
| අධ්‍යක්ෂ තනතුරු | |
| අධ්‍යක්ෂ - මූල්‍ය - (HM 1-1) | -01 |
| අධ්‍යක්ෂ - මත්ද්‍රව්‍ය නිවාරක, අධ්‍යාපන හා පුහුණු - (HM 1-1) | -01 |
| අධ්‍යක්ෂ - පර්යේෂණ - (HM 1-1) | -01 |

**1. අධ්‍යක්ෂ තනතුරු**

**1.1 තනතුරු නාමය - අධ්‍යක්ෂ මූල්‍ය**
**සේවා ගණය - ජ්‍යෙෂ්ඨ කළමනාකාර - (HM 1-1)**
**පුරප්පාඩු ගණන - 01**

*අ.* **සුදුසුකම් :**

*අ.1* **බාහිර අයදුම්කරුවන් (පහත සඳහන් 01 හෝ 02)**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, මූල්‍ය/ ගිණුම්කරණය/ වාණිජවේදී යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබාතිබීම;

*හෝ*

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණය ආයතනයේ සාමාජිකත්වය ලබා තිබීම හෝ එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) සාමාජිකත්වය ලබා තිබීම හෝ වරලත් සහතිකලත් ගණකාධිකාරී ආයතනයේ (ACCA) සාමාජිකත්වය ලබා තිබීම;

*සමග*

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

*සහ*

ඉහත සඳහන් ප්‍රථම උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රජයේ හෝ රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත ආයතනයක/ මණ්ඩලයක/ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ (MM 1-1) තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 13 (දහතුන)ක පළපුරුද්දක් තිබීම.

02. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ පූර්ණ සාමාජිකත්වය.

*සහ*

රජයේ, රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත ආයතනයක/ මණ්ඩලයක/දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ (MM 1-1) තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 13ක පළපුරුද්දක් තිබීම.

*අ.2* **අභ්‍යන්තර අයදුම්කරුවන් :**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම;

*හෝ*

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙහි මධ්‍ය කළමනාකාර සේවා ගණයෙහි (MM 1-1) I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර 3 (තුන) ක අදාළ විෂය ක්ෂේත්‍රයේ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම;

*සමග*

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු වේ.

*ආ.* **වයස :**
අවු : 35ට නොඅඩු හා අවු: 55ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

*ඇ.* වැටුප් කේත අංකය - HM 1-1

*ඈ.* **මාසික වැටුප් පරිමාණය -**
HM 1-1 ක.ච.01/2025 (රු.140,640 - 15 x 4,100 - රු. 202,140/-)
(වැටුපට අමතරව රජයේ අනුමත දීමනා හා වරප්‍රසාද හිමිවේ)

*සැ.යු.:-* මෙයට අමතරව නිල වාහන හිමිකාරිත්වය ලබන අතර රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 1/2015 (i) හා (ii) ප්‍රකාරව ඉන්ධන දීමනාව හා මෙයට අමතරව සන්නිවේදන දීමනා PED 2/2022 චක්‍රලේඛය අනුව හා වෘත්තීය දීමනාව ක. චක්‍රලේඛ 01/2025 අනුව ලබාදේ.

**1.2 තනතුරු නාමය - අධ්‍යක්ෂ (මත්ද්‍රව්‍ය නිවාරක, අධ්‍යාපන හා පුහුණු)**
**සේවා ගණය - ජ්‍යෙෂ්ඨ කළමනාකාර - (HM 1-1)**
**පුරප්පාඩු ගණන - 01**

*අ.* **සුදුසුකම් :**

*අ.1* *බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්*

*විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, සමාජීය විද්‍යාවන් යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම;*

*සමග*

*විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, තනතුරට අදාළ* විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ පශ්චාත් උපාධියක් ලබා තිබීම;

*සහ*

ඉහත සඳහන් ප්‍රථම උපාධි සුදුසුකම් ලබාගැනීමෙන් පසුව රජයේ හෝ රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත ආයතනයක/ මණ්ඩලයක/ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ (MM 1-1) තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 13 (දහතුන) ක පළපුරුද්දක් තිබීම.

*අ.2.* **අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් (පහත 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම;

*හෝ*

2. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙහි මධ්‍ය කළමනාකරණ සේවා ගණයෙහි (MM 1-1) I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර 03 (තුන) ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම;

සමග

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු වේ.

*ආ.* වයස :
අවු : 35ට නොඅඩු හා අවු: 55ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

*ඇ.* වැටුප් කේත අංකය - HM 1-1

*ඈ.* **මාසික වැටුප් පරිමාණය -**
HM 1-1 ක.ච.01/2025 (රු.140,640 - 15 x 4,100 - රු. 202,140/-)
(වැටුපට අමතරව රජයේ අනුමත දීමනා හා වරප්‍රසාද හිමිවේ)

*සැ.යු.* **මෙයට අමතරව නිල වාහන හිමිකාරිත්වය ලබන අතර රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 1/2015 (i) හා (ii) ප්‍රකාරව ඉන්ධන දීමනාව හා මෙයට අමතරව සන්නිවේදන දීමනා PED 2/2022 චක්‍රලේඛය අනුව හා වෘත්තීය දීමනාව ක.සේ. චක්‍රලේඛ 5/2017 අනුව ලබාදේ.**

**1.3 තනතුරු නාමය - අධ්‍යක්ෂ - පර්යේෂණ**
**සේවා ගණය - ජ්‍යෙෂ්ඨ කළමනාකාර - HM 1-1**
**පුරප්පාඩු ගණන - 01**

*අ.* **සුදුසුකම් :**

*අ.1.* **බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් :**
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

විසින් පිළිගත්, සමාජ විද්‍යාව/ අපරාධ විද්‍යාව/ සමාජ වැඩ /සංඛ්‍යානය/ රසායන විද්‍යාව/ තොරතුරු තාක්ෂණය යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම;

*සමග*

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ පශ්චාත් උපාධියක් ලබා තිබීම;

*සහ*

ඉහත සඳහන් ප්‍රථම උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රජයේ හෝ රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත ආයතනයක/ මණ්ඩලයක/ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ (MM 1-1) තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 13 (දහ තුන) ක පළපුරුද්දක් තිබීම.

*අ.2* **අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් (පහත 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම;

*හෝ*

2. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙහි මධ්‍ය කළමනාකරණ සේවා ගණයෙහි (MM 1-1) I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර 03 (තුන) ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම;

*සමග*

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු වේ.

*ආ.* **වයස :**

අවු : 35ට නොඅඩු හා අවු: 55ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

*ඇ.* **වැටුප් කේත අංකය** - HM 1-1

*ඈ.* **මාසික වැටුප් පරිමාණය** -
HM 1-1 ක.ව.01/2025 (රු.140,640 - 15 x 4,100 - රු. 202,140/-)
(වැටුපට අමතරව රජයේ අනුමත දීමනා හා වරප්‍රසාද හිමිවේ)

*සැ.යු.-* **මෙයට අමතරව නිල වාහන හිමිකාරිත්වය ලබන අතර රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 1/2015 (i) හා (ii) ප්‍රකාරව ඉන්ධන දීමනාව හා මෙයට අමතරව සන්නිවේදන දීමනා PED 2/2022 චක්‍රලේඛය අනුව හා වෘත්තීය දීමනාව ක.සේ.චක්‍රලේඛ 5/2017 අනුව ලබාදේ.**

**<u>මෙම තනතුරු සඳහා පොදු කරුණු :</u>**

සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර, තනතුරට පැවරෙන කාර්යන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු යි.

**අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයකින්ම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය.**

**<u>අයදුම්පත් ඉදිරිපත් කිරීමේ මාධ්‍යය</u>**

සෑම අයදුම්කරුවෙකුම ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් තම අයදුම්පත් සම්පූර්ණ කළ යුතුය. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ නිල වෙබ් අඩවිය වන <u>www.nddcb.gov.lk වෙත පිවිස, "**වෘත්තීන්**" ( https://www.nddcb.gov.lk/sinhala/careers.php )</u>හි දක්වා ඇති උපදෙස් පරිදි අයදුම්පත සම්පූර්ණ කර **Submit Application** කිරීමෙන් අනතුරුව එහි පිටපත බාගත කර, එම දෘඩ පිටපතට මුදල් ගෙවූ රිසිට්පතෙහි මුල් පිටපත අමුණා ඔබ අයදුම් කරන තනතුරට අදාළ සහතිකපත්වල ඡායා පිටපත් සමඟ ලියාපදිංචි තැපැල ඔස්සේ යොමු කළ යුතු ය.

**<u>බඳවා ගැනීමේ ක්‍රමවේදය</u>**

බඳවා ගැනීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන පරිදි ලිඛිත තරග විභාගයක හා/ හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ.

**<u>පත්වීමේ ස්වභාවය</u>**

ස්ථිර, සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිතය.

**<u>අයදුම්පත් ගාස්තුව</u>**

බාහිර අයදුම්කරුවන් පමණක් අයදුම්පත් ගාස්තුව වශයෙන් රු.500.00ක මුදලක් ඕනෑම ලංකා බැංකු ශාඛාවකින්

"අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය" නමින් ලංකා බැංකුවේ කෝපරේට් ශාඛාවේ (Corporate Branch) අංක 00001643 යටතේ පවත්වාගෙන යන ගිණුමට බැර කර, මුදල් තැන්පතු පත්‍රිකාවේ පිටපතක් ඔබ ළඟ තබාගෙන, එහි මුල් පිටපත (Deposit slip) අයදුම්පතට අමුණා එවිය යුතු ය. අයදුම්පත් ගාස්තුව නැවත ගෙවනු නොලැබේ.

බාගත කරන ලද අයදුම්පත (කවරයේ වම් පස ඉහළ කෙලවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සටහන් කර) අදාළ සහතිකවල පිටපත් සමඟ **2026.07.31** වන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් "සභාපති, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, 383, කෝට්ටේ පාර, රාජගිරිය" යන ලිපිනයට ලැබීමට සලස්වන්න. රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු සේවකයින් තම අයදුම්පත් ආයතන/ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් යොමු කළ යුතු ය.

**අයදුම්පත් භාරගන්නා අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් / අසම්පූර්ණ අයදුම්පත්/ මුදල් තැන්පතු පත්‍රිකාවේ මුල් පිටපත අමුණා නොමැති අයදුම්පත්/ බාගත (Download) කරන ලද අයදුම්පත හැර යොමුකරන ලද වෙනත් අයදුම්පත් හා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**බඳවාගැනීම් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් ගනු ලබන තීරණය අවසන් තීරණය වේ.**

සභාපති,
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය.

ප්‍රකාශිත දිනය : 2026 ජූලි මස 10 වැනි දින,
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය,
383, කෝට්ටේ පාර,
රාජගිරිය.

07 - 159

---

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

අංක 1877/28 දරන 2014.08.28 දිනැති ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවා ව්‍යවස්ථාවේ 11.2 වගන්තිය යටතේ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ I ශ්‍රේණියේ ප්‍රධාන වාස්තු විද්‍යාඥ තනතුරේ පුරප්පාඩුව පිරවීම

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ඇති කරන ලද ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ I ශ්‍රේණියේ ප්‍රධාන වාස්තු විද්‍යාඥ තනතුරට පත් කිරීම සඳහා අංක 1877/28 දරන 2014 අගෝස්තු මස 28 දිනැති *ගැසට්* පත්‍රයේ පළ කරන ලද, 1994/68 හා 2016 නොවැම්බර් මස 24 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයෙන්* සංශෝධනය කරන ලද 2006.01.01 දින සිට බලාත්මක හා ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 11.2 වගන්තියට, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2085/46 හා 2018.08.24 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය* මඟින් සංශෝධනය කරන ලද්දා වූ විධිවිධාන ප්‍රකාරව, නියමිත සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ දැනට I ශ්‍රේණියට උසස් වීම් ලැබූ සක්‍රීය සේවයේ නියුතු නිලධරයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. පුරප්පාඩු සංඛ්‍යාව :

| *අනු. අංකය* | *දෙපාර්තමේන්තුව* | *තනතුර* | *පුරප්පාඩු ගණන* |
|---|---|---|---|
| 01 | සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | ප්‍රධාන වාස්තු විද්‍යාඥ (ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ I ශ්‍රේණිය) | තනතුරු 01 |

**02. සපුරාලිය යුතු සුදුසුකම් :**

I. ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.

**03. තනතුරු සඳහා තෝරා ගනු ලබන ක්‍රමය :**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින්, එම කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පහත දක්වා ඇති ලකුණු ලබා දීමේ පරිපාටිය අනුව ලකුණු ලබා දෙනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට ලක් කර, ඔවුන් ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය සඳහා ලබා ගන්නා ඒකාබද්ධ ලකුණුවල ප්‍රමුඛතා අනුපිළිවෙල මත ඉහත දක්වා ඇති පුරප්පාඩු සංඛ්‍යාවට අනුරූපී වන ලෙස අදාළ තනතුරට පත් කරනු ලබන අතර පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබයි.

**04.** ලකුණු පරිපාටිය :

| *ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ I ශ්‍රේණියේ තනතුරු සඳහා යෝග්‍යතාවය හා කුසලතාවය මත තනතුරට පත් කිරීම - අනුමත ලකුණු පරිපාටිය* | *උපරිම ලකුණු* | *මුළු ලකුණු* |
|---|---|---|
| **01.** සේවා පළපුරුද්ද<br><br>ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ I ශ්‍රේණියේ සක්‍රිය හා සතුටුදායක සේවා කාලය සඳහා ලකුණු ලබා දේ.<br><br>**01.1** රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ: 01/2019 අනුව ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ I ශ්‍රේණියේ ඉහළම සේවා කාලයක් සහිත නිලධරයාට උපරිම ලකුණු ප්‍රමාණය ද අනෙකුත් නිලධරයන්ට ඊට සමානුපාතික ලෙස ද ලකුණු ලබා දේ. | 65 | **65** |
| 02. කුසලතාවය | | **30** |
| **2.1** අතිරේක අධ්‍යාපන සුදුසුකම්<br>**02.1.1** පශ්චාත් උපාධිය | 05 | |
| **2.2** වාස්තු විද්‍යාඥයෙකු වශයෙන් වාස්තු විද්‍යා අධ්‍යාපනය හා වෘත්තීය නඟා සිටුවීම පිළිබඳව දක්වන ලද දායකත්වය<br><br>**02.2.1** ක්ෂේත්‍රයට අදාළව ඉදිරිපත් කරන ලද ප්‍රකාශන<br>• පර්යේෂණාත්මක ප්‍රකාශන (Published papers in journals or conferences)<br>- එක් ප්‍රකාශනයකට ලකුණු 03 බැගින්(උපරිම ප්‍රකාශන 2 යි)<br>• පුවත්පත් / සඟරා ලිපි<br>- එක් ප්‍රකාශනයකට ලකුණු 02 බැගින් (උපරිම ප්‍රකාශන 3 යි)<br><br>**2.2.2** වාස්තු විද්‍යාවට අදාළ දේශීය/ විදේශීය පිළිගත් ආයතනයක දරන ලද තනතුරු සඳහා දරන ලද එක් තනතුරක් සඳහා ලකුණු 02 බැගින් (ලිඛිත සනාථ කිරීම් ඉදිරිපත් කළ යුතු වන අතර උපරිම තනතුරු 03ක් සඳහා ලකුණු ලබා දේ)<br><br>**02.2.3** ප්‍රශංසා සඳහා<br><br>ආයතන ප්‍රධානියා විසින් පොදු 230 බී ආකෘති පත්‍රය මගින් ලබා දී ඇති එක් ප්‍රශංසා ලිපියකට ලකුණු 01 බැගින් (උපරිම ප්‍රශංසා ලිපි 03ක් සඳහා) | 06<br><br>06<br><br>03 | |
| **02.3** තෝරාපත් කරන තනතුරෙහි කාර්ය භාරය සඳහා දායකත්වය දක්වන ආකාරය සම්බන්ධයෙන් පරිගණකය ආශ්‍රයෙන් සිදු කරනු ලබන විනාඩි 10ක ඉදිරිපත් කිරීම (Power Point Presentation)<br><br>i. අදාළත්වය (Relevancy) - ලකුණු 02<br>ii. නිර්මාණශීලීත්වය / (Creativity ) - ලකුණු 02<br>iii. ඒ සඳහා හඳුන්වාදෙන නව්‍යතා හා නව යෝජනා (Innovations & Suggestions) - ලකුණු 02<br>iv. කාල කළමනාකරණය (Time Management) - ලකුණු 02<br>v. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව (Proficiency in English) - ලකුණු 02<br><br>*සටහන -*<br>(*අ*) ඉහත (v) නිර්ණායකය යටතේ ලකුණු ලබා ගත හැක්කේ අයදුම්කරු ඉංග්‍රීසි භාෂාව මගින් මෙම ඉදිරිපත් කිරීම සිදු කරන්නේ නම් පමණි.<br>(*ආ*) ඉදිරිපත් කිරීමට අදාළ දෘඩ පිටපත (Hard Copy) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට එම අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතුය. අමතර වශයෙන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් සකසන ලද ඉදිරිපත් කිරීමේ දෘඩ පිටපතක්ද මෙම අවස්ථාවේ දී ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ. | 10 | |

| *ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ I ශ්‍රේණියේ තනතුරු සඳහා ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත තනතුරට පත් කිරීම - අනුමත ලකුණු පරිපාටිය* | *උපරිම ලකුණු* | *මුළු ලකුණු* |
|---|---|---|
| **03. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය**<br>(a) නායකත්වය - ලකුණු 02<br>(b) සන්නිවේදන හැකියාව - ලකුණු 02<br>(c) පෞරුෂත්වය - ලකුණු 01 | | **05** |
| **මුළු ලකුණු** | | **100** |
| *සැ.යු. –*<br>I. 2.1.1 හා 2.2.1 යටතේ ලකුණු ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන සියලු ප්‍රකාශන සඳහා ලිඛිත සනාථ කිරීම් ඉදිරිපත් කළ යුතු වේ. | | |

**05.** රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවා ව්‍යවස්ථාවේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1877/28 දරන 2014 අගෝස්තු මස 28 දිනැති *ගැසට්* පත්‍රයේ පළ කරන ලද ) එම ව්‍යවස්ථාවට සිදු කර ඇති හෝ මින් මතු සිදු කෙරෙන හෝ සංශෝධනවලට ද යටත්ව, තෝරා ගනු ලබන නිලධරයා ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ I ශ්‍රේණියේ පුරප්පාඩුව පවතින ඉහත තනතුර සඳහා අදාළ තනතුරෙහි රාජකාරි භාර ගන්නා දින සිට ක්‍රියාත්මක වන පරිදි අදාළ තනතුරට පත් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ඇත.

**06.** මෙම නිවේදනයේ දක්වා ඇති අවම සුදුසුකම් සපුරාලන දැනට සක්‍රිය සේවයේ නියුතු නිලධාරීන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

**07.** පහත ආකෘතිය අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය ද සහිතව, ලියාපදිංචි තැපෑලෙන් 2026 අගෝස්තු මස 07 දිනට හෝ එදිනට පෙර ලැබෙන පරිදි "ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, නිදහස් චතුරස්‍රය, කොළඹ 07" යන ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වමත්පස ඉහළ කෙළවරෙහි " ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ I ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු පිරවීම" යනුවෙන් පැහැදිළිව සඳහන් කළ යුතු ය. එදිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාර ගනු නොලබන අතර අයදුම්පත් අස්ථානගත වීම හෝ ප්‍රමාද වීම සම්බන්ධයෙන් වන පැමිණිලි භාර ගනු නොලැබේ.

**08.** සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය බලාත්මක වේ.

**09.** අයදුම්පත්‍රය www.pubad.gov.lk ඔස්සේ ද බා ගත කළ හැකි ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**එස්. ආලෝකබණ්ඩාර,**
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත්
පාලන අමාත්‍යාංශය.

2026 ජූලි මස 02 වැනි දින,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

*ආදර්ශ අයදුම්පත්‍රය*

**ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ I ශ්‍රේණියේ ප්‍රධාන වාස්තු විද්‍යාඥ තනතුරේ පුරප්පාඩුව පිරවීමේ අයදුම් පත්‍රය**

**01.** නිලධරයා සම්බන්ධ තොරතුරු

i. සම්පූර්ණ නම (සිංහලෙන්) :- ........................................................................................

ii. සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :-
........................................................................................
(උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

iii. මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :-
........................................................................................
(උදා: GUNAWARDHANA, H. M. S. K.)

iv. ස්ත්‍රී/ පුරුෂ භාවය :- ස්ත්‍රී ☐ පුරුෂ ☐

v. උපන් දිනය :- වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

vi. ජාතික හැඳුනුම්පත් අංකය :- ☐☐☐☐☐☐☐☐☐☐☐☐

vii. ස්ථිර ලිපිනය :-........................................................................................
........................................................................................

viii. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :-........................................................................................
........................................................................................

ix. අයදුම්පත භාර ගන්නා අවසන් දිනට වයස :- අවු......................, මාස................, දින..................

x. දුරකථන අංකය :-

ජංගම : ☐☐☐☐☐☐☐☐☐☐

කාර්යාලය : ☐☐☐☐☐☐☐☐☐☐

විද්‍යුත් ලිපිනය : ..............................................................................

**02.** තනතුර පිළිබඳ තොරතුරු

i. ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ I වන ශ්‍රේණියට පත් වූ දිනය :- ......................................................

ii. ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ I ශ්‍රේණියට පත් වූ දින සිට අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට සේවා කාලය :-

අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

iii. වර්තමාන සේවා ස්ථානය හා ලිපිනය :- ....................................................................................................................

iv. දැනට දරන තනතුර :- ....................................................................................................................................

v. එම තනතුරට පත් වූ දිනය :- .........................................................................................................................

vi. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්:-

| අනු. අංකය | අධ්‍යාපන සුදුසුකම් | සුදුසුකම සම්පූර්ණ කළ වර්ෂය | ආයතනය |
|---|---|---|---|
| 1. | විද්‍යාපති උපාධිය | | |
| 2. | වෙනත් | | |

vii. ක්ෂේත්‍රයට අදාළ සුදුසුකම් :-

අදාළ ක්ෂේත්‍රය සඳහා දක්වන ලද විශේෂ දායකත්වය

| ❖ පර්යේෂණ හා ප්‍රකාශන | විස්තර | අදාළ වර්ෂය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

❖ පර්යේෂණ සාරාංශ හා නිලධරයා දේශීය/විදේශීය පිළිගත් ආයතනයක දරන ලද තනතුරු සම්බන්ධ තහවුරු කිරීම් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු ය.

**03.** (i) ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ I ශ්‍රේණියට පත් වූ දින සිට වැටුප් රහිත නිවාඩු හෝ අඩ වැටුප් නිවාඩු ලබා තිබේද?

| අනු. අංක: | කාරණය | වැටුප් රහිත/ අඩ වැටුප් නිවාඩු | කාලය | |
|---|---|---|---|---|
| | | | දින සිට | දින දක්වා |
| | | | | |
| | | | | |

(ii) අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පූර්වාසන්න වසර 05 ක සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබේද?

ඔව් ☐ නැත ☐

**04.** (i) ඉකුත් අවුරුදු 05 තුළ විනය දඬුවමකට ලක් වී තිබේ ද? .................................................................

(ii) නොනිමි විනය කරුණු පවතී ද?.........................................................................................

**05.** *අයදුම්කරුගේ ප්‍රකාශය* :

ඉහත සඳහන් තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි.

...................................................... ..........................................................,
දිනය නිලධරයාගේ අත්සන.

**06.** *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය හා සහතිකය* :

අදාළ නොවන කොටස් කපා හරින්න.

I. මෙම අයදුම්කරු සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගෙන හෝ ගැනීමට අදහස්කර නොමැති බව, (ගෙන ඇත්නම් වරද කළ දිනය: දඬුවම් ආදී විනය ක්‍රියා මාර්ග පිළිබඳ විස්තර දක්වන්න) :

II. මෙම අයදුම්කරු I ශ්‍රේණියට උසස් වීමෙන් පසුව වැටුප් රහිත හෝ අඩ වැටුප් නිවාඩු ලබා ගෙන ඇත/ නැත. (ඇත්නම් කාල වකවානු පහත වගුවේ දක්වන්න) :

| *කාලය* | | *අඩ වැටුප්/ වැටුප් රහිත නිවාඩු* | *කාරණය* |
|---|---|---|---|
| *සිට* | *දක්වා* | | |
| | | | |

III. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සියලු වැටුප් වර්ධක උපයා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇත/ නැත.

IV. ඒ අනුව, ඔහු/ ඇය මෙම සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා ඇති/ නැති බැවින් අයදුම්පත නිර්දේශ කරමි/ නොකරමි.

දිනය ..................................................... ..........................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව සහිතව)

07 - 141

## ශ්‍රී ලංකා පොලිසිය

### ආධුනික පොලිස් කොස්තාපල් (පිරිමි / කාන්තා) තනතුර (සහයක සේවා යටතේ සහ ද්විතීයනය පදනම මත)

ශ්‍රී ලංකා පොලිසියේ සහයක සේවා යටතේ සහ ද්විතීයනය පදනම (රජය සේවයේ නියුතු නිලධාරීන්ගෙන්) මත ආධුනික පොලිස් කොස්තාපල් (පිරිමි/ කාන්තා) තනතුරට බඳවා ගැනීම සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

(a) ශීතකරණ - අධිශීතකරණ අලුත්වැඩියා කාර්මික (පිරිමි)
(b) වායු සමීකරණ යන්ත්‍ර කාර්මික (පිරිමි)
(c) මහජන ඇමතුම් උපකරණ ක්‍රියාකරු (පිරිමි)
(d) විදුලි වැල්ඩින්කරු (පිරිමි)
(e) මෝටර් ඔතන්නා (පිරිමි)
(f) ඉලෙක්ට්‍රොනික් කාර්මික (පිරිමි)
(g) කාර්මික (පිරිමි)
(h) ඩෝසර් ක්‍රියාකරු (පිරිමි)
(i) කුෂන් වැඩ කාර්මික (පිරිමි)
(j) ලේත් මැෂින් කාර්මික (පිරිමි)
(k) ඇළුමිනියම් වැඩකරු (පිරිමි)
(l) පරිගණක ක්‍රියාකරු (පිරිමි)
(m) පරිගණක කාර්මික (පිරිමි)
(n) පද්ධති ක්‍රියාකරු (පිරිමි)
(o) මහන මැෂින් කාර්මික (පිරිමි)
(p) ගිනිඅවි අලුත්වැඩියාකරු (පිරිමි)
(q) ඇන්ටනා සවිකරන්නා (පිරිමි)
(r) කාය වර්ධන උපදේශක ශිල්පී (පිරිමි)
(s) ඩෝසර් කාර්මික (පිරිමි)
(t) පිහිණුම් තටාක උපදේශක (පිරිමි)
(u) වැද්දුම්කරු (පිරිමි)
(v) වේදිකා ආලෝකකරණ ශිල්පී (පිරිමි)
(w) වේශ නිරූපන ශිල්පී (පිරිමි/ කාන්තා)
(x) ව්‍යායාම උපදේශක (පිරිමි/ කාන්තා)
(y) ශබ්ද පරිපාලක (පිරිමි)

02. www.police.lk වෙබ් අඩවියට පිවිස " join us" විකල්පය තෝරා ගැනීමෙන් (Click කිරීමෙන්) හෝ පහත සඳහන් QR කේතය ස්කෑන් (Scan) කිරීමෙන් අයදුම්පත වෙත ඇතුළත් වී මාර්ගගත ක්‍රමවේදය (Online) ඔස්සේ පමණක් අයදුම්පත් සම්පූර්ණ කර 2026.08.14 දිනට පෙර යොමු කළ යුතු අතර, කිසිදු අයදුම්පතක් තැපැල් මගින් යොමු නොකළ යුතුය. මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ යොමුකළ අයදුම්පතේ පිටපතක් මූලික පරීක්ෂණය සඳහා පැමිණීමේදී අයදුම්කරු විසින් රැගෙන පැමිණිය යුතුය. (පිටපතේ අයදුම්කරු/ අයදුම්කාරිය විසින් තම අත්සන යොදා තිබිය යුතුය.)

(අ) මෙම නිවේදනයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් පවතීනම් සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කළ යුතුය.
(ආ) සම්මුඛ පරීක්ෂණයට සහභාගිවීම පත්වීම පිරිනැමීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලබයි.
(ඇ) මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් මා විසින් තීරණය කරනු ඇත.
(ඈ) තනතුරෙහි පවතින පුරප්පාඩු මත ප්‍රමුඛතාවය අනුව බඳවා ගැනීම් සිදු කිරීමෙන් අනතුරුව මෙම *ගැසට්* නිවේදනය අවලංගු වේ.
(ඉ) අයදුම්පත් ලැබෙන අනුපිළිවෙල අනුව සම්මුඛ පරීක්ෂණ පවත්වනු ලැබේ.

03. වැටුප් ක්‍රමය - (මාසිකව) පොලිස් කොස්තාපල් තනතුර (සහයක සේවා)
රු. 49,550-7x540-27 x 670 - රු. 71,420.00 (RS. 01-2025)

මෙම වැටුප් ගණනය කිරීම රා.ප.ච. අංක 10/ 2025 අනුව සිදු කර ඇත.

ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත.

| | | |
|---|---|---|
| (අ) | මූලික වැටුප | රු.49550.00 |
| (ආ) | ජීවන වියදම් දීමනාව | රු. 17800.00 |
| (ඇ) | මූලික වැටුපෙන් 22% + රු.1250.00 | රු. 12151.00 |
| (ඈ) | ආහාර හා නවාතැන් දීමනාව | රු. 28800.00 (පොලිස්පති චක්‍රලේඛ අංක 2773/2024 අනුව) |
| (ඉ) | දුෂ්කර දීමනාව | රු. 2000.00 |

04. *මූලික සුදුසුකම්* :

4:1 අධ්‍යාපන සුදුසුකම් :
අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් මාධ්‍ය භාෂාව සහ ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයන් 06 ක් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත් වීම,

දෙවරකදී සමාර්ථය ලබන අපේක්ෂකයකු ප්‍රථමයෙන් විෂයයන් 05 සමත් වී තිබිය යුතුය.

*සටහන 01* ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂය අංක 41 , 44 දරන

විද්‍යා විෂය යුගලය එක් විෂයක් ලෙසද, අංක 42 සහ 45 දරන ගණිතය විෂය යුගලය එක් විෂයක් ලෙසද සළකා විභාගයෙන් සමත් විෂය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

*සටහන 02* අ.පො.ස. (සා/පෙළ) විභාගයේ තාක්ෂණ විෂයෙහි ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුවද, එම විෂය අසමත් ලෙස සලකනු ලැබේ.

*සටහන 03* වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂය අ.පො.ස. (සා/පෙළ) විෂය ධාරාවට ඇතුළත් නොවන හෙයින්, එම විෂයයන් සමත්වීම අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

4:2 වෘත්තීය සුදුසුකම්

**අංක 01 හි (a) සිට (p) දක්වා සහ (v) තනතුරු සඳහා**

රජයේ හෝ රජය පිළිගත් ආයතනයකින් විෂයට අදාළව සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා (NVQ Level 3 ) සහතිකයක් ලබා තිබීම;

*හෝ*

රජයේ හෝ රජය පිළිගත් කාර්මික හෝ වෘත්තීය පුහුණු ආයතනයකින් මාස 06 කට නොඅඩු විෂයානුබද්ධ පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම;

*හෝ*

අවම වසර 3 ක වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

**ඇන්ටනා සවි කරන්නා**

රජයේ හෝ රජය පිළිගත් කාර්මික හෝ වෘත්තීය පුහුණු ආයතනයකින් මාස 06කට නොඅඩු විෂයානුබද්ධ පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම.

**කාය වර්ධන උපදේශක ශිල්පී**

රජයේ හෝ රජය පිළිගත් ආයතනයක් මගින් කායවර්ධන උපදේශක සම්බන්ධ පාඨමාලාවක් හදාරා තිබීම.

**ඩෝසර් කාර්මික**

රජයේ හෝ රජයේ ලියාපදිංචි ආයතනයකින් සහතිකපත්‍ර පාඨමාලාවක් (NVQ Level 03) හදාරා සහතිකයක් ලබා තිබීම;

*හෝ*

රජයේ හෝ රජයේ ලියාපදිංචි කාර්මික හෝ වෘත්තීය පුහුණු ආයතනයකින් මාස 06 කට නොඅඩු (NVQ Level 03) විෂයානුබද්ධ පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම;

*හෝ*

රජයේ හෝ රජයේ ලියාපදිංචි ආයතනයකින් අවම වසර 3ක වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

**පිහිණුම් තටාක උපදේශක**

රජයේ හෝ රජය පිළිගත් ආයතනයක් මගින් පිහිනුම් තටාක උපදේශක සම්බන්ධ පාඨමාලාවක් හදාරා තිබීම.

**වැද්දුම්කරු**

රජයේ හෝ රජයේ ලියාපදිංචි ආයතනයකින් සහතිකපත්‍ර පාඨමාලාවක් හදාරා (NVQ Level 03) සහතිකයක් ලබා තිබීම;

*හෝ*

රජයේ හෝ රජයේ ලියාපදිංචි කාර්මික හෝ වෘත්තීය පුහුණු ආයතනයකින් මාස 06කට නොඅඩු (NVQ Level 03) විෂයානුබද්ධ පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම;

*හෝ*

රජයේ, රජයේ ලියාපදිංචි හෝ පොලිස්පති විසින් පිළිගත් ආයතනයකින් අවම වසර 3ක වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

**වේශ නිරූපන ශිල්පී**

**i.** පිළිගත් ආයතනයකින් වේෂ නිරූපණ හා අංගරචනය පිළිබඳව ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා සහතිකපත් ලබා තිබීම.

*සහ*

**ii.** වේෂ නිරූපණය පිළිබඳව අවම වශයෙන් වසර 01 පළපුරුද්දක් තිබිය යුතුයි. පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතුය.

**ව්‍යායාම උපදේශක**

රජයේ හෝ රජය පිළිගත් ආයතනයකින් ව්‍යායාම උපදේශක සම්බන්ධ පාඨමාලාවක් හදාරා තිබීම හෝ ක්‍රීඩා ඩිප්ලෝමාවක් හදාරා තිබීම.

**ශබ්ද පරිපාලක**

රජයේ පිළිගත් ආයතනයකින් ශබ්ද පරිපාලනය පිළිබඳව පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම;

*සහ*

අවුරුදු 01 ක ශබ්ද පරිපාලනය පිළිබඳ පළපුරුද්ද සහ හැකියාව සහතිකයක් මගින් සනාථ කළ යුතුය. සංගීතය පිළිබඳ දැනුම අමතර සුදුසුකමකි.

**4:3 පළපුරුද්ද :**

අංක 01 හි (a) සිට (p) දක්වා තනතුරු සඳහා

රජයේ හෝ පොලිස්පති විසින් පිළිගත් ආයතනයකින් අදාළ ක්ෂේත්‍රයේ වෘත්තීය සුදුසුකම් සහිත අයදුම්කරුවන් සඳහා අවම වශයෙන් මාස 06 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම;

*හෝ*

වෘත්තීය සුදුසුකම් රහිත අයදුම්කරුවන් සඳහා අවම වසර 3 ක වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

**ඇන්ටනා සවි කරන්නා**

රජයේ හෝ පොලිස්පති විසින් පිළිගත් ආයතනයකින් අදාළ ක්ෂේත්‍රයේ වෘත්තීය සුදුසුකම් සහිත අයදුම්කරුවන් සඳහා අවම වශයෙන් මාස 06 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

**කාය වර්ධන උපදේශක ශිල්පී**

කාය වර්ධන උපදේශකවරයෙකු ලෙස කටයුතු කිරීමේ වසර 02 ක පළපුරුද්දක් ලබා තිබීම.

**ඩෝසර් කාර්මික**

රජයේ, රජයේ ලියාපදිංචි හෝ පොලිස්පති විසින් පිළිගත් ආයතනයකින් අදාළ ක්ෂේත්‍රයේ (NVQ Level 03) වෘත්තීය සුදුසුකම් සහිත අයදුම්කරුවන් සඳහා අවම වශයෙන් මාස 06 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම;

*හෝ*

රජයේ, රජයේ ලියාපදිංචි හෝ පොලිස්පති විසින් පිළිගත් ආයතනයකින් අදාළ වෘත්තීය සුදුසුකම් රහිත අයදුම්කරුවන් සඳහා අවම වශයෙන් මාස 03ක වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

**පිහිණුම් තටාක උපදේශක**

පිහිණුම් තටාක උපදේශකවරයෙකු ලෙස කටයුතු කිරීමේ වසර 02ක වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

**වැද්දුම්කරු**

රජයේ, රජයේ ලියාපදිංචි හෝ පොලිස්පති විසින් පිළිගත් ආයතනයකින් අදාළ (NVQ Level 03) ක්ෂේත්‍රයේ වෘත්තීය සුදුසුකම් සහිත අයදුම්කරුවන් සඳහා අවම වශයෙන් මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම;

*හෝ*

රජයේ, රජයේ ලියාපදිංචි හෝ පොලිස්පති විසින් පිළිගත් ආයතනයකින් අදාළ වෘත්තීය සුදුසුකම් රහිත අයදුම්කරුවන් සඳහා අවම වශයෙන් වසර 03ක වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

**වේදිකා ආලෝකකරණ ශිල්පී**

වේදිකා ආලෝකකරණය පිළිබඳ වසර 01ක පළපුරුද්ද හා හැකියාව සහතිකපත් මගින් සනාථ කළ යුතුයි.

**වේශ නිරූපන ශිල්පී**

රජයේ හෝ පොලිස්පති විසින් පිළිගත් ආයතනයකින් අදාළ වෘත්තීය සුදුසුකම් සහිත අයදුම්කරුවන් සඳහා අවම වශයෙන් මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම;

*හෝ*

වෘත්තීය සුදුසුකම් රහිත අයදුම්කරුවන් සඳහා අවම වසර 3ක වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

**ව්‍යායාම උපදේශක**

ව්‍යායාම උපදේශකවරයෙකු ලෙස කටයුතු කිරීමේ වසර 02 ක වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

**ශබ්ද පරිපාලක**

රජයේ හෝ පොලිස්පති විසින් පිළිගත් ආයතනයකින් අදාළ ක්ෂේත්‍රයේ වෘත්තීය සුදුසුකම් සහිත අයදුම්කරුවන් සඳහා අවම වශයෙන් මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම;

*හෝ*

වෘත්තීය සුදුසුකම් රහිත අයදුම්කරුවන් සඳහා අවම වසර 3ක වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

4:4 කායික සුදුසුකම්

සෑම අපේක්ෂකයෙකුම / අපේක්ෂිකාවක්ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

4:5 වෙනත්

4:5:1 ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

4:5:2 අයදුම්කරුවන් ශ්‍රී ලංකා පොලිසිය අපේක්ෂිත විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

4:5:3 විවාහක/ අවිවාහක, (පිරිමි/ කාන්තා) අයවලුන්ට අයදුම් කළ හැක.

4:5:4 දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

4.5.5 පිරිමි - උස අඩි 05 අඟල් 02 ට නොඅඩු විය යුතුය.
කාන්තා - අඩි 05 ට නොඅඩු විය යුතුය.
(විශේෂ සුදුසුකම් සහ ප්‍රවීණතාවයන් සහිත අයදුම්කරුවන් සම්බන්ධයෙන් පොලිස්පතිගේ අභිමතය පරිදි මෙම උස සීමාවන්ගෙන් අපගමනය විය හැක.)

4:5:6 දෘෂ්ඨිය පිළිබඳ අවශ්‍යතාවයන් එක් ඇසක දෘෂ්ඨිය 6/12 ට අඩු නොවිය යුතුය. දෘෂ්ඨිය එක් ඇසක 6/6 වන විට අනෙක් ඇසෙහි 6/18 වේ නම් එයද පිළිගනු ලැබේ. වර්ණ දෘෂ්ඨිය සාමාන්‍ය විය යුතුය.

4:5:7 කෘතිම ශාරීරික වෙනස්කම් කර නොතිබිය යුතුය. ( උදා : පච්ච කොටා තිබීම )

4:5:8 තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ *ගැසට්* පත්‍රයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

*සටහන 01* තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 4:1 සහ 4:4 යන සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට සම්පූර්ණ කර තිබිය යුතු අතර 4:2 හා 4:3 හි සුදුසුකම් බඳවා ගන්නා දිනටද ඒ ආකාරයෙන්ම තිබිය යුතුය.

*සටහන 02* ඉහත පටිපාටීන්ට පරිබාහිරව ජාත්‍යන්තර මට්ටමේ, ජාතික මට්ටමේ හෝ විශිෂ්ඨ ක්‍රීඩා කෞෂල්‍යයකින් යුක්තවූ හෝ වෙනත් ක්ෂේත්‍රයකින් සුවිශේෂී දක්ෂතා හෝ ප්‍රවීණතා පෙන්නුම් කර ඇති අයදුම්කරුවකුගේ උස සහ පපුව පිළිබඳ සුදුසුකම් නොසලකා අනෙකුත් සුදුසුකම් සපුරා ඇත්නම් පත්කිරීම් බලධරයාගේ අභිමතය පරිදි බඳවා ගත හැකිය.

4:6 වයස

*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-32 ත් අතර විය යුතුය.

05. බඳවා ගැනීමේ ක්‍රමය

5:1 මූලික පරීක්‍ෂණය:

අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් අතරින් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් මූලික පරීක්‍ෂණය සඳහා කැඳවනු ලැබේ. එම පරීක්‍ෂණයේදී ඉහත 4.1 සිට 4.6 දක්වා වූ සුදුසුකම් පරීක්‍ෂා කරනු ලැබේ.

5:2 ශාරීරික යෝග්‍යතා පරීක්‍ෂණය:

පොලිස්පති විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින් අයදුම්කරුවන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ.

5:3 මෙම පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් පමණක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලැබේ.

06. ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණය

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 | අදාළ නොවේ. |
| 02. වෘත්තීය සුදුසුකම් | 20 | |
| 03. වෘත්තීය පළපුරුද්ද | 20 | |
| 04. භාෂා දැනුම (ඉංග්‍රීසි / දෙමළ ) | 20 | |
| 05. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම | 15 | |
| **එකතුව** | **100** | **40%** |

*සටහන :*

01 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන අවස්ථාවේදීම සුදුසුකම් පරීක්ෂා කිරීමද සිදු කෙරේ.

02 මූලික පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරනු ලබන අතර, එහි දී 40% ක් හෝ ඊට වඩා ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් ලිඛිත විභාගයට කැඳවනු ලැබේ.

07. ලිඛිත විභාගය.

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01. අවබෝධය සහ භාෂා හැකියාව | 100 | 40% |
| 02. සාමාන්‍ය දැනීම සහ බුද්ධි පරීක්‍ෂණය | 100 | 40% |
| 03. වෘත්තියට අදාළ :<br>ලිඛිත පරීක්ෂණය<br>ප්‍රායෝගික පරීක්ෂණය | 40<br>60 } 100 | එක් කොටසකින් 40% ක් බැගින් |

7.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණු සංඛ්‍යාව ලිඛිත විභාගයෙන් හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණු සංඛ්‍යාව සමඟ එකතු කොට අයදුම්කරු ලබා ගන්නා මුළු ලකුණු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

7.2 අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව සඳහා ලබාගත් මුළු ලකුණු සංඛ්‍යාවේ අනුපිළිවෙලෙහි කුසලතා ලැයිස්තුවක් අනුව බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

08. පසුබිම් පරීක්‍ෂණය

8:1 ඉහත 7.2 ඡේදය පරිදි බඳවා ගැනීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් සම්බන්ධයෙන් යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහා පසුබිම් පරීක්ෂණය පවත්වනු ලබයි.

*සටහන*: සමීප ඥාතීන් සම්බන්ධයෙන් අපරාධ වාර්තා කිසිවක් නොතිබිය යුතුයි. සමීප ඥාතීන් යනු අයදුම්කරුගේ මව,පියා,භාරකරුවන්,සහෝදර සහෝදරියන් සහ සහෝදර සහෝදරියන් විවාහක නම් ඔවුන්ගේ කලත්‍රයන්ද සමීප ඥාතීන් ලෙස සලකනු ලැබේ.

8:2 අයදුම්කරුගේ යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහා ඔහු හා ඔහුගේ සමීප ඥාතීන්ගේද, ඔහු සමීපව ඇසුරු කරන්නන්ගේද යහපත් චරිතය, හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර, අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කරුවන් බඳවා ගනු නොලැබේ.

8:3 බඳවා ගැනීමේදී අයදුම්කරුවන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම ඔහු බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු පැවසූ බව බඳවා ගැනීමෙන් පසුව හෙළි වුවහොත් ඕනෑම අවස්ථාවකදී සේවයෙන් ඉවත් කරනු ලැබේ.

8:4 කුසලතා ලකුණු ලැයිස්තුව අනුව බඳවා ගැනීම සඳහා බලාපොරොත්තු වන අයදුම්කරුගේ පසුබිම් වාර්තා ලැබෙන තෙක් ඔහුව වෛද්‍ය පරීක්ෂණය සඳහා කැඳවනු නොලැබේ.

09. වෛද්‍ය පරීක්‍ෂණය

වෛද්‍ය පරීක්‍ෂණය සඳහා තෝරාගත් අයදුම්කරුවන් පොලිස් රෝහලේ අධ්‍යක්ෂ වෛද්‍ය විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් විය යුතුය. තවද මෙහිදී අයදුම්කරුවන් පොලිස් රාජකාරි සඳහා සුදුසු බවට ශාරීරික හා මානසික යෝග්‍යතා පරීක්‍ෂණයකටද භාජනය කරනු ලැබේ. අධ්‍යක්‍ෂ වෛද්‍ය විසින් වෛද්‍ය පරීක්ෂණයේ වාර්තා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ 169 වෙනි පොදු පෝරම යටතේ ඉදිරිපත් කළ යුතුය. වෛද්‍ය පරීක්‍ෂණයට භාජනය විය හැක්කේ එක් වරක් පමණි.

10. පුහුණුව

10:1 විවෘත බඳවා ගැනීම සඳහා පසුබිම් පරීක්ෂණයෙන් සහ වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන් / අයදුම්කාරියන් පමණක් පොලිස්පති විසින් තීරණය කරනු ලබන කාල සීමාවක් සඳහා පුහුණුවට කැඳවනු ලැබේ.

10:2 බඳවා ගනු ලබන සියලුම අයදුම්කරුවන්/ අයදුම්කාරියන් සඳහා ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේදී / ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේදී පොලිස්පති විසින් තීරණය කරනු ලබන කාල සීමාවක් සඳහා සේවා ආරම්භක පුහුණුවක් සහ විෂයානුබද්ධ ප්‍රායෝගික පුහුණුවක් ද ලබා දෙනු ලැබේ.

11.සේවා කොන්දේසි

11:1 තෝරා ගනු ලබන අයදුම්කරුවන්/ අයදුම්කාරියන් තුන් (03) අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත් වනු ඇත. (ද්විතීයනය පදනම මත තෝරා ගන්නා අයදුම්කරුවන්/ අයදුම්කාරියන්ට අදාළ නොවේ)

11:2 තෝරා ගනු ලබන අයදුම්කරුවන්/ අයදුම්කාරියන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් සම්පාදිතව පවත්නා සහ මින්මතු ඒ සම්බන්ධයෙන් සම්පාදනය කරනු ලබන නියෝග වෙතොත් ඒවාටද අනුකූලව කටයුතු කළ යුතුයි.

11:3 ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි, ජාතික පොලිස් කොමිෂන් සභා චක්‍රලේඛ හා විධිවිධාන, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, භාණ්ඩාගාර චක්‍රලේඛ,දෙපාර්තමේන්තු නියෝග, චක්‍රලේඛ, අත් පොත්වල සහ උපදෙස් සංග්‍රහවල විධිවිධානවලට යටත් විය යුතුය.

11:4 බඳවා ගන්නා අයදුම්කරුවන් / අයදුම්කාරියන් පත් කර ගනු ලැබූ දින සිට අවුරුදු 03 ක ආධුනික සේවා කාලයක් ශ්‍රී ලංකා පොලීසියෙහි සේවය කළ යුතු අතර, මෙම ආධුනික සේවා කාලය අවසන් වීමට පෙර යම් නිලධාරියෙකු තනතුරින් ඉල්ලා අස්වීමට අදහස් කරන්නේ නම් ඔහුගේ පුහුණුව සහ නිල ඇඳුම් ඇතුළු අනෙකුත් වියදම් වෙනුවෙනුත් නියම කරනු ලබන මුදලක් වෙතොත් ඒවා සියල්ල ඉල්ලා අස්වීමේ ලිපිය භාර දෙන අවස්ථාවේදීම ගෙවීමට කැමැත්ත පල කිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතුය. ඉල්ලා අස්වීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහය සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල විධිවිධානයන්ට යටත්ව කටයුතු කරනු ලැබේ. (ද්විතීයනය පදනම මත තෝරා ගන්නා අයදුම්කරුවන්/ අයදුම්කාරියන්ට අදාළ නොවේ)

11:5 පත්වීම භාර ගැනීමට සුදුසුකම් ලබන්නන් පත්වීම භාර ගැනීමට ප්‍රථම සියලු ණය බැඳීම් වලින් නිදහස් විය යුතුයි. (ද්විතීයනය පදනම මත තෝරා ගන්නා අයදුම්කරුවන්/ අයදුම්කාරියන්ට අදාළ නොවේ)

11:6 ඉදුරාම බඳවා ගන්නා පොලිස් කොස්තාපල්වරුන් (සහායක සේවා) පුහුණුව ආරම්භ කළ වහාම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව පොලිස්පති චක්‍රලේඛ අංක 1693/2003 සහ 1804/2004 ට අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා දිවුරුම් දිය යුතුය.

12. පත්වීමේ කොන්දේසි

ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

13. කාර්යක්‍ෂමතා කඩඉම : (ද්විතියනය පදනම මත තෝරා ගන්නා අයදුම්කරුවන්/ අයදුම්කාරියන්ට අදාළ නොවේ)

| *කුමන කාර්යක්‍ෂමතා කඩඉමද යන වග* | *කාර්යක්‍ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද* | *කාර්යක්‍ෂමතා කඩඉම් ස්වභාවය ලිඛිත පරීක්‍ෂණය/ වෘත්තීය පරීක්‍ෂණය/ සහතික පාඨමාලාව/ වෙනත්* |
|---|---|---|
| 01 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (සේවය ස්ථිර කරයි) | පොලිස් කොස්තාපල් (සහායක සේවා) තනතුරට පත් වී වසර 03 ක් ගතවීමට පෙර | වාචික, ලිඛිත සහ ප්‍රායෝගික |
| 02 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | පොලිස් කොස්තාපල් (සහායක සේවා) තනතුරට පත් වී වසර 07ක් ගතවීමට පෙර | වාචික |
| 03 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | පොලිස් කොස්තාපල් (සහායක සේවා) තනතුරට පත් වී වසර 12 ක් ගතවීමට පෙර | වාචික |
| 04 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | පොලිස් කොස්තාපල් (සහායක සේවා) තනතුරට පත් වී වසර 17 ක් ගතවීමට පෙර | වාචික |
| 05 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | පොලිස් කොස්තාපල් (සහායක සේවා) තනතුරට පත් වී වසර 21ක් ගතවීමට පෙර | වාචික |
| 06 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | පොලිස් සැරයන් (සහායක සේවා) තනතුරට පත් වී වසර 03ක් ගතවීමට පෙර | වාචික |
| 07 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | පොලිස් සැරයන් (සහායක සේවා) තනතුරට පත් වී වසර 07ක් ගතවීමට පෙර | වාචික |

ගිනිඅවි අලුත්වැඩියාකරු (පිරිමි) තනතුර සඳහා

| *කුමන කාර්යක්‍ෂමතා කඩඉමද යන වග* | *කාර්යක්‍ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද* | *කාර්යක්‍ෂමතා කඩඉම් ස්වභාවය ලිඛිත පරීක්‍ෂණය/ වෘත්තීය පරීක්‍ෂණය/ සහතික පාඨමාලාව/ වෙනත්* |
|---|---|---|
| 01 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (සේවය ස්ථිර කරයි) | පොලිස් කොස්තාපල් (සහායක සේවා) තනතුරට පත් වී වසර 03 ක් ගතවීමට පෙර | වාචික, ලිඛිත සහ ප්‍රායෝගික |
| 02 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | පොලිස් කොස්තාපල් (සහායක සේවා) තනතුරට පත් වී වසර 12 ක් ගතවීමට පෙර | වාචික, ලිඛිත සහ ප්‍රායෝගික |
| 03 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | පොලිස් සැරයන් (සහායක සේවා) තනතුරට පත් වී වසර 03 ක් ගතවීමට පෙර | වාචික, ලිඛිත සහ ප්‍රායෝගික |

14. භාෂා ප්‍රවීණතාව : (ද්විතියනය පදනම මත තෝරා ගන්නා අයදුම්කරුවන්/ අයදුම්කාරියන්ට අදාළ නොවේ)

| *භාෂාව* | *ලබා ගත යුතු ප්‍රවීණතාව* |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව ලබා ගත යුතුය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අංක අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය. |

15. මෙම *ගැසට්* පත්‍රයේ 1 කොටස (11 අ) වැනි ඡේදයේ ආරම්භයේ පල කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි බලපානු ඇත.

16. අයදුම්පත සම්පූර්ණ කිරීමේදී අයදුම්කරුවන්/ අයදුම්කාරියන් සුදු පසුබිමේ ලබාගන්නා ලද පාස්පෝට් ප්‍රමාණයේ වර්ණ ඡායාරූපයක් හා පහත දැක්වෙන ලිපි ලේඛණවල පිටපත් අයදුම්පත් සම්පූර්ණ කරන අවස්ථාවේදී උඩුගත (Upload) කළ යුතුය.

(අ) උප්පැන්න සහතිකය
(ආ) ජාතික හැඳුනුම්පත
(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික
(ඈ) වලංගු රියදුරු බලපත්‍රය
(ඉ) වෘත්තීය සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික
(ඊ) පලපුරුද්ද සනාථ කිරීම සඳහා වූ සහතික
(උ) අයදුම්කරු තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවට ප්‍රකාශිත ආයතන ප්‍රධානියාගෙන් ලබාගන්නා ලද ලිපිය. (දැනටමත් රැකියාවක නිරතවන්නේ නම් පමණක් අදාළ වේ.) (අයදුම්පතේ අංක 17 ආකෘතිය යටතේ විය යුතුය)
(ඌ) ඔබ රජයේ සේවයෙන් හෝ සන්නද්ධ සේවයෙන් ඉවත්ව ඇත්නම් ඉවත්වීමේ ලිපිය.

17. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතුව සිටින අයදුම්කරුවන් / අයදුම්කාරියන් ඔවුන්ගේ අයදුම්පත යොමුකිරීමේදී අයදුම්පතේ අනු අංක 17 යටතේ ඇති පහත ආකෘතියට අනුව සකස් කරන ලද ලිපියක් ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව සහිතව උඩුගත (Upload) කළ යුතුය.

> මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................ ............................. මහතා ....................... දෙපාර්තමේන්තුවේ / සංස්ථාවේ/ මණ්ඩලයේ/ යුධ හමුදා බලකායේ සේවයේ නියුතු අයෙකු බවත්, ඔහු මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.
>
> ........................................
> ආයතන ප්‍රධානියාගේ අත්සන
> නම.................................
> නිල මුද්‍රාව
>
> දිනය .................................

*සටහන* - පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ශ්‍රී ලංකා පොලීසිය විසින් ගෙවනු නොලැබේ.

**ප්‍රියන්ත වීරසූරිය,**
පොලිස්පති.

07 - 182/1

## ශ්‍රී ලංකා පොලීසිය

### ආධුනික උප පොලිස් පරීක්ෂක (පිරිමි/ කාන්තා) තනතුර (සහායක සේවා යටතේ සහ ද්විතීයන පදනම මත)

ශ්‍රී ලංකා පොලිසියේ සහායක සේවා යටතේ සහ ද්විතීයන පදනම (රාජ්‍ය සේවයේ නියතු නිලධාරින්ගෙන්) මත ආධුනික උප පොලිස් පරීක්ෂක (පිරිමි/ කාන්තා) පහත තනතුරුවලට බඳවා ගැනීම සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

(a) වෙබ් අඩවි සංස්කාරක ( පිරිමි )
(b) වෙබ් අඩවි සංවර්ධන ( පිරිමි )
(c) පද්ධති විශ්ලේෂක ( පිරිමි )
(d) පරිගණක මෘදුකාංග පැකේජ උපදේශක ( පිරිමි )
(e) පරිගණක ( පිරිමි )
(f) ග්‍රැෆික් නිර්මාණ උපදේශක ( පිරිමි )
(g) පරිගණක දෘඩාංග හා ජාලකරණ උපදේශක ( පිරිමි )
(h) වැඩසටහන් සම්පාදක (පිරිමි )
(i) ජාල පද්ධති පාලක ( පිරිමි )
(j) දත්ත පද්ධති පාලන ( පිරිමි )
(k) ඖෂධවේදී තනතුර (පිරිමි/කාන්තා)
(l) කාර්මික ගෘහස්ථ (පිරිමි)
(m) කාර්මික (පිරිමි)
(n) ප්‍රමාණ සමීක්ෂක (පිරිමි)
(o) භෝජනාගාර පාලක (පිරිමි)
(p) සැලසුම් ශිල්පී (පිරිමි)
(q) සුපවේදී (පිරිමි)
(r) ක්‍රීඩා පිටි හා තනතීරු නඩත්තු උපදේශක (පිරිමි)
(s) විද්‍යුත් බන්තුක රේඛන ශිල්පී (පිරිමි/ කාන්තා)
(t) වෛද්‍ය රසායනාගාර කාර්මික (පිරිමි/ කාන්තා)
(u) හෙද නිලධාරි (පිරිමි/ කාන්තා)

02. www.police.lk වෙබ් අඩවියට පිවිස " join us" විකල්පය තෝරා ගැනීමෙන් (Click කිරීමෙන්) හෝ පහත සඳහන් QR කේතය ස්කෑන් (Scan) කිරීමෙන් අයදුම්පත වෙත ඇතුළත් වී මාර්ගගත ක්‍රමවේදය (Online) ඔස්සේ පමණක් අයදුම්පත් සම්පූර්ණ කර 2026.08.14 දිනට පෙර යොමුකළ යුතු අතර, කිසිදු අයදුම්පතක් තැපැල් මගින් යොමු නොකළ යුතුය. මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ යොමුකළ අයදුම්පතේ පිටපතක් මූලික පරීක්ෂණය සඳහා පැමිණීමේදී අයදුම්කරු/ අයදුම්කාරිය විසින් රැගෙන පැමිණිය යුතුය. (පිටපතේ අයදුම්කරු/ අයදුම්කාරිය විසින් තම අත්සන යොදා තිබිය යුතුය.)

(අ) මෙම නිවේදනයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් පවතීනම් සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කළ යුතුය.

(ආ) සම්මුඛ පරීක්ෂණයට සහභාගිවීම පත්වීම පිරිනැමීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලබයි.

(ඇ) මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් මා විසින් තීරණය කරනු ඇත.

(ඈ) තනතුරෙහි පවතින පුරප්පාඩු මත ප්‍රමුඛතාවය අනුව බඳවා ගැනීම් සිදු කිරීමෙන් අනතුරුව මෙම ගැසට් නිවේදනය අවලංගු වේ.

(ඉ) අයදුම්පත් ලැබෙන අනුපිළිවෙල අනුව සම්මුඛ පරීක්ෂණ පවත්වනු ලැබේ.

03. **වැටුප් ක්‍රමය - (මාසිකව) උප පොලිස් පරීක්ෂක තනතුර (සහයක සේවා )**

රු. 55410-7x 670-2x890-25x1,190 -
රු. 91630 (RS 03-2025)

මෙම වැටුප් ගණනය කිරීම රා.ප.ච. 10/ 2025 අනුව සිදු කර ඇත.

ඉහත සඳහන් වැටුප් පරිමාණය සමග මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත.

| | |
|---|---|
| (අ) ජීවන වියදම් දීමනාව | රු. 17800.00 |
| (ආ) මූලික වැටුපෙන් 22% +රු.1250.00 | රු. 13440.20 |
| (ඇ) ආහාර හා නවාතැන් දීමනාව | රු. 31800.00 (පොලිස්පති චක්‍රලේඛ අංක 2773/2024 අනුව) |
| (ඈ) දුෂ්කර දීමනා | රු. 2000.00 |

**04. මූලික සුදුසුකම් :**

**4.1 අධ්‍යාපන සුදුසුකම්**

**අංක 01 හි (a) සිට (j) දක්වා තනතුරු සඳහා -**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් මාධ්‍ය භාෂාව, ගණිතය සහ ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් 4 කට සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් 06 කින් සමත්ව තිබීම;

*සහ*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් ඕනෑම විෂයයන් 03 ක් එක් වරකදී සමත්ව තිබීම. ( පොදු පරික්ෂණය හැර)

**ඖෂධවේදී තනතුර (පිරිමි / කාන්තා)**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල/ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව, සහ තව එක් විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ සහිතව එකවර ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් 06 කින් සමත්වීම;

*සහ*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව විෂය ඇතුළුව සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, ජීව විද්‍යාව හා කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් 03 ක් එකවර සමත්ව තිබීම;

*හෝ*

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඖෂධවේදී උපාධිය ලබා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම;

*හෝ*

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ දැනට පූර්ණ කාලීන ලියාපදිංචි ඖෂධවේදියකු ලෙස ක්‍රියා කරන අභ්‍යන්තර හෝ බාහිර පාඨමාලාධාරී ඖෂධවේදියකු වීම.

**කාර්මික ගෘහස්ථ/ කාර්මික/ ප්‍රමාණ සමීක්ෂක/ භෝජනාගාර පාලක/ සැලසුම් ශිල්පී/ සූපවේදී (පිරිමි) තනතුරු සඳහා :**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් මාධ්‍ය භාෂාව සහ ගණිතය ඇතුලත්ව සම්මාන සාමාර්ථ 4 ක් සහිතව එක වරකදී විෂයයන් 06කින් සමත්ව තිබීම;

*සහ*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් එක් වරකදී විෂයයන් 03ක් සමත්ව තිබීම.

**ක්‍රීඩා පිටි හා තණතීරු නඩත්තු උපදේශක (පිරිමි)**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුළුව එක් වරකදී විෂයයන් 06 කින් සමත් වීම.

*සහ*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් ඕනෑම විෂයයන් 03 එක් වරකදී සමත්ව තිබීම. (පොදු පරීක්ෂණය හැර)

**විද්‍යුත් ඛන්තුක රේඛන ශිල්පී (පිරිමි/ කාන්තා)**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල/ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව, සහ තව එක් විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුළුව එක් වරකදී විෂයයන් 06 කින් සමත්ව තිබීම;

*සහ*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව යන විෂයයන් ඇතුළුව විෂයයන් 03 කින් එක් වරකදී සමත්ව තිබීම.

*හෝ*

විද්‍යුත් ඛන්තුක රේඛණ ශිල්පී ඩිප්ලෝමා සහතිකය ලබා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පූර්ව ලියාපදිංචිය ලබා තිබීම.

**වෛද්‍ය රසායනාගාර කාර්මික (පිරිමි/ කාන්තා)**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල/ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව, සහ ඉංග්‍රීසි භාෂාව ඇතුළුව සම්මාන සාමාර්ථ 04 ක් සහිතව එකවර විෂයයන් 06 කින් සමත්ව තිබීම.

*සහ*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව හා කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් 03 ක් එකවර සමත්ව තිබීම.

**හෙද නිලධාරි (පිරිමි/කාන්තා)**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල/ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව, සහ ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයන් 04 ට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයයන් 06 කින් එකවර සමත්ව තිබීම;

*සහ*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් එකවර විෂයයන් 03 ක් සමත් වීම. ( ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව, ගණිතය යන විෂය ධාරා අතුරින් කුමන හෝ විෂය ධාරාවකින් සමත්ව තිබීම.)

*සටහන 01.-* *ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂයය වර්ගීකරණය අනුව විෂයය අංක 41 සහ 44 දරන විද්‍යා විෂයය යුගලය එක් විෂයයක් ලෙසද, අංක 42 සහ 45 දරන ගණිතය විෂය යුගලය එක් විෂයයක් ලෙසද සලකා විභාගයෙන් සමත් විෂයය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.*

*සටහන 02.-* *අ.පො.ස. (සා/පෙළ) විභාගයේ තාක්‍ෂණ විෂය ලිඛිත පරීක්‍ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්‍ෂණය සමත් වුවද එම විෂයය අසමත් ලෙස සලකනු ලැබේ.*

*සටහන 03.-* *වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂය අ.පො.ස. (සා/පෙළ) විෂය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.*

**4:2** **වෘත්තීය සුදුසුකම් :**
**අංක 01 හි (a) සිට (j) දක්වා තනතුරු සඳහා -**

අවම වශයෙන් ජාතික වෘත්තීය යෝග්‍යතා (NVQ Level 5)වන මට්ටමේ ඩිප්ලෝමා පාඨමාලාව හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන

කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ඒ හා සමාන සුදුසුකම් හෝ වෙනත් පිළිගත් ආයතනයක පරිගණක සාක්ෂරතාවය පිළිබඳව පහත සඳහන් විෂය සංරචකයන්ගෙන් පාඨමාලාවක් හදාරා තිබීම.

I. පරිගණක භාවිතයෙන් සම්මත පද්ධතිය යටතේ ලිපිගොනු කළමනාකරණය.
II. පරිගණක වදන් සැකසුම.
III. පැතුරුම්පත් සකස් කිරීම හා භාවිතා කිරීම.
IV. පරිගණක භාවිතයෙන් ඉදිරිපත් කිරීම.
V. දත්ත සමුදාය නිර්මාණය සහ භාවිතය.
VI. අන්තර්ජාලය සහ ඉලෙක්ට්‍රොනික තැපැල භාවිතා කිරීමේ හැකියාව.

**ඖෂධවේදී තනතුර (පිරිමි/ කාන්තා) -**

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මගින් පවත්වන ලද බාහිර ඖෂධවේදී විභාගය සමත් වීම හෝ වෛද්‍ය සභාවේ අභ්‍යන්තර ඖෂධවේදී විභාගය සමත් වී වසරක කාලයක් සීමාවාසික පුහුණුව ලබා වෛද්‍ය සභාවේ ඖෂධවේදියෙකු ලෙස ලියාපදිංචි වී තිබීම;

*හෝ*

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඖෂධවේදී උපාධිය ලබා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

*සටහන. -* අ.පො.ස. (උ.පෙළ) සහ අ.පො.ස. (සා.පෙළ) අධ්‍යාපන සුදුසුකම් තුළින් බඳවාගෙන ඖෂධවේදී පුහුණුව සඳහා තෝරා ගැනීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් සඳහා වෘත්තීය සුදුසුකම් අදාළ නොවනු ඇත.

**කාර්මික ගෘහස්ථ / කාර්මික/ ප්‍රමාණ සමීක්ෂක (පිරිමි) තනතුර සඳහා**

NCT සිවිල් ඉංජිනේරු වසර 03 ක පාඨමාලාවක් හෝ ඒ හා සමාන පාඨමාලාවක් සාර්ථකව හදාරා තිබීම හෝ රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතාවයන් (NVQ Level IV ) මට්ටම යන සුදුසුකම් සපුරා තිබීම.

**භෝජනාගාර පාලක (පිරිමි) -**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ආයතනයකින් මාස 06කට නොඅඩු අවන්හල් සේවා සහ මාස 06 කට නොඅඩු භෝජනාගාර පාලක පාඨමාලාවක් (NVQ Level V) සාර්ථකව හාදාරා තිබීම.

**සැලසුම් ශිල්පී (පිරිමි) -**

NCT සිවිල් ඉංජිනේරු වසර 03 ක පාඨමාලාවක් හෝ ඒ හා සමාන පාඨමාලාවක් සාර්ථකව හදාරා තිබීම හෝ රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතාවයන් (NVQ Level V ) මට්ටම යන සුදුසුකම් සපුරා තිබීම.

**සූපවේදි (පිරිමි) -**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ආයතනයකින් මාස 06 කට නොඅඩු අවන්හල් සේවා සහ මාස 06 කට නොඅඩු සූපවේදී පාඨමාලාව (NVQ Level V) සාර්ථකව හාදාරා තිබීම.

**ක්‍රීඩා පිටි හා තණතීරු නඩත්තු උපදේශක (පිරිමි) -**

ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ආයතනය මගින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ රජයේ පිළිගත් ආයතනයකින් ක්‍රීඩා පිටි, ක්‍රිකට් **තණතීරු** නඩත්තු කටයුතු පිළිබඳ මාස 06 කට වැඩි පාඨමාලාවක් ( NVQ Level IV ) හදාරා තිබීම.

**විද්‍යුත් බන්තුක රේඛන ශිල්පී (පිරිමි/ කාන්තා)**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ විද්‍යුත් බන්තුක රේඛන ශිල්පී වසර 01 ක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ නවීකරණය වූ චක්‍රලේඛ ප්‍රකාර පුහුණු කාලසීමාවක් තුළ පුහුණු පාඨමාලාව හදාරා ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම හා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

*සටහන.-* අ.පො.ස. (උ.පෙළ) සහ අ.පො.ස. (සා.පෙළ) අධ්‍යාපන සුදුසුකම් තුළින් බඳවාගෙන විද්‍යුත් බන්තුක රේඛන ශිල්පී පුහුණුව සඳහා තෝරා

ගැනීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් සඳහා වෘත්තීය සුදුසුකම් අදාළ නොවනු ඇත.

**වෛද්‍ය රසායනාගාර කාර්මික (පිරිමි/ කාන්තා)**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ පුහුණු පාසලක වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පයට අදාළ පුහුණු පාඨමාලාව වසර 02 ක කාලයක් හදාරා ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම හා වෛද්‍ය සභාවේ පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම;

*හෝ*

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් වෛද්‍ය රසායනාගාර තාක්ෂණවේදී උපාධිය ලබා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

*සටහන.-* අ.පො.ස. (උ.පෙළ) සහ අ.පො.ස. (සා.පෙළ) අධ්‍යාපන සුදුසුකම් තුළින් බඳවාගෙන වෛද්‍ය රසායනාගාර කාර්මික පුහුණුව සඳහා තෝරා ගැනීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් සඳහා වෘත්තීය සුදුසුකම් අදාළ නොවනු ඇත.

**හෙද නිලධාරි (පිරිමි/ කාන්තා) -**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෙද උපාධිය ලබා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පූර්ණ ලියාපදිංචි ලබා තිබීම;

*හෝ*

සෞඛ්‍ය අමාත්‍යාංශයේ පුහුණු පාසලක හෙද පුහුණු පාඨමාලාව වසර 03 ක කාලයක් හදාරා ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම හා වෛද්‍ය සභාවේ පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

*සටහන.-* අ.පො.ස. (උ.පෙළ) සහ අ.පො.ස. (සා.පෙළ) අධ්‍යාපන සුදුසුකම් තුළින් බඳවාගෙන හෙද පුහුණුව සඳහා තෝරා ගැනීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින් සඳහා වෘත්තීය සුදුසුකම් අදාළ නොවනු ඇත.

**4:3 පළපුරුද්ද :**

**අංක 01 හි (a) සිට (j) දක්වා තනතුරු සඳහා -**

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය, තරුණ සේවා සභාව, කාර්මික විද්‍යාල, ජර්මන් කාර්මික විද්‍යාල, විවෘත විශ්වවිද්‍යාල, යනාදී රජයට අනුබද්ධ ආයතනයකින් ක්ෂේත්‍රයට අදාළව NVQ Level 5 මට්ටමේ ඩිප්ලෝමාලාභී වෘත්තීය සුදුසුකම් සහිත අයදුම්කරුවන් සඳහා අවම වශයෙන් මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම;

*හෝ*

වෘත්තීය සුදුසුකම් රහිත අයදුම්කරුවන් සඳහා රජයේ හෝ රජයේ ලියාපදිංචි පෞද්ගලික ආයතනයකින් ක්ෂේත්‍රයට අදාළව අවම වසර 03 ක වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

**ඖෂධවේදී තනතුර (පිරිමි/ කාන්තා) -**

සෞඛ්‍ය අමාත්‍යාංශය හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලියාපදිංචි ආයතනයකින් අදාළ ක්ෂේත්‍රයට මාස 06 කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.

*සටහන. -* අ.පො.ස. (උ.පෙළ) සහ අ.පො.ස. (සා.පෙළ) අධ්‍යාපන සුදුසුකම් තුළින් බඳවාගෙන ඖෂධවේදී පුහුණුව සඳහා තෝරා ගැනීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින් සඳහා වෘත්තීය පළපුරුදු කාලය අදාළ නොවනු ඇත.

**කාර්මික ගෘහස්ථ/ කාර්මික (පිරිමි) තනතුරු සඳහා -**

රජයේ හෝ පොලිස්පති විසින් පිළිගත් ආයතනයකින් අදාළ ක්ෂේත්‍රය පිළිබඳ අවම වශයෙන් මාස 06 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

**ප්‍රමාණ සමීක්ෂක (පිරිමි) -**

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය තරුණ සේවා සභාව, කාර්මික විද්‍යාල, ජර්මන් කාර්මික විද්‍යාල, විවෘත විශ්වවිද්‍යාල, යනාදී රජයට අනුබද්ධ ආයතනයකින් අදාළ ක්ෂේත්‍රයට අදාළව

NVQ- level V මට්ටමේ ඩිප්ලෝමාලාභී වෘත්තීය සුදුසුකම් සහිත අයදුම්කරුවන් සඳහා අවම වශයෙන් මාස 06 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම;

*හෝ*

වෘත්තීය සුදුසුකම් රහිත අයදුම්කරුවන් සඳහා රජයේ හෝ රජයේ ලියාපදිංචි පෞද්ගලික ආයතනයකින් ක්ෂේත්‍රයට අදාළව අවම වසර 03 ක වෘත්තීය පළපුරුද්ද ලබා තිබීම.

**භෝජනාගාර පාලක (පිරිමි)**

තරු පන්තියේ හෝටලයක වසර 03කට වැඩි අවන්හල් පරීක්ෂක ශ්‍රේණියේ පළපුරුද්දක් තිබීම.

**සැලසුම් ශිල්පී (පිරිමි)**

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය, තරුණ සේවා සභාව, කාර්මික විද්‍යාල, ජර්මන් කාර්මික විද්‍යාල, විවෘත විශ්වවිද්‍යාල, යනාදී රජයට අනුබද්ධ ආයතනයකින් අදාළ ක්ෂේත්‍රයට අදාළව (NVQ Level-V) මට්ටමේ ඩිප්ලෝමාලාභී වෘත්තීය සුදුසුකම් සහිත අයදුම්කරුවන් සඳහා අවම වශයෙන් මාස 06 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

**සූපවේදී (පිරිමි)**

තරු පන්තියේ හෝටලයක වසර 03 කට වැඩි සූපවේදී පරීක්ෂක ශ්‍රේණියේ පළපුරුද්දක් තිබීම.

**ක්‍රීඩා පිටි හා තණතීරු නඩත්තු උපදේශක (පිරිමි)**

ක්‍රීඩා පිටි, ක්‍රිකට් තණතීරු නඩත්තු කටයුතු පිළිබඳ වසර 03 කට වැඩි පළපුරුද්දක් ලබා තිබීම.

**විද්‍යුත් බන්ධුක රේඛන ශිල්පී (පිරිමි/ කාන්තා)**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලියාපදිංචි ආයතනයකින් අදාළ ක්ෂේත්‍රයේ මාස 06 කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.

*සටහන* අ.පො.ස. (උ.පෙළ) සහ අ.පො.ස. (සා. පෙළ) අධ්‍යාපන සුදුසුකම් තුළින් බඳවා ගෙන විද්‍යුත් බන්තුක රේඛන ශිල්පී පුහුණුව සඳහා තෝරා ගැනීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් සඳහා වෘත්තීය පළපුරුදු කාලය අදාළ නොවනු ඇත.

**වෛද්‍ය රසායනාගාර කාර්මික (පිරිමි / කාන්තා)**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලියාපදිංචි ආයතනයකින් අදාළ ක්ෂේත්‍රයේ මාස 06 කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.

*සටහන* අ.පො.ස. (උ.පෙළ) සහ අ.පො.ස. (සා. පෙළ) අධ්‍යාපන සුදුසුකම් තුළින් බඳවාගෙන වෛද්‍ය රසායනාගාර කාර්මික පුහුණුව සඳහා තෝරා ගැනීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් සඳහා වෘත්තීය පළපුරුදු කාලය අදාළ නොවනු ඇත.

**හෙද නිලධාරි (පිරිමි/ කාන්තා )**

සෞඛ්‍ය අමාත්‍යාංශය හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලියාපදිංචි ආයතනයකින් අදාළ ක්ෂේත්‍රයේ මාස 06 කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.

*සටහන* අ.පො.ස. (උ.පෙළ) සහ අ.පො.ස. (සා.පෙළ) අධ්‍යාපන සුදුසුකම් තුළින් බඳවාගෙන පුහුණුව සඳහා තෝරා ගැනීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් සඳහා වෘත්තීය පළපුරුදු කාලය අදාළ නොවනු ඇත.

**4:4** **කායික සුදුසුකම් :**

සෑම අපේක්ෂකයෙකුම/ අපේක්ෂිකාවක්ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**4:5** **වෙනත් :**

4:5:1 ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

4:5:2 අයදුම්කරුවන් ශ්‍රී ලංකා පොලීසිය අපේක්ෂිත විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

4:5:3 විවාහක අවිවාහක බව :

අංක 01 හි (a) සිට (j) දක්වා සහ (q) (r) තනතුරු සඳහා විවාහක /අවිවාහක පිරිමි අයවලුන්ට අයදුම් කළ හැකිය.

ඖෂධවේදී - අවිවාහක පිරිමි/ කාන්තා අයවලුන් විය යුතුය. (දික්කසාද වූවන් හා වැන්දඹුවන් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබති.) පොලිස් සේවයේ හෝ ඖෂධවේදී සේවයේ දැනටමත් සේවයේ යෙදී සිටින අයට මෙය අදාළ නොවේ.

විද්‍යුත් ඛන්තුක රේඛණ ශිල්පී - අවිවාහක) පිරිමි/ කාන්තා අයවලුන් විය යුතුය. (දික්කසාද වූවන් හා වැන්දඹුවන් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබති.) පොලිස් සේවයේ හෝ ඛන්තුක රේඛණ ශිල්පී සේවයේ දැනටමත් සේවයේ යෙදී සිටින අයට මෙය අදාළ නොවේ.

කාර්මික ගෘහස්ථ/ කාර්මික/ ප්‍රමාණ සමීක්ෂක / භෝජනාගාර පාලක/ සැලසුම් ශිල්පී තනතුරු සඳහා අවිවාහක පිරිමි අයවලුන්ට අයදුම් කළ හැකිය. (දික්කසාද වූවන් හා වැන්දඹුවන් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබති.)

වෛද්‍ය රසායනාගාර කාර්මික තනතුර සඳහා අවිවාහක පිරිමි/ කාන්තා අයවලුන් විය යුතුය. (දික්කසාද වූවන් හා වැන්දඹුවන් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබති.) පොලිස් සේවයේ දැනටමත් යෙදී සිටින අයට මෙය අදාළ නොවේ.

හෙද නිලධාරි තනතුර සඳහා අවිවාහක පිරිමි/ කාන්තා අයවලුන් විය යුතුය. (දික්කසාද වූවන් හා වැන්දඹුවන් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබති.) පොලිස් සේවයේ හෝ හෙද සේවයේ දැනටමත් සේවයේ යෙදී සිටින අයට මෙය අදාළ නොවේ.

4:5:4 දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

4.5.5 පිරිමි - උස - අඩි 05 අඟල් 06 ට නොඅඩු විය යුතුය.

පපුව - හුස්ම නොඅල්ලා අඟල් 32 ට නොඅඩු විය යුතුය.

කාන්තා - උස - අඩි 05 අඟල් 04 ට නොඅඩු විය යුතුය.

(විශේෂ සුදුසුකම් සහ ප්‍රවීණතාවයන් සහිත අයදුම්කරුවන් සම්බන්ධයෙන් පොලිස්පතිගේ අභිමතය පරිදි මෙම උස සීමාවන් සහ පපුවට අදාළ සීමාවන්ගෙන් අපගමනය විය හැක.)

4:5:6 *දෘෂ්ඨිය පිළිබඳ අවශ්‍යතාවයන්*: එක් ඇසක දෘෂ්ඨිය 6/12 අඩු නොවිය යුතුය. දෘෂ්ඨිය එක් ඇසක 6/6 සහ අනෙක් ඇසෙහි 6/18 වේ නම් එයද පිළිගනු ලැබේ. වර්ණ දෘෂ්ඨිය සාමාන්‍ය විය යුතුය.

4:5:7 කෘතිම ශාරීරික වෙනස්කම් කර නොතිබිය යුතුය. (උදා : පච්ච කොටා තිබීම)

4:5:8 තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 4.1 සිට 4.6 දක්වා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ *ගැසට්* පත්‍රයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තැබිය යුතුය.

**4:6** වයස :

**අංක 01 හි (a) සිට (j) දක්වා තනතුරු සඳහා** *ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-32 ත් අතර විය යුතුය. සීමිත හා කුසලතා පදනම මත බඳවා ගැනීමේ දී දැනට පොලිස් සේවයේ යෙදී සිටින නිලධාරින්ගේ උපරිම වයස් සීමාව අවුරුදු 35 යි.

**ඖෂධවේදී / විද්‍යුත් ඛන්තුක රේඛන ශිල්පී / වෛද්‍ය රසායනාගාර කාර්මික / සූපවේදී/ හෙද නිලධාරි තනතුර සඳහා පමණක්** ***ගැසට්*** **නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-30 ත් අතර විය යුතුය.** සීමිත හා කුසලතා පදනම මත බඳවා ගැනීමේදී දැනට පොලිස් සේවයේ යෙදී සිටින නිලධාරින්ගේ උපරිම වයස් සීමාව අවුරුදු 35 යි.

කාර්මික ගෘහස්ථ / කාර්මික / ප්‍රමාණ සමීක්ෂක / සැලසුම් ශිල්පී / භෝජනාගාර පාලක තනතුර

සඳහා පමණක් *ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-30 ත් අතර විය යුතුය.

ක්‍රීඩා පිටි හා තණතීරු නඩත්තු උපදේශක තනතුර සඳහා *ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 - 40 ත් අතර විය යුතුය.

**05.** බඳවා ගැනීමේ ක්‍රමය :

**5:1** **මූලික පරීක්ෂණය:**
අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන්/ අයදුම්කාරියන් අතරින් මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්/ අයදුම්කාරියන් පමණක් මූලික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. එම පරීක්ෂණයේදී ඉහත 4.1 සිට 4.6 දක්වා වූ සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

**5:2** **ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය:**
පොලිස්පති විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින් අයදුම්කරුවන්/ අයදුම්කාරියන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ.

**5:3** මෙම පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන්/ අයදුම්කාරියන් පමණක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලැබේ.

**06.** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

අංක **01** හි **(a)** සිට **(j)** දක්වා තනතුරු සඳහා

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය.* |
|---|---|---|
| 01. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 30 | |
| 02. භාෂා දැනුම/ පරිගණක හැකියාව / වෙනත් | 20 | |
| 03. ක්‍රීඩා කුසලතා | 25 | |
| 04. නායකත්වය / ප්‍රජා සේවාවන් | 15 | |
| 05. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම | 10 | |
| එකතුව | **100** | 40% |

**ඖෂධවේදී තනතුර/ විද්‍යුත් ඛන්තුක රේඛන ශිල්පී (පිරිමි/ කාන්තා) තනතුරු සඳහා :**

- *වෘත්තීය සුදුසුකම්ලත් අපේක්ෂකයින් / උප පොලිස් සේවයට බඳවා ගැනීම සඳහා*

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය.* |
|---|---|---|
| 01. වෘත්තියට අදාළ සේවා පළපුරුද්ද (වසරකට 06 බැගින් උපරිම) | 30 | 40% |
| 02. භාෂා දැනුම / පරිගණක හැකියාව / වෙනත් | 25 | |
| 03. ක්‍රීඩා කුසලතා | 10 | |
| 04. නායකත්වය / ප්‍රජා සේවාවන් | 25 | |
| 05. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම | 10 | |
| එකතුව | **100** | |

- *වෘත්තීය සුදුසුකම් නොලත් අපේක්ෂකයින් බඳවා ගැනීම සඳහා :*

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01. භාෂා දැනුම / පරිගණක හැකියාව / වෙනත් | 30 | 40% |
| 02. ක්‍රීඩා කුසලතා | 30 | |
| 03. නායකත්වය / ප්‍රජා සේවාවන් | 30 | |
| 04. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම | 10 | |
| එකතුව | **100** | |

**කාර්මික ගෘහස්ථ/ කාර්මික/ ක්‍රීඩා පිටි හා තණතීරු නඩත්තු උපදේශක/ ප්‍රමාණ සමීක්ෂක/ භෝජනාගාර පාලක/ සැලසුම් ශිල්පී/ සූපවේදී තනතුරු (පිරිමි) සඳහා**

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය.* |
|---|---|---|
| 01. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 30 | |
| 02. භාෂා දැනුම/ පරිගණක හැකියාව / වෙනත් | 20 | |
| 03. ක්‍රීඩා කුසලතා | 20 | |
| 04. නායකත්වය / ප්‍රජා සේවාවන් | 20 | |
| 05. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම | 10 | |
| එකතුව | **100** | **40%** |

**වෛද්‍ය රසායනාගාර කාර්මික (පිරිමි/ කාන්තා)**

- *වෘත්තීය සුදුසුකම්ලත් අපේක්ෂකයින් / උප පොලිස් සේවයට බඳවා ගැනීම සඳහා* :

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය.* |
|---|---|---|
| 01. වෘත්තීය සුදුසුකම්<br><br>(ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පයට අදාළ උපාධිය ලබා තිබීම හෝ සෞඛ්‍ය අමාත්‍යාංශය පිළිගත් වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පයට අදාළ ඩිප්ලෝමාවක් ලබා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම | 40 | අදාළ නොවේ. |
| 02. සේවා පළපුරුද්ද<br>සෞඛ්‍ය අමාත්‍යාංශය පිළිගත් සෞඛ්‍ය ආයතනයක සේවා පළපුරුද්ද (ලකුණු 04 බැගින් උපරිමය ලකුණු 20 යි ) | 20 | |
| 03. භාෂා දැනුම / පරිගණක හැකියාව / වෙනත් | 10 | |
| 04. ක්‍රීඩා කුසලතා | 10 | |
| 05. නායකත්වය / ප්‍රජා සේවාවන් | 10 | |
| 06. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම | 10 | |
| එකතුව | **100** | **40%** |

- *වෘත්තීය සුදුසුකම් නොලත් අපේක්ෂකයින් බඳවා ගැනීම සඳහා* :

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01. භාෂා දැනුම / පරිගණක හැකියාව / වෙනත් | 30 | අදාළ නොවේ. |
| 02. ක්‍රීඩා කුසලතා | 30 | |
| 03. නායකත්වය / ප්‍රජා සේවාවන් | 30 | |
| 04. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම | 10 | |
| එකතුව | **100** | **40%** |

**හෙද නිලධාරි (පිරිමි/කාන්තා)**

- වෘත්තීය සුදුසුකම් ලත් අපේක්ෂකයින් / උප පොලිස් සේවයට බඳවා ගැනීම සඳහා

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය.* |
|---|---|---|
| 01. වෘත්තීය සුදුසුකම් (ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෙද උපාධිය ලබා තිබීම හෝ සෞඛ්‍ය අමාත්‍යාංශය පිළිගත් හෙද විද්‍යාලකින් හෙද ඩිප්ලෝමාව ලබා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම | 40 | 40% |
| 02. සේවා පළපුරුද්ද<br>සෞඛ්‍ය අමාත්‍යාංශය පිළිගත් සෞඛ්‍ය ආයතනයක සේවා පළපුරුද්ද (ලකුණු 04 බැගින් උපරිමය ලකුණු 20 යි ) | 20 | |
| 03. භාෂා දැනුම / පරිගණක හැකියාව / වෙනත් | 10 | |
| 04. ක්‍රීඩා කුසලතා | 10 | |
| 05. නායකත්වය / ප්‍රජා සේවාවන් | 10 | |
| 06. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම | 10 | |
| **එකතුව** | **100** | |

- වෘත්තීය සුදුසුකම් නොලත් අපේක්ෂකයින් බඳවා ගැනීම සඳහා

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01. භාෂා දැනුම / පරිගණක හැකියාව / වෙනත් | 30 | 40% |
| 02. ක්‍රීඩා කුසලතා | 30 | |
| 03. නායකත්වය / ප්‍රජා සේවාවන් | 30 | |
| 04. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම | 10 | |
| **එකතුව** | **100** | |

***සටහන* :** මූලික පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන්/ අයදුම්කාරියන් පමණක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරනු ලබන අතර, එහි දී 40% ක් හෝ ඊට වඩා ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන්/ අයදුම්කාරියන් පමණක් ලිඛිත විභාගයට කැඳවනු ලැබේ.

06. **ලිඛිත විභාගය**

වෙබ් අඩවි සංස්කාරක /වෙබ් අඩවි සංවර්ධන / පද්ධති විශ්ලේෂක /පරිගණක මෘදුකාංග පැකේජ උපදේශක/ පරිගණක / ග්‍රැෆික් නිර්මාන උපදේශක / පරිගණක දෘඪාංග හා ජාලකරණ උපදේශක / වැඩසටහන් සම්පාදක / ජාල පද්ධති පාලක /දත්ත පද්ධති පාලන / ක්‍රීඩා පිටි හා **තණතීරු** නඩත්තු උපදේශක

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01. අවබෝධය හා භාෂා හැකියාව | 100 | 40% |
| 02. සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| 03. වෘත්තියට අදාළ - ලිඛිත / ප්‍රායෝගික | 40 / 60 } 100 | එක් කොටසකින් 40% ක් බැගින් |

**ඖෂධවේදී තනතුර / විද්‍යුත් බන්තුක රේඛන ශිල්පී / වෛද්‍ය රසායනාගාර කාර්මික/ හෙද නිලධාරි (කාන්තා/ පිරිමි) තනතුරු සඳහා**

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01. අවබෝධය හා භාෂා හැකියාව | 100 | 40% |
| 02. සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| 03. සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ සාමාන්‍ය දැනුම | 100 | 40% |

**කාර්මික ගෘහස්ථ/ කාර්මික/ ප්‍රමාණ සමීක්ෂක/ භෝජනාගාර පාලක/ සැලසුම් ශිල්පී/ සූපවේදී (පිරිමි) තනතුරු සඳහා**

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01. අවබෝධය හා භාෂා හැකියාව | 100 | 40% |
| 02. සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| 03. ක්ෂේත්‍රයට අදාළ සාමාන්‍ය දැනුම | 100 | 40% |

7.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණු සංඛ්‍යාව ලිඛිත විභාගයෙන් හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණු සංඛ්‍යාව සමඟ එකතු කොට අයදුම්කරු/ අයදුම්කාරිය ලබා ගන්නා මුළු ලකුණු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

7.2 අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව සඳහා ලබාගත් මුළු ලකුණු සංඛ්‍යාව අනුපිළිවෙලෙහි කුසලතා ලැයිස්තුවක් අනුව බඳවා ගනු ලැබේ.

**08. පසුබිම් පරීක්ෂණය**

8.1 ඉහත 7.2 ඡේදය පරිදි බඳවා ගැනීමට සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් / අයදුම්කාරියන් සම්බන්ධයෙන් යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහා පසුබිම් පරීක්ෂණය පවත්වනු ලබයි.

*සටහන* : සමීප ඥාතීන් සම්බන්ධයෙන් අපරාධ වාර්තා කිසිවක් නොතිබිය යුතුයි. සමීප ඥාතීන් යනු අයදුම්කරු/ අයදුම්කාරිය විවාහක නම් ඔහුගේ කලත්‍රයාද, අයදුම්කරුවන්ගේ/ අයදුම්කාරියන්ගේ මව, පියා, භාරකරුවන්, සහෝදර සහෝදරියන් සහ සහෝදර සහෝදරියන් විවාහක නම් ඔවුන්ගේ කලත්‍රයන්ද සමීප ඥාතීන් ලෙස සලකනු ලැබේ.

8.2 අයදුම්කරුගේ/ අයදුම්කාරියගේ යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහා ඔහු/ ඇය හා ඔහුගේ/ ඇයගේ සමීප ඥාතීන්ගේද , ඔහු සමීපව ඇසුරු කරන්නන්ගේද යහපත් චරිතය, හැසිරීම සම්බන්දව පරීක්ෂණ පවත්වනු ලබන අතර අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කරුවන්/ අයදුම්කාරියන් බඳවා ගනු නොලැබේ.

8.3 බඳවා ගැනීමේදී අයදුම්කරුවන්/ අයදුම්කාරියන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම ඔහු/ ඇය බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු පැවසු බව බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් ඕනෑම අවස්ථාවකදී සේවයෙන් ඉවත් කරනු ලැබේ.

8.4 කුසලතා ලකුණු ලැයිස්තුව අනුව බඳවා ගැනීම සඳහා බලාපොරොත්තු වන අයදුම්කරුගේ/ අයදුම්කාරියගේ පසුබිම් වාර්තා ලැබෙන තෙක් ඔහුව/ ඇය වෛද්‍ය පරීක්ෂණය සඳහා කැඳවනු නොලැබේ.

**09. වෛද්‍ය පරීක්ෂණය**

වෛද්‍ය පරීක්ෂණය සඳහා තෝරාගත් අයදුම්කරුවන්/ අයදුම්කාරියන් පොලිස් රෝහලේ අධ්‍යක්ෂ වෛද්‍ය විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් විය යුතුය. තවද මෙහිදී අයදුම්කරුවන්/ අයදුම්කාරියන් පොලිස් රාජකාරි සඳහා සුදුසු බවට ශාරීරික හා මානසික යෝග්‍යතා

පරීක්ෂණයකටද භාජනය කරනු ලැබේ. අධ්‍යක්‍ෂ වෛද්‍ය විසින් වෛද්‍ය පරීක්ෂණයේ වාර්තා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ 169 වෙනි පොදු පෝරම යටතේ ඉදිරිපත් කළ යුතුය. වෛද්‍ය පරීක්‍ෂණයට භාජනය විය හැක්කේ එක් වරක් පමණි. (වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වන අයදුම්කරුවන්/ අයදුම්කාරියන් සඳහා අභියාචනා ඉදිරිපත් කළ නොහැක.)

**ඖෂධවේදි තනතුර/ විද්‍යුත් බන්තුක රේඛන ශිල්පී/ වෛද්‍ය රසායනාගාර කාර්මික/ හෙද නිලධාරි (පිරිමි/ කාන්තා) තනතුරේ අයදුම්කරුවන්/ අයදුම්කාරියන් පොලිස් රෝහලේ රාජකාරි සඳහා සුදුසු බවට ශාරීරික හා මානසික යෝග්‍යගතා පරීක්‍ෂණයකටද භාජනය කරනු ලැබේ.**

**10. පුහුණුව**

වෙබ් අඩවි සංස්කාරක /වෙබ් අඩවි සංවර්ධන / පද්ධති විශ්ලේෂක /පරිගණක මෘදුකාංග පැකේජ උපදේශක/ පරිගණක /ග්‍රැෆික් නිර්මාන උපදේශක / පරිගණක දෘඩාංග හා ජාලකරණ උපදේශක / වැඩසටහන් සම්පාදක / ජාල පද්ධති පාලක /දත්ත පද්ධති පාලන

I. විවෘත බඳවා ගැනීම සඳහා පසුබිම් පරීක්ෂණයෙන් සහ වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන්/ අයදුම්කාරියන් පමණක් පොලිස්පති විසින් නියම කරන ලද දිනයකදී මූලික පොලිස් පුහුණුවක් සඳහා කැඳවනු ලබේ.

II. සීමිත පදනම සහ කුසලතාවය මත බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබන නිලධරයන් පොලිස්පති විසින් නියම කරන ලද දිනයක දී තනතුරට හැඩගැස්වීමේ පොලිස් පුහුණුව සඳහා කැඳවනු ලැබේ.

**ඖෂධවේදි තනතුර/ විද්‍යුත් බන්තුක රේඛන ශිල්පී/ වෛද්‍ය රසායනාගාර කාර්මික/ හෙද නිලධාරි (පිරිමි/ කාන්තා)/ ක්‍රීඩා පිටි හා තණතීරු නඩත්තු උපදේශක තනතුරු සඳහා**

I. විවෘත බඳවා ගැනීමේදී පසුබිම් පරීක්ෂණයෙන් සහ වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන් / අයදුම්කාරියන් පමණක් පොලිස්පති විසින් නියම කරන ලද දිනයකදි සති 12 ක මූලික පොලිස් පුහුණුවක් සඳහා කැඳවනු ලබේ.

II. සීමිත පදනම මත බඳවා ගැනීමේදී සුදුසුකම් ලබන නිලධරයන් පොලිස්පති විසින් නියම කරන ලද දිනයක දී සති 12 ක තනතුරට හැඩගැස්වීමේ පොලිස් පුහුණුවක් සඳහා කැඳවනු ලැබේ.

**කාර්මික ගෘහස්ථ/ කාර්මික/ ප්‍රමාණ සමීක්ෂක/ භෝජනාගාර පාලක/ සැලසුම් ශිල්පී (පිරිමි) තනතුරු සඳහා**

I. විවෘත බඳවා ගැනීම සඳහා පසුබිම් පරීක්‍ෂණයෙන් සහ වෛද්‍ය පරීක්‍ෂණයෙන් සමත් අයදුම්කරුවන් පමණක් පොලිස්පති විසින් තීරණය කරනු ලබන කාලසීමාවක් සඳහා පුහුණුවට කැඳවනු ලබේ.

II. බඳවාගනු ලබන සියලුම අයදුම්කරුවන් සඳහා ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේදී / ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේදී පොලිස්පති විසින් තීරණය කරනු ලබන කාලසීමාවක් සඳහා සේවා ආරම්භක පුහුණුවක් සහ විෂයානුබද්ධ ප්‍රායෝගික පුහුණුවක් ද ලබා දෙනු ලැබේ.

**සූපවේදි තනතුර (පිරිමි) තනතුර සඳහා**

I. විවෘත බඳවා ගැනීමේදී පසුබිම් පරීක්ෂණයෙන් සහ වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන් පමණක් පොලිස්පති විසින් නියම කරන ලද දිනයකදී සති 12 ක මූලික පොලිස් පුහුණුවක් සඳහා කැඳවනු ලැබේ.

II. සීමිත පදනම මත බඳවා ගන්නා නිලධරයන් වෘත්තීය පුහුණුව සාර්ථකව නිම කරන තෙක් අදාළ තනතුරේ ස්ථිර කිරීම අත්හිටවනු ලැබේ. කාලානුරූපව පෙරලා පෙර සිටි තනතුරට යවනු ලැබේ.

**11. සේවා කොන්දේසි**

වෙබ් අඩවි සංස්කාරක /වෙබ් අඩවි සංවර්ධන / පද්ධති විශ්ලේෂක /පරිගණක මෘදුකාංග පැකේජ උපදේශක/ පරිගණක /ග්‍රැෆික් නිර්මාන උපදේශක / පරිගණක දෘඩාංග හා ජාලකරණ උපදේශක / වැඩසටහන් සම්පාදක / ජාල පද්ධති පාලක /දත්ත පද්ධති පාලන/ ක්‍රීඩා පිටි හා **තණතීරු** නඩත්තු උපදේශක

11:1 විවෘත බඳවා ගන්නා ආධුනික නිලධාරින් තුන් වසරක (03) පරිවාස/ ආධුනික කාලයකට යටත් වනු ඇත. ආධුනික කාලය තුළ විවාහ වන්නේ නම් පොලිස්පතිතුමාගේ විශේෂ අවසරයක් ලබා ගත යුතුය. (ද්විතියනය පදනම මත තෝරා ගන්නා අයදුම්කරුවන්/ අයදුම්කාරියන්ට අදාළ නොවේ)

11:2 සීමිත පදනම මත සහ කුසලතාවය මත බඳවා ගන්නා නිලධාරීන් එක් වසරක (01) වැඩබැලීමේ කාලයකටත් යටත්වනු ඇත.

11:3 තෝරා ගනු ලබන අයදුම්කරුවන්/ අයදුම්කාරියන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් සම්පාදිතව පවත්නා සහ මින්මතු ඒ සම්බන්ධයෙන් සම්පාදනය කරනු ලබන නියෝග වෙතොත් ඒවාටද අනුකූලව කටයුතු කළ යුතුය.

11:4 ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි, ජාතික පොලිස් කොමිෂන් සභා චක්‍රලේඛ හා විධිවිධාන, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, භාණ්ඩාගාර චක්‍රලේඛ, ශ්‍රී ලංකා පොලිස් නියෝග,පොලිස්පති චක්‍රලේඛ, අත්පොත් සහ උපදෙස් සංග්‍රහවල විධිවිධානවලට යටත් විය යුතුය.

11.5 ආධුනික සේවා කාලය අවසන් වීමට පෙර යම් නිලධාරියෙකු/ නිලධාරිනියෙකු තනතුරින් ඉල්ලා අස්වීමට අදහස් කරන්නේ නම් ඔහුගේ පුහුණුව සහ නිල ඇඳුම් ඇතුළු අනෙකුත් වියදම් වෙනුවෙනුත් නියම කරනු ලබන මුදලක් වෙතොත් ඒවා සියල්ල ඉල්ලා අස්වීමේ ලිපිය භාරදෙන අවස්ථාවේදීම ගෙවීමට කැමැත්ත පලකිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතුය. ඉල්ලා අස්වීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහය සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල විධිවිධානයන්ට යටත්ව කටයුතු කරනු ලැබේ. (ද්විතීයනය පදනම මත තෝරා ගන්නා අයදුම්කරුවන්/ අයදුම්කාරියන්ට අදාළ නොවේ)

11.6 විවෘත බඳවා ගන්නා නිලධාරීන් පත්වීම භාර ගැනීමට ප්‍රථම සියලු ණය හා ණය බැඳීම්වලින් නිදහස් වී සිටිය යුතුය. (ද්විතීයනය පදනම මත තෝරා ගන්නා අයදුම්කරුවන්/ අයදුම්කාරියන්ට අදාළ නොවේ)

11.7 ආධුනික උප පොලිස් පරීක්ෂකවරුන් (සහායක සේවා) පුහුණුව ආරම්භ කළ වහාම ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව පොලිස්පති චක්‍රලේඛ අංක 1693/2003 සහ 1804/2004 ට අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා / දිවුරුම් දිය යුතුය.

**ඖෂධවේදී තනතුර/ විද්‍යුත් බන්තුක රේඛන ශිල්පී/ වෛද්‍ය රසායනාගාර කාර්මික/ හෙද නිලධාරි (පිරිමි/කාන්තා)/ සූපවේදී (පිරිමි) තනතුරු සඳහා**

11:1 සහතිකපත් ලත් හෝ නොලත් විවෘත බඳවා ගන්නා ආධුනික නිලධරයන් තුන් වසරක (03) පරිවාස/ ආධුනික කාලයකටත්, සීමිත පදනම මත බඳවා ගන්නා නිලධරයන් වෘත්තීය පාඨමාලාවෙන් පසු එක් වසරක(01) වැඩ බැලීමේ කාලයකටත් යටත්වනු ඇත. ආධුනික කාලය තුළ විවාහ වන්නේ නම් පොලිස්පතිතුමාගේ විශේෂ අවසරයක් ලබා ගත යුතුය. (ද්විතීයනය පදනම මත තෝරා ගන්නා අයදුම්කරුවන්/ අයදුම්කාරියන්ට අදාළ නොවේ)

11:2 අ.පො.ස. උසස් පෙළ ප්‍රතිඵල මත විවෘත බඳවා ගන්නා සහ සීමිත පදනම මත බඳවා ගන්නා ලද නිලධාරින් වෘත්තීය පුහුණුව සාර්ථකව නිම කරන තෙක් අදාළ තනතුරේ ස්ථිර කිරීම අත් හිටවනු ලැබේ. සීමිත පදනම මත බඳවා ගන්නා ලද නිලධාරීන් වෘත්තීය පුහුණුව සාර්ථකව නිම කිරීමට අපොහොසත් වුවහොත් කාලානුරූපව පෙරලා කළින් සිටි නිලයට යවනු ලැබේ.

11:3 තෝරා ගනු ලබන අයදුම්කරුවන්/ අයදුම්කාරියන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් සම්පාදිතව පවත්නා සහ මින්මතු ඒ සම්බන්ධයෙන් සම්පාදනය කරනු ලබන නියෝග වෙතොත් ඒවාටද අනුකූලව කටයුතු කළ යුතුය.

11:4 ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි, ජාතික පොලිස් කොමිෂන් සභා චක්‍රලේඛ හා විධිවිධාන, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, භාණ්ඩාගාර චක්‍රලේඛ, ශ්‍රී ලංකා පොලිස් නියෝග, පොලිස්පති චක්‍රලේඛ, අත්පොත් සහ උපදෙස් සංග්‍රහවල විධිවිධානවලට යටත් විය යුතුය.

11:5 අ.පො.ස (උ.පෙළ) සුදුසුකම් මත ඉඳුරාම බඳවා ගන්නා නිලධරයන් සහ සීමිත පදනම මත බඳවා ගන්නා නිලධරයන් ඖෂධවේදී පුහුණුව නිම කිරීමෙන් පසුව ඖෂධවේදී සහතිකය හා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලැබූ දින සිට අවුරුදු 15 ක අනිවාර්ය සේවා කාලයක් ශ්‍රී ලංකා පොලීසියෙහි සේවය කළ යුතුය.

11:6 අනිවාර්ය සේවා කාලය අවසන් වීමට පෙර යම් නිලධරයකු තනතුරින් ඉල්ලා අස්වීමට අදහස් කරන්නේ නම් ඔහුගේ/ ඇයගේ පුහුණුව සහ නිල ඇඳුම් ඇතුළු අනෙකුත් වියදම් වෙනුවෙනුත් නියම කරනු ලබන මුදලක් වෙතොත් ඒවා සියල්ල ඉල්ලා අස්වීමේ ලිපිය භාර දෙන අවස්ථාවේදීම ගෙවීමට කැමැත්ත පලකිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතුය. ඉල්ලා අස්වීම සම්බන්ධයෙන් ආයතන

සංග්‍රහය සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල විධිවිධානයන්ට යටත්ව කටයුතු කරනු ලැබේ. (ද්විතීයනය පදනම මත තෝරා ගන්නා අයදුම්කරුවන්/අයදුම්කාරියන්ට අදාළ නොවේ).

11.7 විවෘත බඳවා ගන්නා නිලධරයන් පත්වීම් භාර ගැනීමට ප්‍රථම සියළු ණය හා ණය බැඳීම්වලින් නිදහස් වී සිටිය යුතුය. (ද්විතීයනය පදනම මත තෝරා ගන්නා අයදුම්කරුවන්/අයදුම්කාරියන්ට අදාළ නොවේ).

11.8 ආධුනික උප පොලිස් පරීක්ෂකවරුන් (සහයක සේවා)/ කාන්තා උප පොලිස් පරීක්ෂකවරියන් (සහායක සේවා) පුහුණුව ආරම්භ කළ වහාම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව පොලිස්පති චක්‍රලේඛ අංක 1693/2003 සහ 1804/2004 ට අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා / දිවුරුම් දිය යුතුය.

**කාර්මික ගෘහස්ථ/ කාර්මික/ ප්‍රමාණ සමීක්ෂක/ භෝජනාගාර පාලක/ සැලසුම් ශිල්පී (පිරිමි) තනතුරු සඳහා**

11:1 තෝරාගනු ලබන අයදුම්කරුවන් තුන් අවුරුදු (03) ආධුනික කාල පරිච්ඡේදයකට යටත් වනු ඇත. ආධුනික කාලය තුළ විවාහ විය හැක්කේ පොලිස්පතිගේ අවසරය මත පමණි. (ද්විතීයනය පදනම මත තෝරා ගන්නා අයදුම්කරුවන් අදාළ නොවේ).

11:2 තෝරාගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් සම්පාදිතව පවත්නා සහ මින්මතු ඒ සම්බන්ධයෙන් සම්පාදනය කරනු ලබන නියෝග වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතුයි.

11:3 ජාතික පොලිස් කොමිෂන් සභා චක්‍රලේඛ හා විධිවිධාන, ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි, ජාතික පොලිස් කොමිෂන් සභා චක්‍රලේඛ හා විධිවිධාන, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, භාණ්ඩාගාර චක්‍රලේඛ, ශ්‍රී ලංකා පොලිස් නියෝග, පොලිස්පති චක්‍රලේඛ, අත්පොත් සහ උපදෙස් සංග්‍රහවල විධිවිධානවලට යටත් විය යුතුය.

11:4 බඳවා ගන්නා අයදුම්කරුවන් පත් කර ගනු ලැබූ දින සිට අවුරුදු 03 ක ආධුනික සේවා කාලයක් ශ්‍රී ලංකා පොලිසියේ සේවය කළ යුතු අතර,මෙම ආධුනික සේවා කාලය අවසන් වීමට පෙර යම් නිලධරයකු තනතුරින් ඉල්ලා අස්වීමට අදහස් කරන්නේ නම් ඔහුගේ/ඇයගේ පුහුණුව සහ නිල ඇඳුම් ඇතුළු අනෙකුත් වියදම් වෙනුවෙනුත් නියම කරනු ලබන මුදලක් වෙතොත් ඒවා සියල්ල ඉල්ලා අස්වීමේ ලිපිය භාරදෙන අවස්ථාවේදීම ගෙවීමට කැමැත්ත පලකිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතුය. ඉල්ලා අස්වීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහය සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල විධිවිධානයන්ට යටත්ව කටයුතු කරනු ලැබේ. (ද්විතීයනය පදනම මත තෝරා ගන්නා අයදුම්කරුවන්/ අයදුම්කාරියන්ට අදාළ නොවේ).

11.5 පත්වීම භාර ගැනීමට සුදුසුකම් ලබන්නන් පත්වීම් භාර ගැනීමට ප්‍රථම සියළු ණය හා ණය බැඳීම්වලින් නිදහස් විය යුතුයි. (ද්විතීයනය පදනම මත තෝරා ගන්නා අයදුම්කරුවන්/අයදුම්කාරියන්ට අදාළ නොවේ).

11.6 විවෘතව බඳවා ගන්නා උප පොලිස් පරීක්ෂකවරුන් (සහායක සේවා) පුහුණුව ආරම්භ කළ වහාම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව පොලිස්පති චක්‍රලේඛ අංක 1693/2003 සහ 1804/2004 ට අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා / දිවුරුම් දිය යුතුය.

**12. තනතුරේ ස්වභාවය :**

ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
(රජයේ ප්‍රතිපත්තිමය තීරණ මත වෙනස් විය හැක.)

**13. කාර්යක්ෂමතා කඩඉම :** (ද්විතීයනය පදනම මත තෝරා ගන්නා අයදුම්කරුවන්/අයදුම්කාරියන්ට අදාළ නොවේ).

වෙබ් අඩවි සංස්කාරක /වෙබ් අඩවි සංවර්ධන / පද්ධති විශ්ලේෂක /පරිගණක මෘදුකාංග පැකේජ උපදේශක/ පරිගණක /ග්‍රැෆික් නිර්මාණ උපදේශක / පරිගණක දෘඩාංග හා ජාලකරණ උපදේශක / වැඩසටහන් සම්පාදක / ජාල පද්ධති පාලක/ ක්‍රීඩා පිටි හා තණතීරු නඩත්තු උපදේශක.

| *කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග* | *කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද* | *කාර්යක්ෂමතා කඩඉම් ස්වභාවය ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලාව/ වෙනත්* |
|---|---|---|
| පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (සේවය ස්ථිර කිරීම) | උප පොලිස් පරීක්ෂක (සහායක සේවා) තනතුරට පත් වී වසර 03 ක් ගතවීමට පෙර | ලිඛිත , ප්‍රායෝගික හා වාචික |
| දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | උප පොලිස් පරීක්ෂක (සහායක සේවා) තනතුරට පත් වී වසර 08 ක් ගතවීමට පෙර | ලිඛිත , ප්‍රායෝගික, වාචික |
| තුන්වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | පොලිස් පරීක්ෂක (සහායක සේවා) තනතුරට පත් වී වසර 05 ක් ගතවීමට | ලිඛිත , ප්‍රායෝගික,වාචික |

**ඖෂධවේදී / විද්‍යුත් ඛන්තුක රේඛන ශිල්පී/ වෛද්‍ය රසායනාගාර කාර්මික/ භෙද නිලධාරි (පිරිමි/කාන්තා) / කාර්මික ගෘහස්ථ/ ප්‍රමාණ සමීක්ෂක/ භෝජනාගාර පාලක/ සැලසුම් ශිල්පී/ සූපවේදී (පිරිමි) තනතුරු සඳහා**

| *කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග* | *කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද* | *කාර්යක්ෂමතා කඩඉම් ස්වභාවය ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලාව/ වෙනත්* |
|---|---|---|
| පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (සේවය ස්ථිර කිරීම) | උප පොලිස් පරීක්ෂක (සහායක සේවා) තනතුරට පත් වී වසර 03 ක් ගතවීමට පෙර | ලිඛිත , ප්‍රායෝගික හා වාචික |
| දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | උප පොලිස් පරීක්ෂක (සහායක සේවා) තනතුරට පත් වී වසර 07 ක් ගතවීමට පෙර | ලිඛිත , ප්‍රායෝගික හා වාචික |
| තුන්වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | පොලිස් පරීක්ෂක (සහායක සේවා) තනතුරට පත් වී වසර 05 ක් ගතවීමට | ලිඛිත , ප්‍රායෝගික හා වාචික |

**කාර්මික තනතුර (පිරිමි)**

| *කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග* | *කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද* | *කාර්යක්ෂමතා කඩඉම් ස්වභාවය ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලාව/ වෙනත්* |
|---|---|---|
| පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (සේවය ස්ථිර කිරීම) | උප පොලිස් පරීක්ෂක (සහායක සේවා) තනතුරට පත් වී වසර 03 ක් ගතවීමට පෙර | ලිඛිත , ප්‍රායෝගික හා වාචික |
| දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | උප පොලිස් පරීක්ෂක (සහායක සේවා) තනතුරට පත් වී වසර 07 ක් ගතවීමට පෙර | වාචික , ප්‍රායෝගික |
| තුන්වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | පොලිස් පරීක්ෂක (සහායක සේවා) තනතුරට පත් වී වසර 05ක් ගතවීමට | වාචික , ප්‍රායෝගික |

**14. භාෂා ප්‍රවීණතාව :** (ද්විතියනය පදනම මත තෝරා ගන්නා අයදුම්කරුවන්/අයදුම්කාරියන්ට අදාළ නොවේ)

| *භාෂාව* | *ලබා ගත යුතු ප්‍රවීණතාව* |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරින් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව ලබා ගත යුතුය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුෂංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය. |
| සන්ධාන භාෂාව | අදාළ නොවේ. |

15. මෙම *ගැසට්* පත්‍රයේ I කොටස (II අ) වැනි ඡේදයේ ආරම්භයේ පළ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි බලපානු ඇත.

16. අයදුම්පත සම්පූර්ණ කිරීමේදී අයදුම්කරුවන්/අයදුම්කාරියන් සුදු පසුබිමේ ලබාගන්නා ලද පාස්පෝට් ප්‍රමාණයේ වර්ණ ඡායාරූපයක් හා පහත දැක්වෙන ලිපි ලේඛණවල පිටපත් අයදුම්පත් සම්පූර්ණ කරන අවස්ථාවේදී උඩුගත (Upload) කළ යුතුය.

(*අ*) උප්පැන්න සහතිකය
(*ආ*) ජාතික හැඳුනුම්පත
(*ඇ*) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික,
(*ඈ*) වලංගු රියැදුරු බලපත්‍රය,
(*ඉ*) වෘත්තීය සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික,
(*ඊ*) පළපුරුද්ද සනාථ කිරීම සඳහා වූ සහතික,
(*උ*) අයදුම්කරු තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවට ප්‍රකාශිත ආයතන ප්‍රධානියාගෙන් ලබාගන්නා ලද ලිපිය.(දැනටමත් රැකියාවක නිරතවන්නේ නම් පමණක් අදාළ වේ.) (අයදුම්පතේ අංක 17 ආකෘතිය යටතේ විය යුතුය),
(*ඌ*) ඔබ රජයේ සේවයෙන් හෝ සන්නද්ධ සේවයෙන් ඉවත්ව ඇත්නම් ඉවත්වීමේ ලිපිය.

17. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතුව සිටින අයදුම්කරුවන්/අයදුම්කාරියන් ඔවුන්ගේ අයදුම්පත යොමුකිරීමේදී අයදුම්පතේ අනු අංක 17 යටතේ ඇති පහත ආකෘතියට අනුව සකස්කරන ලද ලිපියක් ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව සහිතව උඩුගත (Upload) කළ යුතුය.

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ..............................................................................................................................................
මහතා ................................................................................................ දෙපාර්තමේන්තුවේ / සංස්ථාවේ/ මණ්ඩලයේ/ යුධ හමුදා බලකායේ සේවයේ නියුතු අයෙකු බවත්, ඔහු මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

..........................................
ආයතන ප්‍රධානියාගේ අත්සන,
නම.................................
නිල මුද්‍රාව

දිනය .................................

*සටහන* - පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ශ්‍රී ලංකා පොලිසිය විසින් ගෙවනු නොලැබේ.

ප්‍රියන්ත වීරසූරිය,
පොලිස්පති.

පොලිස් මූලස්ථානය,
කොළඹ 02.

07-182/2

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

### ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරි II ශ්‍රේණියේ නිලධාරින් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026

01. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරින් සඳහා අදාළ අනුමත බඳවා ගැනීම් පරිපාටියේ විධිවිධානයන්ට අනුකූලව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරි II ශ්‍රේණියේ නිලධාරින් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් 2026 වර්ෂයේ දී කොළඹ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. (i) විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කරන ලද නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(ii) විභාග අපේක්ෂකයින් සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් පනවන නීති උල්ලංඝනය කළහොත්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදු වනවා ඇත.

03. විභාග ගාස්තු:
විභාගයට නියමිත විෂයයන් සඳහා එකවර හෝ වෙන වෙනම හෝ පෙනී සිටිය හැකිය. සම්පූර්ණ විභාගයට හෝ එක් විෂයකට පළමුවරට අයදුම් කරන අපේක්ෂකයින්ගෙන් ගාස්තු අය නොකෙරේ. ඉන් පසු අයදුම් කරන ඕනෑම වාරයක දී එක් විෂයයක් සඳහා රු. 500ක විභාග ගාස්තුවක් ද සම්පූර්ණ විභාගය සඳහා රු. 1,500ක විභාග ගාස්තුවක් ද අය කෙරේ. මෙම විභාග ගාස්තු ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ලංකා බැංකුවේ, බත්තරමුල්ල ශාඛාවේ ගිණුම් අංක 7041443ට බැර වන ලෙස විභාග ගාස්තු ලෙස සඳහන් කර දිවයිනේ පිහිටි ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් ගෙවා ලබා ගන්නා ලදු පත අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවනසේ ඇලවිය යුතු ය. (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකරනු ලැබේ.

04. අයදුම්පත් :

අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එම ආදර්ශ අයදුම්පත අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිත කරමින් පිළියෙල කළ යුතුය. ශීර්ෂ අංක 01 සිට 07 තෙක් පළමුවන පිටුවටත් ඉතිරිය දෙවන පිටුවටත් වන සේ සකස් කළ යුතු ය. අයදුම්පත පිළියෙල කර ගන්නා විට ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල භාෂාවෙන් සම්පූර්ණ කරන ලද අයදුම්පත්වල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන්ද දෙමළ භාෂාවෙන් සම්පූර්ණ කරන ලද අයදුම්පත්වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද යෙදීම අවශ්‍යය. අයදුම්පත යතුරුලියනය කර හෝ අත් අකුරින් හෝ නිවැරදිව හා පැහැදිලිව සම්පූර්ණ කළ යුතු ය. ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත්, අපේක්ෂකයින් විසින් අංශ ප්‍රධානියා මගින් 2026.08.10 වැනි දිනට පෙර ලැබෙන සේ “ආගමන හා විගමන පාලක ජනරාල්, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, "සුහුරුපාය", බත්තරමුල්ල.” යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් අතේ රැගෙනවිත් පාලන අංශයේ අදාළ විෂයභාර කළමනාකරණ සේවා නිලධාරි වෙත භාර දී ලද බවට ලිපියක් ලබා ගත යුතු ය. අයදුම්පත් එවීමේ දී ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ “බලයලත් නිලධාරි II ශ්‍රේණියේ නිලධාරින් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026” යනුවෙන් පැහැදිලිව සඳහන් කර එවිය යුතු ය. අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් හා අයදුම්පත් බාරගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත. තවද සම්පූර්ණ කරන ලද අයදුම්පත විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳ අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එසේ නොවුවහොත්, අයදුම්පත ප්‍රතික්ෂේප වනු ඇත. (සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

05. විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ:-

(i) ජාතික හැඳුනුම්පත;
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය;
(iii) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය,

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන්

විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිට වන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනා ගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

06. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් යොමු කර ඇති අපේක්ෂකයින් වෙත ලිඛිත පරීක්ෂණය සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙහි අධ්‍යක්ෂ ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. ප්‍රවේශ පත්‍රය නොලද අයදුම්කරුවකු වේ නම්, **0112101553** දරන දුරකථන අංකය ඔස්සේ ඒ බව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පාලක (පාලන) වෙත දැන්විය යුතු ය. තවද, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විභාග අංශයේ දුරකථන අංක **011-5980252** හෝ **011-5980236** ඔස්සේ සතියේ වැඩ කරන දිනයන්හි පෙ.ව. 8.30 සිට ප.ව. 4.00 දක්වා විමසිය හැකිය. එසේ විමසීමේ දී, අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය සහ ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු ය. එසේ විමසීම් කිරීමේ දී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතෙහි ඡායා පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත සහ අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

07. අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කර තිබිය යුතු ය. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු අතර, විභාග දින තම ප්‍රවේශ පත්‍රයේ නිශ්චිතව සඳහන් නිලධාරියකුගෙන් අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාරදිය යුතු ය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

08. විභාගයට ඉල්ලුම් කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

09. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීමට හැකි වන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු දිය යුතු ය. මේ සඳහා ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

10. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය වලින් පැවැත්වේ. අපේක්ෂකයකු තම භාෂා මාධ්‍ය තෝරා ගැනීමේ දී, තරග විභාගයක් මගින් රාජ්‍ය සේවයට බැඳුණු අයකු නම් තරග විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍ය ද, තරග විභාගයකින් තොරව රාජ්‍ය සේවයට බැඳුණු අයකු නම් රාජ්‍ය සේවයට ඇතුළත් වීමට සුදුසුකම් ලැබූ විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍යද විභාගයට පෙනී සිටීම සඳහා භාෂා මාධ්‍ය වශයෙන් තෝරා ගත යුතු ය. විභාගයට නියමිත සියලුම විෂයයන් සඳහා එකම භාෂා මාධ්‍යයකින් පෙනී සිටිය යුතු අතර ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

11. විභාග පටිපාටිය:

1. *විභාගයේ නම :* ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරී II වන ශ්‍රේණිය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම

2. *විභාගය පිළිබඳ විස්තර :*

| *විෂය අංකය* | *විෂයය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණ* |
|---|---|---|---|---|
| 01 | ආගාමික හා විගාමික ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන I | පැය 02 | 100 | 40% |
| 02 | ආගාමික හා විගාමික ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන II | පැය 02 | 100 | 40% |
| 03 | ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසි | පැය 02 | 100 | 40% |

3. *විභාගය පවත්වනු ලබන බලධරයා:*

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා

4. *විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග :* වසරකට අවම වශයෙන් දෙවරක්

5. *විභාගය සඳහා වන විෂය නිර්දේශය:*

| *විෂය අංකය* | *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|---|
| 01 | ආගාමික හා විගාමික ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන I | 1948 අංක 20 දරන ආගාමික හා විගාමික පනත හා එහි සංශෝධන, 1948 අංක 18 දරන පුරවැසිභාවය පිළිබඳ පනත හා එහි සංශෝධන, 2008 අංක 38 දරන වීන සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත.<br><br>මෙම පනත් යටතේ පනවන ලද රෙගුලාසි. |
| 02 | ආගාමික හා විගාමික ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන II | 1968 අංක 32 දරන පුද්ගලයින් ලියා පදිංචි කිරීමේ පනත හා එහි සංශෝධන.<br><br>1977 අංක 08 දරන උදර්පන නීතිය හා එහි සංශෝධන.<br><br>මෙම පනත්වල පසුකාලීන සංශෝධන හා ඒ යටතේ පනවන ලද රෙගුලාසි.<br><br>අපරාධ නඩු විධාන සංග්‍රහයේ Vවන කොටසේ XI, XII, XIII, XIV, XV පරිච්ඡේද |
| 03 | ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසි | ආයතන සංග්‍රහය II, IV, VII , XII, XIII, XIV, XLVII, XLVIII පරිච්ඡේද, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති. මුදල් රෙගුලාසි (මු.රෙ.2(1), 135,136,137,138,139 , මු.රෙ. IV, VI පරිච්ඡේද) |

**සටහන :**

* ඉහත විෂයන්ට එක වරම හෝ වෙන වෙනම පෙනී සිටිය හැකිය.
* නියමිත කාලය තුළ දී විභාගය සමත්වීමට නොහැකිවීම, ඉන්පසුව යෙදෙන වේතනාධිකය විලම්භනය කිරීමට හේතු වේ.

12. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

13. මෙම *ගැසට්* නිවේදනය මගින් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුවද ආගමන හා විගමන පාලක ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

14. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි අනුවාදයන් අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම්, සිංහල නිවේදනයේ සඳහන් කරුණු බලපැවැත්වේ.

**අයි. චමින්ද පතිරාජ,**
ආගමන හා විගමන පාලක ජනරාල්.

2026, ජුනි මස 30 වැනි දින,
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,
සුහුරුපාය,
බත්තරමුල්ල.

**ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරී II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026**

Efficiency Bar Examination for Authorized Officers Grade II of the Department of Immigration and Emigration- 2026

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය :

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
.................................................................................................................................................
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්):
.................................................................................................................................................
(උදා : GUNAWARDHANA H. M. S. K.)

1.3 සම්පූර්ණ නම :
.................................................................................................................................................
(සිංහලෙන්/ දෙමළෙන්)

02. 2.1 කාර්යාලයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ නම සහ ලිපිනය :
.................................................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)

2.2 කාර්යාලයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ නම සහ ලිපිනය : ..................................................
..........................................................................
(සිංහලෙන්/ දෙමළෙන්)

2.3 පෞද්ගලික ලිපිනය :
.................................................................................................................................................
(සිංහලෙන්/ දෙමළෙන්)

03. ස්ත්‍රී/ පුරුෂ භාවය :

පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

04. ජාතික හැඳුනුම්පත් අංකය :

05. ජංගම දුරකථන අංකය :

06. දුරකථන අංකය (නිවස) :

07. විද්‍යුත් තැපැල් ලිපිනය :

08. ඔබ මෙවර විභාගයේ දී ඉදිරිපත් වන විෂය/ විෂයයන් :

| *අනු අංකය* | *විෂයය* | *විෂය අංකය* |
|---|---|---|
| | | |
| | | |
| | | |

09. උපන් දිනය :

වර්ෂය : [ ] මාසය : [ ] දිනය : [ ]

10. දැනට දරන තනතුර :

10.1 තනතුර : ....................................................................................

10.2 පත්වීම් ලිපියේ අංකය : ..............................................................

11. 11.1 ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද? ..................................................................

11.2 විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තුව : ................

11.3 ලදුපත් අංකය : ...............................

11.4 දිනය : ............................................

*ලදුපත මෙහි අලවන්න (අදාළ නම් පමණි)*
*ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)*

12. ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහත දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත්, විභාග ගාස්තුව වශයෙන් රුපියල් ...................................... ක් ගෙවා ලබා ගත් ලදුපත මෙහි අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟ වන බවද ප්‍රකාශ කරමි.

...................................................,
අපේක්ෂකයාගේ/ අපේක්ෂිකාවගේ අත්සන.

දිනය : ...............................

තම දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියකු ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ය.

13. *අත්සන සහතික කිරීම :*

මගේ දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරියකු /නිලධාරිනියක සහ මා විසින් පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ........ ................................................................................ මයා/ මිය/ මෙනවිය ...................................... දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ලබා ගත් ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

....................................................................,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

නම : ..............................................................
පදවි නාමය : ...................................................
ලිපිනය : .........................................................
දිනය : ............................................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

14. *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :*

1. ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්,
2. නිලධාරියා/ නිලධාරිනිය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත්, සහතික කරමි.

..................................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

## ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

### ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරි I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026

01. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරීන් සඳහා අදාළ අනුමත බඳවා ගැනීම් පරිපාටියේ විධිවිධානයන්ට අනුකූලව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරි I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් 2026 වර්ෂයේ දී කොළඹ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. (i) විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නියම කරන ලද නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(ii) විභාග අපේක්ෂකයින් සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මඟින් පනවන නීති උල්ලංඝනය කළහොත්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදු වනවා ඇත.

03. *විභාග ගාස්තු.-* විභාගයට නියමිත විෂයයන් සඳහා එකවර හෝ වෙන වෙනම හෝ පෙනී සිටිය හැකිය. සම්පූර්ණ විභාගයට හෝ එක් විෂයකට පළමුවරට අයදුම් කරන අපේක්ෂකයින්ගෙන් ගාස්තු අය නොකෙරේ. ඉන් පසු අයදුම් කරන ඕනෑම වාරයක දී එක් විෂයයක් සඳහා රු. 500ක විභාග ගාස්තුවක් ද සම්පූර්ණ විභාගය සඳහා රු. 1,000ක විභාග ගාස්තුවක් ද අය කෙරේ. මෙම විභාග ගාස්තු ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ලංකා බැංකුවේ, බත්තරමුල්ල ශාඛාවේ ගිණුම් අංක 7041443ට බැර වන ලෙස විභාග ගාස්තු ලෙස සඳහන් කර දිවයිනේ පිහිටි ඕනෑම ලංකා බැංකු ශාඛාවක් වෙත ගෙවා ලබා ගන්නා ලදු පත අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවනසේ ඇලවිය යුතු ය. (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකරනු ලැබේ.

04. අයදුම්පත් :

අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එම ආදර්ශ අයදුම්පත අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිත කරමින් පිළියෙල කළ යුතු ය. ශීර්ෂ අංක 01 සිට 07 තෙක් පළමුවන පිටුවටත් ඉතිරිය දෙවන පිටුවටත් වන සේ සකස් කළ යුතු ය. අයදුම්පත පිළියෙල කර ගන්නා විට ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල භාෂාවෙන් සම්පූර්ණ කරන ලද අයදුම්පත්වල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන්ද දෙමළ භාෂාවෙන් සම්පූර්ණ කරන ලද අයදුම්පත්වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද යෙදීම අවශ්‍යය. අයදුම්පත යතුරුලියනය කර හෝ අත් අකුරින් හෝ නිවැරදිව හා පැහැදිලිව සම්පූර්ණ කළ යුතු ය. ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත්, අපේක්ෂකයින් විසින් අංශ ප්‍රධානියා මඟින් 2026.08.10 වැනි දිනට පෙර ලැබෙන සේ “ආගමන හා විගමන පාලක ජනරාල්, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, "සුහුරුපාය", බත්තරමුල්ල.” යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. *නැතහොත්* අතේ රැගෙනවිත් පාලන අංශයේ අදාළ විෂයභාර කළමනාකරණ සේවා නිලධාරි වෙත භාර දී ලද බවට ලිපියක් ලබා ගත යුතු ය. අයදුම්පත් එවීමේ දී ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ “බලයලත් නිලධාරි I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026” යනුවෙන් පැහැදිලිව සඳහන් කර එවිය යුතු ය. අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් හා අයදුම්පත් බාරගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත. තවද සම්පූර්ණ කරන ලද අයදුම්පත විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳ අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එසේ නොවුවහොත්, අයදුම්පත ප්‍රතික්ෂේප වනු ඇත. (සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

05. විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපතිවරයා සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

(i) ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(iii) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තවද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිට වන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනා ගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

06. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් යොමු කර ඇති අපේක්ෂකයින් වෙත ලිඛිත පරීක්ෂණය සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙහි අධ්‍යක්ෂ ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. ප්‍රවේශ පත්‍රය නොලද අයදුම්කරුවකු වේ නම්, 0112101553 දරන දුරකථන අංකය ඔස්සේ ඒ බව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පාලක (පාලන) වෙත දැන්විය යුතු ය. තවද, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විභාග අංශයේ දුරකථන අංක 011-5980252 හෝ 011-5980236 ඔස්සේ සතියේ වැඩ කරන දිනයන්හි පෙ.ව. 8.30 සිට ප.ව. 4.00 දක්වා විමසිය හැකිය. එසේ විමසීමේ දී, අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය සහ ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු ය. එසේ විමසීම් කිරීමේ දී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතෙහි ඡායා පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත සහ අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

07. අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කර තිබිය යුතු ය. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු අතර විභාග දින තම ප්‍රවේශ පත්‍රයේ නිශ්චිතව සඳහන් නිලධාරියකුගෙන් අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාරදිය යුතු ය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

08. විභාගයට ඉල්ලුම් කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

09. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීමට හැකි වන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු දිය යුතු ය. මේ සඳහා ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

10. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ. අපේක්ෂකයකු තම භාෂා මාධ්‍ය තෝරා ගැනීමේ දී, තරග විභාගයක් මඟින් රාජ්‍ය සේවයට බැඳුණු අයකු නම් තරග විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍ය ද, තරග විභාගයකින් තොරව රාජ්‍ය සේවයට බැඳුණු අයකු නම් රාජ්‍ය සේවයට ඇතුළත් වීමට සුදුසුකම් ලැබූ විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍යද විභාගයට පෙනී සිටීම සඳහා භාෂා මාධ්‍ය වශයෙන් තෝරා ගත යුතු ය. විභාගයට නියමිත සියලුම විෂයන් සඳහා එකම භාෂා මාධ්‍යයකින් පෙනී සිටිය යුතු අතර ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

11. විභාග පටිපාටිය:

1. විභාගයේ නම : ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරී I වන ශ්‍රේණිය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම

2. විභාගය පිළිබඳ විස්තර :

| *විෂය අංකය* | *විෂයය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණ* |
|---|---|---|---|---|
| 01 | සිද්ධි අධ්‍යයනය | පැය 02 | 100 | 40% |
| 02 | ආයතන සංග්‍රහය, කාර්ය පටිපාටික රීති සහ මුදල් රෙගුලාසි | පැය 02 | 100 | 40% |

3. විභාගය පවත්වනු ලබන බලධරයා:

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා

4. විභාගය සඳහා වන විෂය නිර්දේශය:

| *විෂය අංකය* | *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|---|
| 01 | සිද්ධි අධ්‍යයනය | ප්‍රත්‍යාන්ත පාලන (Border Control),<br><br>මානව කුට්ඨනය (Human Trafficking),<br><br>මානව ජාවාරම් (Human Smuggling) විෂයන්ට අදාළ සිද්ධි අධ්‍යයනය |
| 02 | ආයතන සංග්‍රහය, කාර්ය පටිපාටික රීති සහ මුදල් රෙගුලාසි | ආයතන සංග්‍රහය V, VIII, XII, XIV, XV, XVI, XLVII, XLVIII පරිච්ඡේද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති.<br><br>මුදල් රෙගුලාසි (මු.රෙ. 124, 125,127,128 සහ 135, මු.රෙ. V,VI,XI පරිච්ඡේද හා VII පරිච්ඡේදයේ II වන කොටස ) හා මිලදී ගැනීමේ මූලධර්ම හා විධිවිධාන |

*සටහන :*

* ඉහත විෂයන්ට එක වරම හෝ වෙන වෙනම පෙනී සිටිය හැකිය.
* නියමිත කාලය තුළදී විභාගය සමත්වීමට නොහැකිවීම, ඉන්පසුව යෙදෙන වේතනාධිකය විලම්භනය කිරීමට හේතු වේ.

12. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

13. මෙම ගැසට් නිවේදනය මගින් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුවද ආගමන හා විගමන පාලක ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

14. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි අනුවාදයන් අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම්, සිංහල නිවේදනයේ සඳහන් කරුණු බලපැවැත්වේ.

**අයි. චමින්ද පතිරාජ,**
ආගමන හා විගමන පාලක ජනරාල්.

2026, ජුනි මස 30 දින,
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,
සුහුරුපාය,
බත්තරමුල්ල.

## ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරී I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026

Efficiency Bar Examination for Authorized Officers Grade I of the Department of Immigration and Emigration- 2026

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
.......................................................................................................................................
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්):
.......................................................................................................................................
(උදා : GUNAWARDHANA H. M. S. K.)

1.3 සම්පූර්ණ නම :
.......................................................................................................................................
(සිංහලෙන්/ දෙමළෙන්)

02. 2.1 කාර්යාලයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ නම සහ ලිපිනය :
……………….......................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)

2.2 කාර්යාලයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ නම සහ ලිපිනය : ……………………………………..................
...........................................................................
(සිංහලෙන්/ දෙමළෙන්)

2.3 පෞද්ගලික ලිපිනය :
……………………………………………………………………………….............................
(සිංහලෙන්/ දෙමළෙන්)

03. ස්ත්‍රී/ පුරුෂ භාවය :

පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

04. ජාතික හැඳුනුම්පත් අංකය :

05. ජංගම දුරකථන අංකය :

06. දුරකථන අංකය (නිවස) :

07. විද්‍යුත් තැපැල් ලිපිනය :

08. ඔබ මෙවර විභාගයේ දී ඉදිරිපත් වන විෂය/ විෂයයන් :

| *අනු අංකය* | *විෂයය* | *විෂය අංකය* |
|---|---|---|
| | | |
| | | |
| | | |

09. උපන් දිනය :

වර්ෂය : මාසය : දිනය :

10. දැනට දරන තනතුර :

10.1 තනතුර : ..........................................................................................

10.2 පත්වීම් ලිපියේ අංකය : ..................................................................

11. 11.1 ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද? ....................................................................

11.2 විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තුව : .................

11.3 ලදුපත් අංකය : ................................

11.4 දිනය : ..............................................

| |
|---|
| ලදුපත මෙහි අලවන්න (අදාළ නම් පමණි)<br>ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) |

12. ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහත දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත්, විභාග ගාස්තුව වශයෙන් රුපියල් ...................................... ක් ගෙවා ලබා ගත් ලදුපත මෙහි අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟ වන බවද ප්‍රකාශ කරමි.

................................................,

අපේක්ෂකයාගේ/ අපේක්ෂිකාවගේ අත්සන.

දිනය : ................................

තම දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියකු ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ය.

13. අත්සන සහතික කිරීම

මගේ දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරියකු /නිලධාරිනියක සහ මා විසින් පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ........ .................................................................................... මයා/ මිය/ මෙනවිය ...................................... දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ලබා ගත් ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

...................................................................,

අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

නම : ..............................................................

පදවි නාමය : ....................................................

ලිපිනය : ..........................................................

දිනය : ............................................................

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

14. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

1. ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්,
2. නිලධාරියා/ නිලධාරිනිය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත්, සහතික කරමි.

..................................................................,

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

සහ නිල මුද්‍රාව.

07 - 139

**ආරක්ෂක අමාත්‍යාංශය**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාලගුණ විද්‍යා නිරීක්ෂක / සන්නිවේදක (පුහුණු ශ්‍රේණිය) තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2026**

1.0 කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙහි, පුරප්පාඩුව පවත්නා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාලගුණ විද්‍යා නිරීක්ෂක /සන්නිවේදක තනතුරු පුරප්පාඩු සඳහා පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගැනීමට පැවැත්වෙන සීමිත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ සේවකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් 2026 ඔක්තෝබර් මස කොළඹ දී පැවැත්වේ.

1.1 තනතුරු නාමය : කාලගුණ විද්‍යා නිරීක්ෂක/ සන්නිවේදක

1.2 තනතුරෙහි රාජකාරි ස්වභාවය

- කාලගුණ විද්‍යාත්මක දත්ත රැස් කිරීම
- කාලගුණ විද්‍යා උපකරණ නඩත්තු කිරීම
- කාලගුණ විද්‍යා දත්ත බාහිර ආයතනයන්ට සැපයීම
- කාලගුණ විද්‍යා දත්ත වෙබ් පිටුවට ඇතුළත් කිරීම
- විශේෂ කාලගුණික දත්ත පිළිබඳ අවධානයෙන් සිටීම සහ ඒවා වාර්තා කිරීම

2.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්, ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාලගුණ විද්‍යා නිරීක්ෂක/ සන්නිවේදක ලෙස වසර 02ක පුහුණු කාලයක් සඳහා බඳවා ගනු ලැබේ. එම පුහුණුව අවසානයේ පෙනී සිටිය යුතු යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වන නිලධාරීන් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාලගුණ විද්‍යා නිරීක්ෂක/ සන්නිවේදක III ශ්‍රේණියට පත් කරනු ලැබේ. එම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වසර 3ක පරිවාස කාලයකට යටත් වේ.

i. මෙම විභාගය මගින් බඳවා ගැනීම සිදු කරනුයේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙහි ශ්‍රී ලංකා තාක්ෂණ සේවයෙහි කාලගුණ විද්‍යා නිරීක්ෂක /සන්නිවේදක (පුහුණු ) තනතුර සඳහා වේ.

ii. ලිඛිත විභාගය - මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ:

I. ගණිතය පිළිබඳ මූලික දැනීමේ ප්‍රශ්න පත්‍රය

II. තනතුරට අදාළව මූලික දැනීමේ ප්‍රශ්න පත්‍රය.

3.0 පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මකවන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. පත් කරනු ලබන මුළු පුරප්පාඩු සංඛ්‍යාව සඳහා හෝ පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබා ගත් අපේක්ෂකයන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවන අවස්ථාවක දී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳව කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 92 වැනි වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ.

I. මුළු පුරප්පාඩු සංඛ්‍යාවෙන් පුරප්පාඩු 19ක් සීමිත තරග විභාගයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන්ගෙන් තෝරාගනු ලබන අතර සීමිත තරග විභාගයෙන් බඳවා ගැනීමට මූලික සුදුසුකම් සහිත අභ්‍යන්තර අයදුම්කරුවන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව තුළ නොසිටී නම් පමණක් ඉතිරි ප්‍රමාණය විවෘත තරග විභාගය මගින්ම තෝරා ගන්නා බාහිර අයදුම්කරුවන්ගෙන් සම්පූර්ණ කර ගනු ඇත.

4.0 වැටුප පහත පරිදි ගෙවනු ලැබේ.

4.1 සීමිත ධාරාව යටතේ පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුළත් කරගනු ලබන නිලධාරින්, පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුල්වීමට පෙර දැරූ වැටුප් පරිමාණයේම තවදුරටත් රැඳී සිටිය යුතු අතර, පුහුණු පාඨමාලාව ආරම්භයේ සිට දෙපාර්තමේන්තුව විසින් පවත්වන පුහුණු ශ්‍රේණියට අදාළ අවසන් විභාගය සමත්වනතුරු ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ ආරම්භක වැටුප් වර්ධකයට සමාන වාර්ෂික දීමනාවක් වැටුපට අමතරව ගෙවනු ලැබේ.

4.2 පුහුණු ශ්‍රේණියේ පළමු වසර සතුටුදායක ලෙස ගත කරන නිලධාරියකු දෙවන වසරේදී තමන් මෙතෙක් සිටි වැටුප් පරිමාණයේම ඊළඟ වැටුප් පියවරේ පිහිටුවනු ලබන අතර, 4.1 හි දක්වා ඇති දීමනාව දෙවන වසරට ද හිමි වේ.

4.3 2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාලගුණ විද්‍යා නිරීක්ෂක/ සන්නිවේදක III, II, හා I ශ්‍රේණිවලට අදාළ

වැටුප් පරිමාණය රු. 52,250 - 10X800 - 11X1,190 -10X1,320 - 10X1,350 - රු.100,040/- (MN 3 – 2025) වේ.

4.4 පුහුණුව සතුටුදායක ලෙස සම්පූර්ණ කොට විභාගය සමත් වීමෙන් පසු ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියට පත්වූ පසුව, 2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව අදාළ වැටුප් තලයේ පිහිටුවීම සඳහා වැටුප් පරිවර්තනයන් සිදුකරනු ලැබේ. ඒ අනුව අදාළවන වැටුප් තලයේ පිහිටුවා වැටුප් ගෙවීමට කටයුතු කරනු ලැබේ.

5.0 සේවයෙහි නියුක්ත කරවීමේ පොදු නියමයන් හා කොන්දේසි:-

5.1 පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

5.2 රාජ්‍ය සේවයේ පත්වීම පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1930/12 සහ 2015.09.01 දින දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති, මින් මතු පනවනු ලබන හෝ සංශෝධනවලට ද ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධානවලට ද අංක 2310/29 සහ 2022.12.14 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයකු වසර 02ක පුහුණු කාලසීමාවක් සම්පූර්ණ කළ යුතු වේ.

5.3 තෝරාගනු ලැබූ අයදුම්කරුවන් දිවයිනේ කවර පෙදෙසක වුව ද සේවය කළ යුතු වේ.

5.4 රාජකාරි වේලාවන් සැමවිටම සාමාන්‍ය කාර්යාල වේලාවන් නොවන අතර, දිවා රාත්‍රී දෙකෙහිම සහ සෙනසුරාදා සහ ඉරිදා සහ රජයේ නිවාඩු දිනයන්හී ද යෙදෙනු ඇත. කෘත්‍ය ලේඛන අනුව ද රාජකාරි කිරීමට සිදුවේ.

5.5 දෙවසරක පුහුණුව පූර්ණ වශයෙන් සම්පූර්ණ කරන බවට ද දෙවසරක පුහුණුවෙන් පසු වසර 05ක් දෙපාර්තමේන්තුවේ සේවය කරන බවට ද දෙපාර්තමේන්තුව සමඟ ගිවිසුමකට එළඹිය යුතු අතර, ඔහු/ඇය පුහුණුව ආරම්භක දිනයෙන් පසු පුහුණුව හැර ගියහොත් හෝ ගිවිසුම්ගත කාලය දෙපාර්තමේන්තුවේ සේවය කිරීමට අපොහොසත් වුවහොත් පුහුණුව සඳහා රජයට වැයවූ මුදල ද රු. 250,000/- ක වලංගු මුදලක් ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ගෙවන බවට ද දෙපාර්තමේන්තුව විසින් පිළිගන්නා වූ ඇපකරුවන් දෙදෙනකුගේ සහතිකවීම සහිතව බැඳුම්කරයක් පුහුණුව ආරම්භ කිරීමට පෙර ලියා අත්සන් කළ යුතු වේ.

5.6 රාජ්‍ය භාෂාව නොවන භාෂා මාධ්‍යයකින් බඳවාගත් නිලධාරියකු පරිවාස කාලය තුළදී රාජ්‍ය භාෂා පරීක්ෂණයෙන් සමත් විය යුතුය. නියමිත කාලය තුළ මෙම පරීක්ෂණයෙන් සමත්වීමට අපොහොසත් වීම ඊළඟ වැටුප් වර්ධක විලම්භනය වීමට හේතු වේ.

5.7 ස්ථිර පත්වීමේ දින සිට වසර 03ක් ඇතුළත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතු අතර, එම ප්‍රවීණතාව ලබා ගැනීමට අපොහොසත් වුවහොත් එම ප්‍රවීණතාව ලබා ගන්නාතුරු වැටුප් වර්ධක නතර කෙරේ.

6.0 සුදුසුකම් :- ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාලගුණ විද්‍යා නිරීක්ෂක / සන්නිවේදක පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ :

6.1 අධ්‍යාපන සුදුසුකම්;

(අ) භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය සහ විද්‍යාව යන විෂයයනට සම්මාන සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය විෂයයන් 06 ක් සහිතව සමත්වීම.

6.2. පළපුරුද්ද;

(අ) ප්‍රාථමික ශිල්පීය නොවන හෝ ඉන් ඉහළ සේවා ගණයක අදාළ ක්ෂේත්‍රයේ ස්ථිර දෙපාර්තමේන්තුගත තනතුරක අවම වශයෙන් වසර දහයක (10)ක සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

6.3 කායික/මානසික සුදුසුකම්;

(අ) සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

6.4 වෙනත් :

I. පත්වීම ස්ථිර කර තිබිය යුතු ය.

II. නියමිත දිනට පූර්වාසන්නව රාජ්‍ය සේවයේ ස්ථිර, දෙපාර්තමේන්තුගත තනතුරක යටත් පිරිසෙයින් වසර පහක (05)සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර, ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතිකකර තිබිය යුතු ය.

III. සේවයට බඳවා ගැනීම සඳහා වන ලිඛිත පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇති ලෙසට පිළිගනු ලබන්නේ නිලධාරියා සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

7.0 විභාග පටිපාටිය :-

7.1 මෙම විභාගය කොළඹ නගරයේ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී පමණක් පැවැත්වෙන අතර, එය සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. අයදුම්කරුවකු තමාට අදාළ එක් මාධ්‍යයක් තෝරා ගත යුතු අතර, විභාගයට නියමිත සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එම මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතුය. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ.

| *විෂයය* | *ලැබිය හැකි මුළු ලකුණු ප්‍රමාණය* | *සමත් වීම සඳහා ලැබිය යුතු අවම ලකුණු ප්‍රතිශතය* | *කාලය* |
|---|---|---|---|
| ගණිතය පිළිබඳ මූලික දැනීමේ ප්‍රශ්න පත්‍රය | 100 | 40% | පැය 02 |
| තනතුරට අදාළව මූලික දැනීමේ ප්‍රශ්න පත්‍රය | 100 | 40% | පැය 02 |

7.2 විෂය නිර්දේශය:-

I. ගණිතය පිළිබඳ මූලික දැනීමේ ප්‍රශ්න පත්‍රය :-

වීජ ගණිතය, ජ්‍යාමිතිය, ත්‍රිකෝණමිතිය පිළිබඳ අ.පො.ස. (සා.පෙළ) මට්ටමේ

I කොටස - බහුවරණ ප්‍රශ්න 40කි. (ලකුණු 2.5 x40=100)

II කොටස - රචනාමය පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වන අතර ප්‍රශ්න 07 ක් තුළින් ප්‍රශ්න 05කට පිළිතුරු සැපයිය යුතු වේ.

(ලකුණු 20 x 5 = 100)

II. තනතුරට අදාළව මූලික දැනීමේ ප්‍රශ්න පත්‍රය:-
රචනාමය පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න පත්‍රයකි. ලබාදෙනු ලබන ප්‍රශ්න 07කින් ප්‍රශ්න 05කට පිළිතුරු සැපයිය යුතු වේ. (ලකුණු 20 X 5 = 100)

7.3 විභාග ප්‍රතිඵල :-

ලිඛිත පරීක්ෂණයෙන් සමත්ව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලැබූ අපේක්ෂකයන්ගේ ලිඛිත විභාග ලකුණු ප්‍රමුඛතාව මත පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් ඇතුළත්කර සකස් කරන ලද ප්‍රතිඵල ලේඛනය විභාග කොමසාරිස් ජනරාල් විසින් කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලබාදෙනු ලැබේ. ඉන් පසු කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල්ගේ එකඟතාව ලද පසු, සියලුම අපේක්ෂකයන්ගේ ප්‍රතිඵල විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග දෙපාර්තමේන්තුවේ www.results.exams.gov.lk වෙබ් අඩවියේ පළ කිරීමෙන් හෝ තැපැල් මගින් හෝ දැනුම් දෙනු ඇත. **විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණය අවසන් තීරණය වේ.**

8.0 තේරීම් පරිපාටිය :-

8.1 විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන්

අතරින්, පිරවීමට අපේක්ෂිත පුරප්පාඩු ගණනට සමාන අයදුම්කරුවන් ගණන ප්‍රතිඵලවල කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගනු ලැබේ.

8.2 සුදුසුකම් සනාථකර ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබාදෙනු නොලැබේ.

9.0 බඳවා ගැනීම : -

9.1 පුහුණු කිරීමේ ශ්‍රේණියට තෝරාගනු ලබන්නන් දෙවසරක පුහුණුව අවසානයේ පැවැත්වෙන පරීක්ෂණය සමත් වූ පසු ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියට පත් කෙරේ. එම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වසර 1ක පරිවාස කාලයකට යටත් වේ.

10.0 ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් :

මෙම විභාගය සඳහා ඉදිරිපත්වීම සඳහා කිසියම් අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් හෝ ඉදිරිපත්කර ඇති කිසියම් තොරතුරක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත්කර ඇති බව හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින් වසන්කර ඇති බව පෙනී ගියහොත් විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයට පසුව ඔහු/ඇය ගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ද සේවයට බඳවාගත් පසුව ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමට ද ඉඩ ඇත.

11.0 අයදුම්පත් යොමු කිරීම:-

විභාග ගාස්තුව රු. 600/- කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන ගාස්තු ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය.

(i) ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
(ii) අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transactions)
(iii) ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය/ Flex යෙදවුම මගින් (Online Banking Method/ Flex App of Bank of Ceylon)
(iv) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon)

*සටහන:-*

(අ) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදුකරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

11.1 මේ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Application – Recruitment Exams" ඔස්සේ පළකර ඇති අතර, අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (Online) ක්‍රමයට පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2026 ජූලි මස 13 දින පෙ.ව. 9.00 ට විවෘත වන අතර, 2026 අගෝස්තු මස 13 දින ප.ව. 9.00 ට අවසන් වේ.**

- ❖ නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.
- ❖ අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්වයක් අයදුම්කරු විසින් විඳ දරා ගත යුතු ය.

11.2 පෙනී සිටින භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අවසර නොදෙන හෙයින් අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කළ යුතු ය.

11.3 තෝරා ගන්නා අයදුම්කරුවන් වෙත පත්වීම් නිකුත් කරනු ලබන්නේ අයදුම්පතේ සඳහන් කරනු ලබන මුලකුරු සමඟ නමට පමණක් වන බැවින් නම නිවැරදිව සඳහන් කළ යුතු ය.

11.4 මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය.

11.5 මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/නොගන්නා ලද බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් නිවැරදිව පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

12.0 විභාග ප්‍රවේශ පත්‍ර:

*ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මගින් /අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතු ය. විභාග ශාලාවේ දී / සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

13.0 විභාගයට පෙනී සිටීම :-

13.1 මෙම විභාගය 2026 ඔක්තෝබර් මස කොළඹදී විභාග දෙපාර්තමේන්තුව විසින් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පවත්වනු ලැබේ.

13.2 විභාග අපේක්ෂකයන් විභාගයට පෙනී සිටීමට ප්‍රථම ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගත යුතු ය. විභාග මධ්‍යස්ථානයේ දී විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු අතර, එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඔබට අවසර නොලැබෙනු ඇත. තව ද අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග මධ්‍යස්ථානයේදී විභාගයට පෙනී සිටිය යුතු ය.

13.3 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට විභාග අපේක්ෂකයා/ අපේක්ෂිකාව යටත් විය යුතු ය.

14.0 අපේක්ෂකයන්ගේ අනන්‍යතාව :

❖ විභාග අපේක්ෂක /අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ :-

(I) ජාතික හැඳුනුම්පත;
(II) වලංගු විදේශ ගමන් බලපත්‍රය;
(III) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන්ගේ අනන්‍යතාව සනාථ කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට

ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

15.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

16.0 සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ඒ.එල්.කේ.විජේමාන්නගේ,
අධ්‍යක්ෂ ජනරාල්,
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව.

2026 ජුලි මස 06 වැනි දින,
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

07 - 195/2

---

**ආරක්ෂක අමාත්‍යාංශය**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාලගුණ විද්‍යා නිරීක්ෂක / සන්නිවේදක (පුහුණු ශ්‍රේණිය) තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026**

1. ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාලගුණ විද්‍යා නිරීක්ෂක / සන්නිවේදක තනතුරු පුරප්පාඩු සඳහා පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා පැවැත්වෙන විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් 2026 ඔක්තෝබර් මස කොළඹ දී පැවැත්වේ.

2. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්, ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාලගුණ විද්‍යා නිරීක්ෂක/ සන්නිවේදක ලෙස වසර 02 ක පුහුණු කාලයක් සඳහා බඳවා ගනු ලැබේ. එම පුහුණුව අවසානයේ පෙනී සිටිය යුතු යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වන නිලධාරීන් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාලගුණ විද්‍යා නිරීක්ෂක/ සන්නිවේදක III ශ්‍රේණියට පත්කරනු ලැබේ. එම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වසර 3ක පරිවාස කාලයකට යටත් වේ.

I. මෙම විභාගය මඟින් බඳවා ගැනීම සිදු කරනුයේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙහි ශ්‍රී ලංකා තාක්ෂණ සේවයෙහි කාලගුණ විද්‍යා නිරීක්ෂක/සන්නිවේදක (පුහුණු) තනතුර සඳහා වේ.

II. *ලිඛිත විභාගය* :- මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ :

(i) බුද්ධි පරීක්ෂණය;
(ii) විෂයානුබද්ධ තාක්ෂණික ප්‍රශ්න පත්‍රය.

3. පත්කරනු ලබන මුළු පුරප්පාඩු සංඛ්‍යාව සඳහා හෝ පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබාගත් අපේක්ෂකයන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවන අවස්ථාවකදී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳව කාර්යපටිපාටික රීති සංග්‍රහයේ 92 වැනි වගන්තිය ප්‍රකාරව, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ. පත්වීම ක්‍රියාත්මක වන දිනය කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ලැබේ.

3.1 මුළු පුරප්පාඩු සංඛ්‍යාවෙන් පුරප්පාඩු 47ක් විවෘත තරග විභාගයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන්ගෙන් තෝරාගනු ලබන අතර සීමිත තරග විභාගයෙන් බඳවා ගැනීමට සුදුසුකම් සහිත අභ්‍යන්තර අයදුම්කරුවන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව තුළ නොසිටී නම් පමණක් ඉතිරි ප්‍රමාණය විවෘත තරග විභාගය තුළින් තෝරාගන්නා බාහිර අයදුම්කරුවන්ගෙන් සම්පූර්ණ කරගනු ඇත.

4. සේවයෙහි නියුක්ත කරවීමේ පොදු නියමන් හා කොන්දේසි:

4.1 පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

4.2. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1930/12 සහ 2015.09.01 දින දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද

ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති, මින් මතු පනවනු ලබන හෝ සංශෝධනවලට ද ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධානවලට ද, අංක 2310/29 සහ 2022.12.14 වැනි දින දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද යටත් විය යුතුය.

4.3. මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තව ද පුහුණු කාලය අවසානයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාලගුණ විද්‍යා නිරීක්ෂක / සන්නිවේදක III ශ්‍රේණියේ තනතුරට පත්වීමෙන් පසු ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට /වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය විසින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

4.4. තෝරා ගනු ලැබූ අයදුම්කරුවන් දිවයිනේ කවර පෙදෙසක වුව ද සේවය කළ යුතු වේ. රාජකාරි වේලාවන් සෑම විටම සාමාන්‍ය කාර්යාල වේලාවන් නොවන අතර, දිවා රාත්‍රී දෙකෙහිම සහ සෙනසුරාදා, ඉරිදා සහ රජයේ නිවාඩු දිනයන්හී ද යෙදෙනු ඇත. කෘත්‍ය ලේඛන අනුව ද රාජකාරි කිරීමට සිදුවේ.

4.5 දෙවසරක පුහුණුව පූර්ණ වශයෙන් සම්පූර්ණ කරන බවට ද, දෙවසරක පුහුණුවෙන් පසු වසර 05ක් දෙපාර්තමේන්තුවේ සේවය කරන බවට ද, දෙපාර්තමේන්තුව සමග ගිවිසුමකට එළඹිය යුතු අතර, ඔහු / ඇය පුහුණුව ආරම්භක දිනයෙන් පසු පුහුණුව හැර ගියහොත් ගිවිසුම්ගත කාලය දෙපාර්තමේන්තුවේ සේවය කිරීමට අපොහොසත් වුවහොත් පුහුණුව සඳහා රජයට වැයවූ මුදල ද, රු.250,000/-ක වලංගු මුදලක් ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ගෙවන බවට ද, දෙපාර්තමේන්තුව විසින් පිළිගන්නා වූ ඇපකරුවන් දෙදෙනකුගේ සහතික වීම සහිතව ඇප බැඳුම්කරයක් පුහුණුව ආරම්භ කිරීමට පෙර ලියා අත්සන් කළ යුතු ය.

4.6 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 ට අනුව හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතු ය.

4.7 සන්ධාන භාෂාව වන ඉංග්‍රීසි භාෂාව පිළිබඳ අ.පො.ස. (සා.පෙළ) සම්මාන මට්ටමේ ප්‍රවීණතාවක් තනතුරෙහි III ශ්‍රේණියේ වසර 05ක් ඉක්මවීමට පෙර ලබා ගත යුතු ය.

4.8 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේදී භාර ගැනීමට අපොහොසත් වන හා /හෝ පත් කරන ලද තනතුරක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කිරීමට කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල් වරයාට බලය ඇත.

5. මාසික වැටුප් පරිමාණය :

5.1 වර්ෂ 02ක පුහුණු කාලය තුළ පුහුණු වන ශ්‍රේණියේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාලගුණ විද්‍යා නිරීක්ෂක / සන්නිවේදක තනතුර සඳහා 2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන VI අනුව මාසික දීමනාව පහත පරිදි ගෙවනු ලැබේ.

| *තනතුර* | *මාසික දීමනාව* | |
|---|---|---|
| | ***2026.01.01*** *දින සිට (රු.)* | ***2027.01.01*** *දින සිට (රු.)* |
| **තාක්ෂණ සේවයේ 1 වසර** | 43,274/ | 45,230/ |
| **2 වසර** | 43,730/ | 45,770/ |

5.2 2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාලගුණ විද්‍යා නිරීක්ෂක /සන්නිවේදක III, II, හා I ශ්‍රේණිවලට අදාළ වැටුප් පරිමාණය රු.52,250- 10 x 800-11 x 1,190-10 x 1,320- රු.100,040/-(MN 3-2025) වන අතර, ස්ථිර තනතුරට පත්කිරීමේදී ඉහත වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් පියවර හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2020 හි උපලේඛන III අනුව වැටුප් ගෙවනු ලැබේ.

6. බඳවා ගැනීමේ සුදුසුකම් :

(අ) (i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම;

(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය;

(iii) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික තත්ත්වයකින් යුක්ත වීම; (බඳවා ගැනීමෙන් පසු පවත්වන වෛද්‍ය පරීක්ෂණයේ දී යෝග්‍ය බව තහවුරු නොවුවහොත් තනතුරට නුසුදුසු සේ සලකනු ලැබේ);

(iv) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

(ආ) අධ්‍යාපන සුදුසුකම්/වෘත්තීය සුදුසුකම්/පළපුරුද්ද:

I. සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමර්ථ්‍යයන් සහිතව එකවර විෂයයන් (06) කින් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

*සහ*

II. විෂයයන් 03කින් අ.පො.ස. (උසස් පෙළ) විභාගය එකවර සමත්ව තිබීම.

විෂයය සංයුතිය පහත එක් ආකාරයකට විය යුතු ය:-

(1) භෞතික විද්‍යාව, ශුද්ධ ගණිතය සහ ව්‍යවහාරික ගණිතය;

(2) භෞතික විද්‍යාව සමග -

(i) ශුද්ධ ගණිතය/ව්‍යවහාරික ගණිතය/සංයුක්ත ගණිතය යන විෂයයන්ගෙන් එකක්;

*සහ*

(ii) රසායන විද්‍යාව / කෘෂි විද්‍යාව / තොරතුරු තාක්ෂණය /පරිගණක විද්‍යාව යන විෂයයන්ගෙන් එකක්.

(ඇ) වයස :

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවම වයස අවුරුදු 18 වන අතර, උපරිම වයස අවුරුදු 30 වේ. (ඒ අනුව 2008.08.13 දිනට හෝ ඊට පෙර හා 1996.08.13 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

(ඈ) සුදුසුකම් පිළිබඳ සීමාවන් :

මෙම විභාගය සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

7. විභාග ගාස්තු:

විභාග ගාස්තුව රු. 600/ කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය :-

(i) ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card);

(ii) අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transactions);

(iii) ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය/ Flex යෙදවුම මගින් (Online Banking Method/ Flex App of Bank of Ceylon);

(iv) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon).

*සටහන*:-

(අ) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර, විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

8. ඉල්ලුම් කිරීමේ ක්‍රමය:

8.1 මේ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications – Recruitment Exams" ඔස්සේ පළ කර ඇති අතර, අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (Online) ක්‍රමයට පමණි. **මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2026 ජූලි මස 13 දින පෙ.ව. 9.00 ට විවෘත වන අතර, 2026 අගෝස්තු මස 13 දින ප.ව. 9.00 ට අවසන් වේ.**

8.2. අයදුම්පත් යොමු කිරීමේදී අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇතිවන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳදරා ගත යුතු ය.

8.3. මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව

විසින් භාර ගන්නා ලද බව /භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (Email) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් නිවැරදිව පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8.4. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මඟින්/ අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ මුද්‍රිත පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කරගත යුතුය. විභාග ශාලාවේ දී / සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

8.5. විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. කිසියම් රාජ්‍ය ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද මාණ්ඩලික නිලධාරියකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන කොට්ඨාසයේ ග්‍රාමනිලධාරි, රජයේ පාසලක ප්‍රධානියකු, සාමදාන විනිශ්චකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජා ස්ථානයක් භාර හෝ පූජා පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු ලවා සහතික කරවා ගත යුතු ය.

8.6. දැනට රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

9. විභාගයට ඇතුළු වීම:

(අ) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයකුම විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගෙන පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපතිවරයා වෙත භාර දිය යුතුය. එසේ ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට ඉදිරිපත් වීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රය* ආරම්භයේ පළ කර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝණය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට/ඇයට සිදු වනු ඇත. **විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.**

(ආ) අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

10. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව:

විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාවේදී තමා පෙනී සිටින සෑම විෂයයක් සඳහාම විභාග ශාලාධිපතිවරයා සෑහීමකට පත් වන අයුරින් ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත ලේඛණ පමණක් වලංගු වේ.

(i) ජාතික හැඳුනුම්පත;
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය;
(iii) වලංගු ශ්‍රී ලාංකික රියැදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා

විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර ගනු නොලැබේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

11. සාවද්‍ය තොරතුරු සැපයීම සඳහා දඬුවම:

අයදුම්පත පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍යව තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත් එසේ නැති නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය ගේ පත්වීම අහෝසි කිරීමට කටයුතු කෙරේ.

12. විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය:

(අ) විභාගය සිංහල, දෙමළ මාධ්‍යවලින් පවත්වනු ලැබේ.
(ආ) තම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් විභාග භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයකුට ඉඩ දෙනු නොලැබේ.

13. බඳවා ගැනීමේ ක්‍රමය;

I. ලිඛිත විභාගය :-

මෙම දැන්වීමේ 02 ඡේදය (ii) කරුණේ සඳහන් විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර 02කින් ලිඛිත විභාගයක් පැවැත්වේ. එක් එක් විෂයයෙන් සමත් වීම සඳහා අවම වශයෙන් ලකුණු 40% බැගින් ලබාගත යුතුය. අපේක්ෂකයන් විසින් සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතු වේ.

විෂයයන් : 01. බුද්ධි පරීක්ෂණය
02. විෂයානුබද්ධ තාක්ෂණික ප්‍රශ්න පත්‍රය

ලිඛිත පරීක්ෂණයේ විෂය නිර්දේශය;

| *විෂය අංකය* | *විෂයය* | *නියමිත කාලය* | *ලකුණු* | *සමත් ලකුණු ප්‍රමාණය (අවම)* |
|---|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| 02 | විෂයානුබද්ධ තාක්ෂණික ප්‍රශ්න පත්‍රය | පැය 02 | 100 | 40% |

(අ) බුද්ධි පරීක්ෂණය;

මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවත්, විශ්ලේෂණ තත්ත්වයත්, තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වන බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් යුක්ත වන අතර, ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

(ආ) විෂයානුබද්ධ තාක්ෂණික ප්‍රශ්න පත්‍රය;

භෞතික විද්‍යාව සහ ඉලෙක්ට්‍රොනික විද්‍යාව විෂයයන්ට අදාළව අ.පො.ස. (උ.පෙළ) විභාග මට්ටම හා ඒ දක්වා වූ යාන්ත්‍රණ විද්‍යාව, ඒකක හා මාන, පදාර්ථයේ ගුණ, කම්පන හා තරංග, තාපය සහ විද්‍යුතය, විද්‍යුත් මූලධර්ම, අර්ධ සන්නායක, ඩිජිටල් තාක්ෂණය, විවිධ සන්නිවේදන සහ දත්ත හුවමාරු ක්‍රම පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම විනිශ්චය කිරීම සඳහා වන ප්‍රශ්නවලින් යුක්ත ය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

02. සම්මුඛ පරීක්ෂණය -

(අ) ලිඛිත පරීක්ෂණයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිට, සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම ලකුණු 40% නොඅඩුව ලබා ගත් අයදුම්කරුවන් අතරින් ප්‍රමුඛතාව අනුව ඉහළම ලකුණු ලබා ගත්, පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අයදුම්කරුවන් පිරිසක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබයි.

(ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් අපේක්ෂක අපේක්ෂිකාවන්ගේ මූලික සුදුසුකම් හා සහතික පත්‍ර පරීක්ෂා කරනු ලබයි. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා නොදේ.

***සැලකිය යුතුයි :-*** සම්මුඛ පරීක්ෂණයට සහභාගි වීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් ලෙස සලකනු නොලැබේ.

14. පත්වීම් බලධරයා විසින් ප්‍රතිඵල නිකුත් කිරීමට සුදුසු දිනය දන්වා එවූ පසු ලිඛිත විභාගයෙන් එක් එක් විෂයයට ලබා ගත් ලකුණු / මුළු ලකුණු සඳහන් කළ ප්‍රතිඵල සටහනක් විභාගයට ඉදිරිපත් වූ සියලුම අයදුම්කරුවන් වෙත තැපැල් මඟින් යැවීමට හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය හරහා ප්‍රතිඵල නිකුත් කිරීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පියවර ගනු ඇත.

15. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින්

තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

16. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් පවතී නම්, එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**ඒ.එල්.කේ.විජේමාන්නගේ,**
අධ්‍යක්ෂ ජනරාල්,
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව.

2026 ජූලි මස 06 වැනි දින,
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

07 - 195/1

---

**ආරක්ෂක අමාත්‍යාංශය**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විදුලි සංදේශ හා රේඩාර් කාර්මික නිලධාරි**

(III ශ්‍රේණිය / පුහුණු ශ්‍රේණිය ) තනතුරට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2026

01. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙහි, පුරප්පාඩුව පවත්නා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයෙහි විදුලි සංදේශ හා රේඩාර් කාර්මික නිලධාරි (III ශ්‍රේණිය / **පුහුණු ශ්‍රේණිය**) තනතුරට බඳවා ගැනීම සඳහා පැවැත්වෙන **සීමිත** තරග විභාගය සඳහා සුදුසුකම් ලත් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

    i. මෙම විභාගය මඟින් බඳවා ගැනීම සිදු කරනුයේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙහි ශ්‍රී ලංකා තාක්ෂණ සේවයෙහි III ශ්‍රේණියේ/ පුහුණු ශ්‍රේණිය විදුලි සංදේශ හා රේඩාර් කාර්මික නිලධාරී තනතුර සඳහා වේ.

    ii. ලිඛිත විභාගය - මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ.

        i. බුද්ධි පරීක්ෂණය
        ii. විෂයානුබද්ධ තාක්ෂණික ප්‍රශ්න පත්‍රය

02. විභාග දිනය සහ විභාගය පැවැත්වීම :
මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් 2026 ඔක්තෝබර් මස කොළඹදී පවත්වනු ඇත.

03. පත් කරනු ලබන මුළු පුරප්පාඩු සංඛ්‍යාව 02 කි. අවසාන පුරප්පාඩුව සඳහා හෝ පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබාගත් අපේක්ෂකයන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවකදී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳව කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 92 වැනි වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ. පත්වීම ක්‍රියාත්මක වන දිනය කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබේ.

i. සීමිත තරග විභාගයෙන් බඳවා ගැනීමට නියමිත ප්‍රතිශතය සඳහා ප්‍රමාණවත් මූලික සුදුසුකම් සහිත අභ්‍යන්තර අයදුම්කරුවන් දෙපාර්තමේන්තුව තුළ නොසිටී නම් පමණක් ඉතිරි ප්‍රමාණය විවෘත තරග විභාගය මගින් තෝරා ගන්නා බාහිර අයදුම්කරුවන්ගෙන්ම සම්පූර්ණ කෙරේ.

04. සේවා කොන්දේසි :

4.1. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසිවලට ද අංක 2310/29 සහ 2022.12.14 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, 2015.09.01 දිනැති ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව හා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සේවාවේ තනතුරුවලට අයත් බඳවා ගැනීම් පටිපාටියේ නියමයන්ට හා කොන්දේසිවලට ද, එම පටිපාටියට කර ඇති හෝ මින් මතුවට කෙරෙන්නා වූ සංශෝධනවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයකු තනතුරෙහි III ශ්‍රේණිය සඳහා පත් කරනු ඇත.

4.2. මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තව ද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය විසින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

4.3. තනතුරට ස්ථිරව පත්වීමෙන් අනතුරුව පත්වීම් දින සිට අවුරුදු 01 ක පරිවාස කාලයකට/වැඩ බැලීමේ කාලයකට යටත් ය. විදුලි සංදේශ හා රේඩාර් කාර්මික නිලධාරී තනතුරට බඳවාගෙන වසර 03ක් ඇතුළත පළමු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

4.4. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 ට අනුව හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතු ය.

4.5. තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේදී භාර ගැනීමට අපොහොසත් වන හා /හෝ පත් කරන ලද තනතුරක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කිරීමට කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය ඇත.

05. මාසික වැටුප් පරිමාණය :

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි MN-3 වැටුප් බණ්ඩය අදාළ වේ. එම වැටුප් බණ්ඩයට අදාළ වැටුප් පරිමාණය පහත පරිදි වේ.
රු.52,250 – 10x800 – 11x1,190 – 10x1,320 - 10x1,350 රු. 100,040/-
(2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි රු.52,250.00 ට අනුරූපී ආරම්භක පියවරේ තබා වැටුප් ගෙවනු ලැබේ.)

06. බඳවා ගැනීමේ සුදුසුකම් :

6.1. පුහුණු කිරීමේ ශ්‍රේණිය සඳහා (එක් වසරක පුහුණුව)

(අ) (i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම;
(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය;
(iii) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත වීම.

(ආ) අධ්‍යාපන සුදුසුකම්/වෘත්තීය සුදුසුකම් :

i. භාෂාව හෝ සාහිත්‍යය, විද්‍යාව සහ ගණිතය යන විෂයයන්ට සම්මාන සාමර්ථ්‍ය සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් (06) කින් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

*සහ*

ii. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක පාඨමාලාවක් සාර්ථකව හදාරා ජාතික තාක්ෂණ සහතිකය ලබා තිබීම;

*හෝ*

iii. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක සැලසුම් ශිල්පය පිළිබඳ එක් අවුරුදු පූර්ණ කාලීන පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම;

*හෝ*

iv. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක කර්මාන්ත තාක්ෂණිකයන් සඳහා වූ ජාතික සහතික පත්‍ර පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම;

*හෝ*

v. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණ සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

(ඇ) පළපුරුද්ද :

i. ප්‍රාථමික ශිල්පීය නොවන හෝ ඉන් ඉහළ සේවා ගණයක අදාළ ක්ෂේත්‍රයේ ස්ථිර දෙපාර්තමේන්තුගත තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සක්‍රිය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම;

6.2. III වන ශ්‍රේණිය (ඍජු බඳවා ගැනීම)

(අ) අධ්‍යාපන සුදුසුකම්/වෘත්තීය සුදුසුකම් :

i. භාෂාව හෝ සාහිත්‍යය, විද්‍යාව සහ ගණිතය යන විෂයයන්ට සම්මාන සාමර්ථ්‍ය සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් (06) කින් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

*සහ*

ii. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම;

*හෝ*

iii. මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව;

*හෝ*

iv. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව;

*හෝ*

v. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව;

*හෝ*

vi. විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව;

*හෝ*

vii. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ පළමු වන කොටස සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම;

*හෝ*

viii. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණ සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

(*ආ*) පළපුරුද්ද :

i. ප්‍රාථමික හෝ ඉන් ඉහළ සේවා ශ්‍රේණියක ස්ථිර දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

(*ඇ*) වයස : අදාළ නොවේ.

(*ඈ*) සුදුසුකම් පිළිබඳ සීමාවන් :

i. මෙම විභාගය සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

07. විභාග ගාස්තු :-

විභාග ගාස්තුව රු. 600.00 කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම් සහිත බැංකු හර කාඩ්පතක් මගින් ( Any Bank Debit Card with the Facility of Internet Transactions)
iii. ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය/Flex යෙදවුම (Online Banking Method "Flex" App of Bank of Ceylon)
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon)

*සටහන :-*

(*අ*) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(*ආ*) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර. විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(*ඇ*) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසියම් හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ.

08. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :-

8.1. මේ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ " Our Service" යටතේ ඇති "Online Applications – Recruitment Exams/E.B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (Online) ක්‍රමයට පමණි. **මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2026 ජූලි මස 13 දින පෙ.ව.9.00 ට විවෘත වන අතර, 2026 අගෝස්තු මස 13 දින ප.ව.9.00 ට අවසන් වේ.**

8.2. ඉල්ලුම්කරුවන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාර දිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

8.3. අයදුම්පත් යොමු කිරීමේදී අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇතිවන ඕනෑම අහිතකර තත්වයක් අයදුම්කරු විසින් විඳදරා ගත යුතු ය.

8.4. මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව /භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (Email) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instruction) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් නිවැරදිව පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8.5. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මඟින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මඟින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේදී අයදුම්කරුවන් තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ මුද්‍රිත පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කරගත යුතු ය. විභාග ශාලාවේ දී / සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

8.6. විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් රාජ්‍ය ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද මාණ්ඩලික නිලධාරියකු ලවා ද එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී, රජයේ පාසලක ප්‍රධානියකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු ලවා සහතික කරවා ගත යුතු ය.

09. විභාගයට ඇතුළු වීම :

(අ) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතු ය. සෑම අපේක්ෂකයකුම විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගෙන පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපතිවරයා වෙත භාර දිය යුතු ය. එසේ ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට ඉදිරිපත් වීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රය* ආරම්භයේ පළ කර ඇත. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන

නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට/ඇයට සිදු වනු ඇත. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

(ආ) අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

10. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව :

විභාග අපේක්ෂක අපේක්ෂිකාවන් විභාග ශාලාවේදී තමා පෙනී සිටින සෑම විෂයයක් සඳහාම විභාග ශාලාධිපතිවරයා සෑහීමකට පත් වන අයුරින් ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත ලේඛන පමණක් වලංගු වේ.

i. ජාතික හැඳුනුම්පත;
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
iii. වලංගු ශ්‍රී ලාංකික රියැදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන කිසිවකු විභාග ශාලාවට ඇතුළත් කර ගනු නොලැබේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

11. සාවද්‍ය තොරතුරු සැපයීම සඳහා දඬුවම :

අයදුම්පත පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍යව තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත් එසේ නැති නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය ගේ පත්වීම අහෝසි කිරීමට කටයුතු කෙරේ.

12. විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය :

(අ) විභාගය සිංහල, දෙමළ මාධ්‍යවලින් පවත්වනු ලැබේ.

(ආ) තම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් විභාග භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයකුට ඉඩ දෙනු නොලැබේ.

13. බඳවා ගැනීමේ ක්‍රමය :

I. *ලිඛිත විභාගය* -

මෙම දැන්වීමේ 01 ඡේදය (ii) කරුණේ සඳහන් විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර 02කින් ලිඛිත විභාගයක් පැවැත්වේ. එක් එක් විෂයයෙන් සමත් වීම සඳහා අවම වශයෙන් ලකුණු 40% බැගින් ලබාගත යුතුය. අපේක්ෂකයන් විසින් සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතු වේ.

*විෂයයන් : 01.* ගණිතය පිළිබඳ මූලික දැනීමේ ප්‍රශ්න පත්‍රය,

02. විෂයානුබද්ධ තාක්ෂණික ප්‍රශ්න පත්‍රය.

*ලිඛිත පරීක්ෂණයේ විෂය නිර්දේශය*

| *විෂයය අංකය* | *විෂයය* | *නියමිත කාලය* | *ලකුණු* | *සමත් ලකුණු ප්‍රමාණය (අවම)* |
|---|---|---|---|---|
| 01 | ගණිතය පිළිබඳ මූලික දැනීමේ ප්‍රශ්න පත්‍රය | පැය 02 | 100 | 40% |
| 02 | විෂයානුබද්ධ තාක්ෂණික ප්‍රශ්න පත්‍රය | පැය 02 | 100 | 40% |

(අ) ගණිතය පිළිබඳ මූලික දැනීමේ ප්‍රශ්න පත්‍රය

වීජ ගණිතය, ජ්‍යාමිතිය ත්‍රිකෝණමිතිය පිළිබඳ අ.පො.ස. (සා.පෙළ) මට්ටමේ

I. බහුවරණ ප්‍රශ්න 40 කි. (ලකුණු 2.5 x 40 = 100)
II. රචනාමය පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වන අතර, ප්‍රශ්න 07 ක් තුළින් 05 කට පිළිතුරු සැපයිය යුතු වේ. (ලකුණු 20 x 5 = 100)

(ආ) විෂයානුබද්ධ තාක්ෂණික ප්‍රශ්න පත්‍රය

භෞතික විද්‍යාව සහ ඉලෙක්ට්‍රොනික විද්‍යාව විෂයයන්ට අදාළව අ.පො.ස. (උ.පෙළ) විභාග මට්ටම හා ඒ දක්වා වූ විද්‍යුත් මූලධර්ම, අර්ධ සන්නායක, ඩිජිටල් තාක්ෂණය, විවිධ සන්නිවේදන සහ දත්ත හුවමාරු ක්‍රම පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම විනිශ්චය කිරීම සඳහා වන ප්‍රශ්නවලින් යුක්තය.

02. සම්මුඛ පරීක්ෂණය -

(අ) ලිඛිත පරීක්ෂණයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිට, සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම ලකුණු 40% නොඅඩුව ලබා ගත් අයදුම්කරුවන් අතරින් ප්‍රමුඛතාව අනුව ඉහළම ලකුණු ලබා ගත්, පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අයදුම්කරුවන් පිරිසක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබයි.

(ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් අපේක්ෂක අපේක්ෂිකාවන්ගේ මූලික සුදුසුකම් හා සහතික පත්‍ර පරීක්ෂා කරනු ලබයි. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා නොදේ.

***සැලකිය යුතුයි. :-*** සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් ලෙස සලකනු නොලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

14. ලිඛිත පරීක්ෂණයෙන් සමත්ව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලැබූ අපේක්ෂකයන්ගේ ලිඛිත විභාග ලකුණු ප්‍රමුඛතාව මත පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් ඇතුළත් කර සකස් කරන ලද ප්‍රතිඵල ලේඛනය විභාග කොමසාරිස් ජනරාල් විසින් කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල් වෙත ලබාදෙනු ලැබේ. ඉන් පසු කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල්ගේ එකඟතාව ලද පසු, ප්‍රතිඵල සටහනක් විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගයට ඉදිරිපත් වූ සියලුම අයදුම්කරුවන් වෙත තැපැල් මගින් යැවීමට හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය හරහා ප්‍රතිඵල නිකුත් කිරීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පියවර ගනු ඇත.

15. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

16. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් පවතී නම්, එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කළ යුතු ය.

**ඒ.එල්.කේ.විජේමාන්නගේ,**
අධ්‍යක්ෂ ජනරාල්,
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව.

2026 ජූලි මස 06 වැනි දින,
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

07 - 196/2

**ආරක්ෂක අමාත්‍යාංශය**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විදුලි සංදේශ හා රේඩාර් කාර්මික නිලධාරී (III ශ්‍රේණිය) තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

01. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙහි, පුරප්පාඩුව පවත්නා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයෙහි විදුලි සංදේශ හා රේඩාර් කාර්මික නිලධාරී (III ශ්‍රේණිය) තනතුරට බඳවා ගැනීම සඳහා පැවැත්වෙන විවෘත තරග විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

i. මෙම විභාගය මඟින් බඳවා ගැනීම සිදු කරනුයේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙහි ශ්‍රී ලංකා තාක්ෂණ සේවයෙහි III ශ්‍රේණියේ විදුලි සංදේශ හා රේඩාර් කාර්මික නිලධාරී තනතුර සඳහා වේ.

ii. *ලිඛිත විභාගය* - මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ.

i. බුද්ධි පරීක්ෂණය
ii. විෂයානුබද්ධ තාක්ෂණික ප්‍රශ්න පත්‍රය.

02. විභාග දිනය සහ විභාගය පැවැත්වීම :
මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් **2026 ඔක්තෝබර් මස කොළඹදී** පවත්වනු ඇත.

03. පත් කරනු ලබන මුළු පුරප්පාඩු සංඛ්‍යාව 04 කි. අවසාන පුරප්පාඩුව සඳහා හෝ පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබාගත් අපේක්ෂකයන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවකදී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳව කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 92 වැනි වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ. පත්වීම ක්‍රියාත්මක වන දිනය කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබේ.

i. සීමිත තරග විභාගයෙන් බඳවා ගැනීමට නියමිත ප්‍රතිශතය සඳහා ප්‍රමාණවත් මූලික සුදුසුකම් සහිත අභ්‍යන්තර අයදුම්කරුවන් දෙපාර්තමේන්තුව තුළ නොසිටී නම් පමණක් ඉතිරි ප්‍රමාණය විවෘත තරග විභාගය මඟින් තෝරා ගන්නා බාහිර අයදුම්කරුවන්ගෙන්ම සම්පූර්ණ කෙරේ.

04. සේවා කොන්දේසි :

4.1. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ආයතන සංග්‍රහය හා මුදල්

රෙගුලාසිවලට ද අංක 2310/29 සහ 2022.12.14 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද 2015.09.01 දිනැති ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව හා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සේවාවේ තනතුරුවලට අයත් බඳවා ගැනීම් පටිපාටියේ නියමයන්ට හා කොන්දේසිවලට ද එම පටිපාටියට කර ඇති හෝ මින් මතුවට කෙරෙන්නා වූ සංශෝධනවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයකු තනතුරෙහි III ශ්‍රේණිය සඳහා පත් කරනු ඇත.

4.2. මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තව ද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය විසින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

4.3. මෙම පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්ය. විදුලි සංදේශ හා රේඩාර් කාර්මික නිලධාරී තනතුරට බඳවාගෙන වසර 03 ක් ඇතුළත පළමු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

4.4. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 ට අනුව හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය.

4.5. තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේදී භාර ගැනීමට අපොහොසත් වන /හෝ පත් කරන ලද තනතුරක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කිරීමට කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය ඇත.

**05. මාසික වැටුප් පරිමාණය :**

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි MN-3 වැටුප් ඛණ්ඩය අදාළ වේ. එම වැටුප් ඛණ්ඩයට අදාළ වැටුප් පරිමාණය පහත පරිදි වේ.

රු.52,250 – 10x800 – 11x1,190 – 10x1,1320 - 10x1,350 – රු. 100,040/-

( 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි රු.52,250 අනුරූපී ආරම්භක පියවරේ තබා වැටුප් ගෙවනු ලැබේ.)

06. *බඳවා ගැනීමේ සුදුසුකම්* :

(අ) (i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම.
(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය
(iii) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත වීම

(ආ) අධ්‍යාපන සුදුසුකම්/වෘත්තීය සුදුසුකම්/පළපුරුද්ද

i. සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සාමර්ථ්‍ය සහිතව එකවර විෂයයන් (06) කින් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

*සහ*

ii. විෂයයන් 03කින් අ.පො.ස. (උසස් පෙළ) විභාගය එකවර සමත්ව තිබීම.

විෂයය සංයුතිය පහත එක් ආකාරයකට විය යුතුය.

(1) භෞතික විද්‍යාව, ශුද්ධ ගණිතය සහ ව්‍යවහාරික ගණිතය
(2) භෞතික විද්‍යාව සමඟ
(i) ශුද්ධ ගණිතය/ ව්‍යවහාරික ගණිතය /සංයුක්ත ගණිතය යන විෂයයන්ගෙන් එකක්

*සහ*

(ii) රසායන විද්‍යාව/කෘෂි විද්‍යාව/තොරතුරු තාක්ෂණය/ පරිගණක විද්‍යාව යන විෂයයන්ගෙන් එකක්

*සහ*

iii. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම

*හෝ*

iv. මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව

*හෝ*

v. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව;

*හෝ*

vi. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව;

*හෝ*

vii. විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව;

*හෝ*

viii. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ පළමු වන කොටස සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම;

*හෝ*

ix. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණ සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම

(*ඇ*) වයස :

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවම වයස අවුරුදු 18 වන අතර, උපරිම වයස අවුරුදු 30 වේ.
(ඒ අනුව 2008.08.13 දිනට හෝ ඊට පෙර හා 1996.08.13 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

( *ඇ*) සුදුසුකම් පිළිබඳ සීමාවන් :

i. ආගමික පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකුට අයදුම් කිරීමට හෝ පෙනී සිටීමට අවසර නොමැත.

ii. මෙම විභාගය සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

07. **විභාග ගාස්තු :**

විභාග ගාස්තුව රු.600.00 කි. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මඟින් (Any Bank Credit Card)

ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම් සහිත බැංකු හර කාඩ්පතක් මඟින් ( Any Bank Debit Card with the Facility of Internet Transactions)

iii. ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය/Flex යෙදවුම (Online Banking Method/ “Flex App” of Bank of Ceylon)

iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් (Any Branch of the Bank of Ceylon)

*සටහන* :-

(*අ*) ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(*ආ*) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර. විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(*ඇ*) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසියම් හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ.

08. **ඉල්ලුම් කිරීමේ ක්‍රමය :**

8.1. මේ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ “ Our Services “ යටතේ ඇති “Online Applications – Recruitment Exams/E. B Exams” ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (Online) ක්‍රමයට පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2026 ජුලි මස 13 දින පෙ.ව. 9.00 ට විවෘත වන අතර, 2026 අගෝස්තු මස 13 දින ප.ව.9.00 ට අවසන් වේ.

8.2. දැනට රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ හෝ නියුතු ඉල්ලුම්කරුවන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාර දිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ ආයතන ප්‍රධානියා විසින්

සහතික කරන ලද අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

8.3. අයදුම්පත් යොමු කිරීමේදී අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇතිවන ඕනෑම අහිතකර තත්වයක් අයදුම්කරු විසින් විඳදරා ගත යුතුය.

8.4. මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව /භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (Email) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instruction) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් නිවැරදිව පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8.5. ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මඟින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මඟින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් වෙබ් නිවේදනයේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරුවන් තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වන ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ මුද්‍රිත පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කරගත යුතුය. විභාග ශාලාවේදී / සම්මුඛ පරීක්ෂණයේදී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

8.6. විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් රාජ්‍ය ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද මාණ්ඩලික නිලධාරියකු ලවා ද එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී, රජයේ පාසලක ප්‍රධානියකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක සවාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයකු ලවා සහතික කරවා ගත යුතුය.

09. විභාගයට ඇතුළු වීම :

(අ) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයකුම විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගෙන පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපතිවරයා වෙත භාර දිය යුතුය. එසේ ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට ඉදිරිපත් වීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම ගැසට් පත්‍රය ආරම්භයේ පළ කර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට/ඇයට සිදු වනු ඇත. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

(ආ) අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

10. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව :

විභාග අපේක්ෂක අපේක්ෂිකාවන් විභාග ශාලාවේදී තමා පෙනී සිටින සෑම විෂයයක් සඳහාම විභාග ශාලාධිපතිවරයා සෑහීමකට පත් වන අයුරින් ස්වකීය

අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත ලේඛන පමණක් වලංගු වේ.

i. ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. වලංගු ශ්‍රී ලාංකික රියැදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. ඊට එකඟ නොවන කිසිවකු විභාග ශාලාවට ඇතුළත් කර ගනු නොලැබේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

11. සාවද්‍ය තොරතුරු සැපයීම සඳහා දඬුවම :

අයදුම්පත පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍යාව තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත් එසේ නැති නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය ගේ පත්වීම අහෝසි කිරීමට කටයුතු කෙරේ.

12. විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය :

(අ) විභාගය සිංහල, දෙමළ මාධ්‍යවලින් පවත්වනු ලැබේ.

(ආ) තම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් විභාග භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයකුට ඉඩ දෙනු නොලැබේ.

13. බඳවා ගැනීමේ ක්‍රමය :

I. ලිඛිත විභාගය -
මෙම දැන්වීමේ 01 ඡේදය (ii) කරුණේ සඳහන් විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර 02කින් ලිඛිත විභාගයක් පැවැත්වේ. එක් එක් විෂයයෙන් සමත් වීම සඳහා අවම වශයෙන් ලකුණු 40% බැගින් ලබාගත යුතුය. අපේක්ෂකයන් විසින් සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතු වේ.

විෂයයන් : 01. බුද්ධි පරීක්ෂණය
02. විෂයානුබද්ධ තාක්ෂණික ප්‍රශ්න පත්‍රය

ලිඛිත පරීක්ෂණයේ විෂය නිර්දේශය

| විෂය අංකය | විෂයය | නියමිත කාලය | ලකුණු | සමත් ලකුණු ප්‍රමාණය (අවම) |
|---|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| 02 | විෂයානුබද්ධ තාක්ෂණික ප්‍රශ්න පත්‍රය | පැය 02 | 100 | 40% |

(අ) බුද්ධි පරීක්ෂණය -

මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ විශ්ලේෂණ තත්වයත්, තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වන බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් යුක්ත වන අතර, ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

(ආ) විෂයානුබද්ධ තාක්ෂණික ප්‍රශ්න පත්‍රය

භෞතික විද්‍යාව සහ ඉලෙක්ට්‍රෝනික විද්‍යාව විෂයයන්ට අදාළව අ.පො.ස. (උ.පෙළ) විභාග මට්ටම හා ඒ දක්වා වූ යාන්ත්‍රණ විද්‍යාව, ඒකක හා මාන, පදාර්ථයේ ගුණ, කම්පන හා තරංග, තාපය සහ විද්‍යුතය, විද්‍යුත් මූලධර්ම, අර්ධ සන්නායක, ඩිජිටල් තාක්ෂණය, විවිධ සන්නිවේදන සහ දත්ත හුවමාරු ක්‍රම පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම විනිශ්චය කිරීම සඳහා වන ප්‍රශ්නවලින් යුක්තය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

02. සම්මුඛ පරීක්ෂණය -

(අ) ලිඛිත පරීක්ෂණයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිට, සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම ලකුණු 40% නොඅඩුව ලබා ගත් අයදුම්කරුවන් අතරින් ප්‍රමුඛතාව අනුව ඉහළම ලකුණු ලබා ගත්, පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අයදුම්කරුවන් පිරිසක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබයි.

(ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් අපේක්ෂක අපේක්ෂිකාවන්ගේ මූලික සුදුසුකම් හා සහතික පත්‍ර පරීක්ෂා කරනු ලබයි. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා නොදේ.

*සැලකිය යුතුයි.* :- සම්මුඛ පරීක්ෂණයට සහභාගි වීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් ලෙස සලකනු නොලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

14. ලිඛිත පරීක්ෂණයෙන් සමත්ව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලැබූ අපේක්ෂකයන්ගේ ලිඛිත විභාග ලකුණු ප්‍රමුඛතාව මත පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් ඇතුළත් කර සකස් කරන ලද ප්‍රතිඵල ලේඛනය විභාග කොමසාරිස් ජනරාල් විසින් කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල් වෙත ලබාදෙනු ලැබේ. ඉන් පසු කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල්ගේ එකඟතාව ලද පසු, ප්‍රතිඵල සටහනක් විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගයට ඉදිරිපත් වූ සියලුම අයදුම්කරුවන් වෙත තැපැල් මඟින් යැවීමට හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය හරහා ප්‍රතිඵල නිකුත් කිරීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පියවර ගනු ඇත.

15. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම ගැසට් පත්‍රයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

16. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් පවතී නම්, එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සළකා කටයුතු කළ යුතුය.

**ඒ.එල්.කේ.විජේමාන්නගේ,**
අධ්‍යක්ෂ ජනරාල්,
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව.

2026 ජූලි මස 06 වැනි දින,
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

07 - 196/1

**ආරක්ෂක අමාත්‍යාංශය**

විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලක තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

1. ආරක්ෂක අමාත්‍යාංශයේ විධායක සේවා ගණයේ සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලක III ශ්‍රේණියේ තනතුරු 08ක් සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් 2026 ඔක්තෝබර් මස කොළඹ නගරයේ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවලදී පමණක් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

(අ.) අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications - Recruitment Exams / E.B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2026 ජූලි මස 13 වැනි දින පෙ.ව. 09.00 ට විවෘත වන අතර 2026 අගෝස්තු මස 07 වැනි දින ප.ව. 09.00 ට අවසන් වේ.

(ආ) දැනට රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

(ඇ) අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතුය.

2. විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව දැනුම කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්, තනතුර සඳහා පත් කිරීමට තෝරා ගනු ඇත.

3. (අ) පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

(*ආ*) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට හා 2012.03.23 දින අනුමත කර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/EST/5/1/1/1/201 හා 2025.02.10 දිනැති ලිපියෙන් සංශෝධනය කරන ලද ආරක්ෂක අමාත්‍යාංශයේ සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලක තනතුරේ බඳවා ගැනීමේ පටිපාටියේ නියමයන් හා කොන්දේසිවලට ද එම බඳවාගැනීමේ පටිපාටියේ මින්මතු කෙරෙන සංශෝධනවලට ද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද අංක 2310/29 සහ 2022.12.14 දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද 1956 පෙබරවාරි 17 දිනැති අංක 21 දරන පුපුරණ ද්‍රව්‍ය ආඥා පනතේ විධිවිධානවලට ද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 7/2007 හි විධිවිධානවලට ද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 20/2001 හි විධිවිධානවලට ද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද යටත්ව තෝරා ගනු ලබන අයදුම්කරුවන් සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලක තනතුරේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(*ඇ*) මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ. සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලක තනතුරේ III ශ්‍රේණියට බඳවා ගෙන වසර තුනක් (03) ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(*ඇ*) පත්වීමක් සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔබ පත්වීම සඳහා සුදුසුකම් සපුරාලූ භාෂා මාධ්‍යයට අනුව 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 සහ ඊට ආනුෂංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව ඔබ විසින් අදාළ පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කළ යුතු වේ.

4. 2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි SL 1 - 2025 වැටුප් කේතය මෙම තනතුරට හිමි වන අතර එයට අදාළ වැටුප් පරිමාණය, **රු. 82,150 - 10 x 2,400 - 8 x 2,940 - 17 x 3,900 -රු.195, 970 ක් වන අතර එම වැටුප ඔබට හිමිවන්නේ 2027.01.01 දින සිට වේ. පත්වීම ක්‍රියාත්මක වන දින සිට ඔබට මෙම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.**

5. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මෙම විභාගයෙන් විධායක සේවා ගණයේ සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලක III ශ්‍රේණියට බඳවාගනු ලබන නිලධාරින්ට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට නිලධාරියා යටත් විය යුතුය.

6. සුදුසුකම් : III ශ්‍රේණියේ සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලක තනතුරුවලට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ :-

(*අ*) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය;

(*ආ*) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. (ඒ අනුව 2005.08.07 දිනට හෝ ඊට පෙර හා 1991.08.07 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.);

***සටහන* :** අභ්‍යන්තර අයදුම්කරුවන්ට සහ දැනටමත් රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

(*ඇ*) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය;

(*ඈ*) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි;

(*ඉ*) සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය;

(*ඊ*) පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය: -

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක පන්ති සාමර්ථයක් සහිතව රසායනික විද්‍යාව පිළිබඳ විශේෂවේදී උපාධිය ලබා තිබීම;

*හෝ*

II. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක පළමු පෙළ සාමර්ථයක් හෝ දෙවන පෙළ ඉහළ පන්තියේ සාමර්ථයක් සහිතව රසායනික විද්‍යාව සහිතව විද්‍යාවේදී උපාධිය ලබා තිබීම;

*හෝ*

III. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක රසායනික විද්‍යාව සහිතව විද්‍යාවේදී උපාධිය සමග

රසායන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම;

*හෝ*

IV. රසායන විද්‍යා ආයතනයේ වරලත් සාමාජිකයකු වීම;

V. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් රසායනික විද්‍යාව සහිතව විද්‍යාවේදී උපාධිය සමග පුපුරණ ද්‍රව්‍ය පාලකගේ අධීක්ෂණය යටතේ පුපුරණ ද්‍රව්‍ය විෂයය ක්ෂේත්‍රයට අදාළව වසර 05 ක අඛණ්ඩ, සතුටුදායක සේවා කාලයක් සහිත ආරක්ෂක අමාත්‍යාංශයේ සේවයේ නියුතු නිලධාරියකු වීම.

*සටහන*.- **(ඊ) (v) හි සඳහන් නියමය 2012 මාර්තු 23 දිනට, පුපුරණ ද්‍රව්‍ය පාලකගේ අධීක්ෂණය යටතේ පුපුරණ ද්‍රව්‍ය විෂයය ක්ෂේත්‍රයට අදාළව ආරක්ෂක අමාත්‍යාංශයේ බලාත්මක නිලධාරින් ලෙස සේවයේ නියුතුව සිටි නිලධාරින්ට පමණක් අදාළ වේ.**

**සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් 2026 අගෝස්තු මස 07 දිනට හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්යය වේ.**

**7. විභාග පටිපාටිය**

**7.1 විභාග ආකෘතිය :**

(*අ*) මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. අයදුම්කරුවකු තමාට අදාළ එක් මාධ්‍යයක් තෝරා ගත යුතු අතර, විභාගයට නියමිත සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එම මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතුය. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ප්‍රශ්න පත්‍ර තුනකින් යුක්ත වේ.

| *අ.අ* | *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|
| 01 | අවබෝධය | පැය 02 | 100 | 40 |
| 02 | බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| 03 | ප්‍රායෝගික රසායන විද්‍යාව | පැය 02 | 100 | 40 |

I. **අවබෝධය**
මෙම ප්‍රශ්න පත්‍රය රචනයක්, සාරාංශයක් ලිවීම හා භාෂාව භාවිතය පිළිබඳ අයදුම්කරුවාගේ වැටහීම පරීක්ෂා කිරීම පිණිස සැකසුණු පාඨයන් කිහිපයකින් සමන්විත වේ. මෙම පාඨයන් ආශ්‍රයෙන් යටින් ඉරි ගැසූ පදයන්ගේ අර්ථය තනි වාක්‍යයකින් ප්‍රකාශ කරන ලෙස හෝ ඒ පිළිබඳව විචාරාත්මක සටහන් ලියා දක්වන ලෙස හෝ විකල්ප කාණ්ඩයකින් ඉතාමත් උචිත ප්‍රකාශය තෝරා දක්වන ලෙස හෝ දී ඇති ප්‍රශ්නය සඳහා උත්තර කිහිපයක් අතරින් නිවැරදි උත්තරය තෝරා දක්වන ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබේ.

II. **බුද්ධි පරීක්ෂණය**
පදගත සංඛ්‍යාත්මක සහ රූපාකර සංදර්භයක් තුළ ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් අයදුම්කරුවාගේ තර්කානුකූල විවරණ සහ විග්‍රහ ශක්තිය, නිවැරදිව සිද්ධි අනුමානයන්ට එළඹීමේ හැකියාව පිළිබඳව මැනීමක් කිරීම අරමුණු කොටගෙන සකස් කළ විෂයානුබද්ධ වාස්තවික ප්‍රශ්න ඇතුළත් (Objective Type) ප්‍රශ්න පත්‍රයකි.

III. **ප්‍රායෝගික රසායන විද්‍යාව**

**මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ලබන්නේ ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම, ඛණිජ සම්පත් ව්‍යාප්තිය, ආර්ථික වර්ධනය සඳහා රසායන විද්‍යාත්මක පදනම, පුපුරණ ද්‍රව්‍ය සංයුතිය හා භාවිතය. 1956 පෙබරවාරි 17 දිනැති අංක 21 දරන පුපුරණ ද්‍රව්‍ය ආඥා පනතේ හා 1969 අංක 33, 1976 අංක 36, 1978 අංක 14, 2005 අංක 18 දරන පනත් හරහා කරනු ලැබූ කාලීන සංශෝධන පිළිබඳ අවබෝධය පිරික්සීම සඳහාය. එය බහුවරණ, කෙටි ලිඛිත හා අර්ධ** ව්‍යුහගත ප්‍රශ්නවලින් සමන්විත වේ.

(*ආ*) මෙම තරග විභාගය මගින් පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට හතළිහක් (40%) අයදුම්කරුවන් විසින් ලබා ගත යුතුය. තරග විභාගය සඳහා වෙන්කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබා ගත් ලකුණු අනුපිළිවෙළ තරයේම අනුගමනය කරමින් පත්වීම් දෙනු ලැබේ.

*සටහන* .- **රාජකාරි කටයුතු සඳහා අයදුම්කරුවන්ගේ සුදුසුකම් හා හැකියාව පරීක්ෂා කිරීම පිණිස මෙම ප්‍රශ්න පත්‍ර සකස් කෙරේ.**

**7.2 විභාග ප්‍රතිඵල නිකුත් කිරීම**

(*අ*) පත්වීම් බලධාරියා විසින් ප්‍රතිඵල නිකුත් කිරීමට සුදුසු දිනය දන්වා එවූ පසු ලිඛිත විභාගයෙන් එක් එක් විෂයයට

ලබා ගත් ලකුණු / මුළු ලකුණු සඳහන් කළ ප්‍රතිඵල සටහනක් විභාගයට ඉදිරිපත් වූ සියලුම අයදුම්කරුවන් වෙත තැපැල් මගින් යැවීමට හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය හරහා ප්‍රතිඵල නිකුත් කිරීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පියවර ගනු ඇත.

(*ආ*) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට සිදුවනු ඇත. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

7.3 **විභාගය සඳහා මාර්ගගතව (Online) අයදුම් කිරීම සම්බන්ධයෙන් උපදෙස්**

(*අ*) මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිතා කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවිඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E- mail) ලිපිනයට හෝ දැනුම්දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(*ආ*) අයදුම්පත පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අයදුම්කරුවකු පෙනී සිටීමට නුසුදුසු බවක් පෙනී යන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවකදී වුව ද ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකි ය.

(*ඇ*) අයදුම්කරුවකු විසින් සපයන ලද තොරතුරු පසු කලකදී වැරදි බව පෙනී ගියහොත් හෝ ඔහු / ඇය විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළිවුවහොත් හෝ ඔහුට/ ඇයට තවදුරටත් පත්වීමක් ලබා දීම සම්බන්ධයෙන් සලකා බලනු නොබලන අතර, මෙම විභාගය හේතු කොට ගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහ කිරීමට වුව ද යටත් වේ.

**7.4 විභාග ගාස්තු ගෙවීම**

විභාග ගාස්තුව රු. 1,200 කි. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය:-

I. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card);
II. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පත් මගින් ( Any Bank Debit Card With the Facility Of Internet Transactions);
III. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය මගින් ( Online Banking Method of Bank of Ceylon);
IV. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් ( Any Branch of The Bank of Ceylon).

*සටහන* :-

(*අ*) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(*ආ*) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර, විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(*ඇ*) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදුකරනු නොලැබේ.

**7.5 විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම**

(*අ*) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මගින්/ අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ.

(*ආ*) තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග

දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ඇ) ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේදී/ සම්මුඛ පරීක්ෂණයේදී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

(ඈ) විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් රාජ්‍ය ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු / විශ්‍රාමික නිලධාරියකු/ කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු/ සාමදාන විනිශ්චයකාරවරයකු/ දිවුරුම් කොමසාරිස්වරයකු/ නීතිඥවරයකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියකු/ රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

**7.6 විභාගයට ඇතුළත් කර ගැනීම**

(අ) විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින විභාග දිනයේදී එහි විභාග මධ්‍යස්ථාන භාර ශාලාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

(ආ) අයදුම්කරුවකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අයදුම්කරුවකු විසින්ම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම ගැසට් පත්‍රයේ මුල පළ කර ඇත.

*සටහන*:- අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

(ඇ) විභාග අයදුම්කරුවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපතිවරයා සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා වලංගු වනුයේ පහත ලේඛන පමණි :-

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

(ඈ) විභාග අයදුම්කරුවන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා ඉලෙක්ට්‍රොනික සන්නිවේදන උපාංග පැළඳ ගෙන නොමැති බව තහවුරු කිරීම සඳහා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළත් විය යුතුය. එසේ තම අනන්‍යතාව තහවුරු කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණු සහ දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

8. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්වේ.

9. මෙම නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් ගැන ගැටලුවක් මතු වුවහොත් ඒ සම්බන්ධයෙන් ද විභාගය මගින් බඳවා ගත යුතු අයදුම්කරුවන් සංඛ්‍යාව සම්බන්ධයෙන් ද රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණයක් ගනු ලබන අතර, එය අවසන් තීරණය වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එයාර් වයිස් මාර්ෂල් සම්පත් තුයියකොන්තා (විශ්‍රාමික)
ඩබ්ලිව්ඩබ්ලිව්වී, ආර්ඩබ්ලිව්පී //, ආර්එස්පී /, යූඑස්පී,
එෆ්එන්ඩීයූ (චීනය), පීඑස්සී
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2026 ජූලි මස 08 වැනි දින.
ආරක්ෂක අමාත්‍යාංශය,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

07-185

## අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

### පරිවේණාචාර්යවරුන්, රජයේ අනුමත පෞද්ගලික පාසල්වල අනුමත පත්වීම්ධාරී ගුරුවරුන් සහ උපකෘත විශේෂ පාසල්වල අනුමත පත්වීම්ලාභී ගුරුවරුන් සඳහා I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026

1.0 ඉහත සඳහන් සේවාවන්ට අයත් නිලධාරීන්ගේ වැටුප් ගෙවීම්, ශ්‍රේණි උසස් කිරීම් හා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ ආදී සියලුම ආයතනික කටයුතු අංක 1885/38 හා 2014.10.23 දින නිකුත් කර ඇති අතිවිශේෂ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් විධිවිධාන අනුව සිදු කරනු ලබයි. ඒ අනුව අංක 2444/21 හා 2025.07.08 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ *ගැසට්* පත්‍රය මඟින් පළ කර ඇති ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ තෙවන සංශෝධනය සහ අංක 2493/61 හා 2026.06.19 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ *ගැසට්* පත්‍රය මගින් පළ කර ඇති ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ සිව්වන සංශෝධනයේ විධිවිධානයන්ට අනුකූලව I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2026 සැප්තැම්බර් මස පවත්වනු ලබන බවත් ඉහත විභාගය සඳහා පිරිවෙන්වල සේවය කරනු ලබන පරිවේණාචාර්යවරුන්, රජයේ අනුමත පෞද්ගලික පාසල්වල අනුමත පත්වීම්ධාරී ගුරුවරුන් සහ උපකෘත විශේෂ පාසැල්වල අනුමත පත්වීම්ලාභී ගුරුවරුන්හට පෙනී සිටීමට අවස්ථාව සලසා දෙන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මෙම විභාගය උපලේඛනය I හි සඳහන් නගරවල පිහිටුවන ලබන විභාග මධ්‍යස්ථානවලදී පමණක් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන ලද නගරය / නගර පසුව වෙනස් කිරීමට ඉඩ ලබා දෙනු නොලැබේ. කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම් කර නොමැති නම් එම අයදුම්කරුවන් ඔවුන්ගේ දෙවන මනාපය ලෙස දක්වන ලද නගරයේ හෝ ආසන්න වෙනත් නගරයක හෝ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ. තව ද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම් කර නොමැති නම් විභාගය කොළඹදී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

අයදුම්පත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doents.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications – Recruitment Exams /E.B. Exams" ඔස්සේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2026 ජූලි මස 13 වැනි දින පෙ.ව.09.00 ට විවෘත වන අතර 2026 ජූලි මස 31 වැනි දින ප.ව. 09.00 ට අවසන් වේ. අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපත් දෙකක් (02) ලබාගෙන එම පිටපත් දෙකෙහි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ සහතිකය සමග ඉන් එක් පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කළ යුතුය. අනෙක් පිටපත අවශ්‍ය විටක ඉදිරිපත් කිරීම සඳහා තමන් භාරයේ තබා ගත යුතු ය.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරා ගත යුතු ය.

2.0

I. මෙම විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ.

II. විභාග අපේක්ෂකත්වය ලැබීම සඳහා පනවා ඇති නීති, *ගැසට්* පත්‍රයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුන්ට සිදුවනු ඇත.

III. මෙම විභාගය සඳහා අයදුම් කළ හැක්කේ පරිවේණාචාර්යවරුන්, රජයේ අනුමත පෞද්ගලික පාසල්වල අනුමත පත්වීම්ධාරී ගුරුවරුන් සහ උපකෘත විශේෂ පාසල්වල අනුමත පත්වීම්ලාභී ගුරුවරුන්ට පමණි.

IV. මෙම විභාගය සඳහා විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන් ඉදිරිපත් වන්නේ නම් ඒ බව අයදුම්පතේ අනිවාර්යයෙන් සඳහන් කළ යුතු අතර අදාළ වෛද්‍ය සහතිකවල පිටපත් අයදුම්පතේ මුද්‍රිත පිටපතක් සමඟ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

3.0 විභාග ගාස්තු:

මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාග පළමු වරට පවත්වනු ලබන බැවින් ගාස්තු අයකරනු නොලැබේ.

4.0 අයදුම්පත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම:

මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E -mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් නිවැරදිව පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.0 විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

I. ජාතික හැඳුනුම්පත;
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය;

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

6.0 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත.

විභාගයට පෙනී සිටින නිලධාරින් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මගින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මඟින් දක්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත, ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේදී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

7.0 අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ අදාළ කාර්යක්ෂමතා කඩඉම් අවශ්‍යතාව සම්පූර්ණ කර ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

8.0 විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතු ය.

9.0 විභාග අයදුම්කරුවන් තමන්ට නියම කරන විභාග මධ්‍යස්ථානයේදී විභාගයට පෙනී සිටිය යුතු ය.

10.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරින්ට විභාගයට පෙනී සිටීමට හැකි වන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් අවශ්‍ය පරිදි රාජකාරි නිවාඩු ලබා දිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

11.0 විභාගය පැවැත්වෙන්නේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පමණි. ඒ අතුරින් තම පත්වීම් විෂයයට අදාළ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකි අතර, පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයකටම පිළිතුරු සැපයිය යුත්තේ එකම මාධ්‍යයෙනි. අයදුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

12.0 පරිවේණාචාර්යවරුන්, රජයේ අනුමත පෞද්ගලික පාසල්වල අනුමත පත්වීම්ධාරී ගුරුවරුන් සහ උපකෘත විශේෂ පාසල්වල අනුමත පත්වීම්ලාභී ගුරුවරුන් 3 පන්තියේ II ශ්‍රේණියට, 3 පන්තියේ I ශ්‍රේණියට හා ශ්‍රී ලංකා ගුරු සේවා

ව්‍යවස්ථාවේ 13.8හි සඳහන් අධ්‍යාපනවේදී උපාධි සුදුසුකම මත 2-II ශ්‍රේණියට බඳවා ගත් ගුරුවරුන් අදාළ ශ්‍රේණියට පත්වී වසර තුනක් (3) ගතවීමට පෙර I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ කළ යුතු ය.

13.0 විභාග පරිපාටිය :

13.1 *ප්‍රශ්න සැකැස්ම* :
අධ්‍යාපන විෂයභාර අමාත්‍යාංශය විසින් e-thaksalawa නිල වෙබ් අඩවියේ පළ කරන ලද පහත 13.2හි දක්වා ඇති ස්වයං අධ්‍යයන මොඩියුල සම්බන්ධ විෂය නිර්දේශය ආශ්‍රයෙන් සකස් වේ. මෙම කාර්යක්ෂමතා කඩඉම සඳහා වන ලිඛිත පරීක්ෂණය එම අදාළ මොඩියුල සියල්ලම ආවරණය වන සේ පහත පරිදි පැවැත්වේ.

| *ව්‍යුහය* | *ප්‍රශ්න සැකැස්ම* | *කාලය* | *ලකුණු* |
|---|---|---|---|
| I පත්‍රය | බහුවරණ | පැය 01 | 40 |
| IIපත්‍රය | ව්‍යුහගත ප්‍රශ්න හෝ අර්ධ ව්‍යුහගත ප්‍රශ්න | පැය 02 | 60 |

*සටහන* 1.- I පත්‍රය ලෙස විෂයානුබද්ධ දැනුම I පත්‍රය නිකුත් කරන අතර එය බහුවරණ ප්‍රශ්න 40 කින් සමන්විත වේ. II පත්‍රය ලෙස විෂයානුබද්ධ දැනුම II පත්‍රය නිකුත් කරන අතර එය අර්ධ ව්‍යුහගත ප්‍රශ්න 04 කින් සමන්විතය. එම ප්‍රශ්න පත්‍ර දෙකෙහිම අන්තර්ගත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

13.2 *විභාගය සඳහා විෂය නිර්දේශය :*

| *කාර්යක්ෂමතා කඩඉම* | *අදාළ වන මොඩියුල* |
|---|---|
| I වන කාර්යක්ෂමතා කඩඉම | 1. ගුරු නිපුණතා රාමුව හා ගුරු වෘත්තිකභාවය |
| | 2. ඉගැන්වීමේ ක්‍රමවේදය |
| | 3. අධ්‍යාපනය සඳහා ඩිජිටල් තාක්ෂණය |
| | 4. අධ්‍යාපනයට අදාළ නීතිය |

*සටහන 2.* - සාමර්ථය සඳහා ඉහත 13.1 වගුව මගින් දක්වන ලද I පත්‍රයේ සහ II පත්‍රයේ ලකුණුවල මුළු එකතුව 40% ක් හෝ ඊට වැඩිවන සේ ලබා ගත යුතු ය.

14.0 විභාග ප්‍රතිඵල නිකුත් කිරීම :- විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේ ක්‍රමවේදය පහත පරිදි වේ:-

I. විභාගයට පෙනීසිටිනසියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල පළාත් අනුව වෙන් වෙන් වශයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පිටපත් දෙකක් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කරනු ලබයි;

II. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කරනු ලබන එකී විභාග ප්‍රතිඵල ලේඛන පිටපත් දෙකෙන් එක් පිටපතක් අදාළ ගුරුවරුන්ගේ විභාග ප්‍රතිඵල සත්‍යාපනය කිරීමට හැකිවන පරිදි පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් කටයුතු කරනු ලැබේ;

III. එසේම, පරිවේණාචාර්යවරුන්, රජයේ අනුමත පෞද්ගලික පාසල්වල අනුමත පත්වීම්ධාරී ගුරුවරුන් සහ උපකෘත විශේෂ පාසල්වල අනුමත පත්වීම්ලාභී ගුරුවරුන්ගේ පත්වීම ස්ථිර කිරීමට හා ශ්‍රේණි උසස්වීම්වලට අදාළ වන කාර්යක්ෂමතා කඩඉම් විභාග ප්‍රතිඵල, විභාග දෙපාර්තමේන්තුව විසින් අයදුම්කරුට ද බාගත කිරීමට අවස්ථාව සලසා දෙනු ලැබේ. එසේ බාගත කර ගන්නා ප්‍රතිඵල ලේඛනය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත අයදුම්කරු විසින් ඉදිරිපත් කළ යුතු අතර, එම ප්‍රතිඵල ලේඛන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතින් සත්‍යාපනය කරගෙන අදාළ නිලධරයාගේ පෞද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කළ යුතු ය;

IV. එකී සත්‍යාපනය කරන ලද ප්‍රතිඵල පදනම් කරගෙන පළාත්/කලාප අධ්‍යාපන බලධරයන් විසින් අදාළ ගුරුවරුන්ගේ පත්වීම ස්ථිර කිරීම හා ශ්‍රේණි උසස් කිරීම සඳහා අදාළ කටයුතු කළ යුතුවේ;

V. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

15.0 මෙම විභාග නිවේදනය මඟින් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

16.0 සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**නාලක කලුවැව,**
ලේකම්,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය.

2026 ජූලි මස 06 වැනි දින,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය,
"ඉසුරුපාය",
බත්තරමුල්ල.

**උපලේඛනය I**

| *දිස්ත්‍රික්කය / නගරය* | *දිස්ත්‍රික් / නගර අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| වවුනියාව | 12 |
| මුලතිව් | 13 |
| කිළිනොච්චිය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| ත්‍රිකුණාමලය | 17 |
| කුරුණෑගල | 18 |
| පුත්තලම | 19 |
| අනුරාධපුරය | 20 |
| පොළොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොනරාගල | 23 |
| රත්නපුර | 24 |
| කෑගල්ල | 25 |

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියට (සංඛ්‍යාලේඛනඥ තනතුරට) බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

**මෙම දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු පවතින විධායක සේවා ගණයේ III ශ්‍රේණියට (සංඛ්‍යාලේඛනඥ තනතුරට) සුදුස්සන් තෝරා ගැනීමේ තරග විභාගය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ.**

**මෙම දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණය සඳහා පවතින බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධානයන්ට අනුව පුරප්පාඩු 28ක් පිරවීම සඳහා මෙම බඳවා ගැනීම සිදු කරන අතර, එම පුරප්පාඩු සියල්ල හෝ කිහිපයක් හෝ පිරවීමේ හෝ නොපිරවීමේ හෝ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ. පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ. මෙම විභාගය 2026 ඔක්තෝබර් මස කොළඹ දී පමණක් පවත්වනු ලැබේ.**

**අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ** www.doenets.lk වෙබ් අඩවියේ "Our Service" යටතේ ඇති "Online Applications – Recruitment Exams/E.B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. **මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2026.07.13 වැනි දින පෙ.ව. 09.00 ට විවෘත වන අතර 2026.08.10 වැනි දින ප.ව. 09.00 ට අවසන් වේ.**

දැනට රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය - 2026.08.10

**1. වැටුප් පරිමාණය :**

**2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 දරන වැටුප් චක්‍රලේඛයේ උපලේඛන I ට අනුව SL 1-2025 හි රු.82,150-10X2,400-8X2,940-17X3,900- රු.195,970/-ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ.**

**2. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :**

I. රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ පවතින විධිවිධානයන්ට ද එම බඳවා ගැනීම් පටිපාටියට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලට ද ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි හි විධිවිධානයන්ට ද අංක 2310/29 හා 2022.12.14 වැනි දිනැති *අති විශේෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයන් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ (සංඛ්‍යාලේඛනඥ තනතුරේ) III වන ශ්‍රේණියට පත් කරනු ලැබේ.

**II. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 21/2017 අනුව, මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිත ය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තව ද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.**

**III. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර 03ක පරිවාස කාලයකට යටත් ය.**

IV. විධායක සේවා ගණයේ III ශ්‍රේණියට පත් වී වසර 03ක් ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

V. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි IV පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ දැනට පවත්නා වූ හා මින් මතු පනවනු ලබන්නා වූ නීති රීති හා ව්‍යවස්ථාවලට අනුකූලව කටයුතු කළ යුතු ය. ඒ අනුව දැනට ක්‍රියාත්මක රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට පත්වී වසර 03 ක් ඇතුළත අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂාවේ/ භාෂාවල ප්‍රවීණතාව ලබා ගත යුතු ය.

VI. තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේදී භාර ගැනීමට අපොහොසත් වන හා / හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මඟ හරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම් අහෝසි කරනු ලැබිය හැකිය.

**3. අධ්‍යාපන සුදුසුකම් :**

(*අ*) සංඛ්‍යානය, ගණිතය, ආර්ථික විද්‍යාව, ප්‍රජා විද්‍යාව, ජනගහන අධ්‍යයනය, පරිගණක විද්‍යාව, තොරතුරු තාක්ෂණය, භූගෝල විද්‍යාව, සමාජ විද්‍යාව හෝ සිතියම් විද්‍යාව යන විෂයයන්ගෙන් අවම වශයෙන් එක් විෂයක් ප්‍රධාන විෂයයක් ලෙස අන්තර්ගත වූ,

a) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් ලැබූ හෝ,
b) ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් ලැබූ හෝ,
c) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 A වගන්තිය යටතේ පිළිගත්,

පන්ති සාමර්ථ්‍යයක් සහිත විශේෂ උපාධියක් ;

*හෝ*

(*ආ*) සංඛ්‍යානය, ගණිතය, ආර්ථික විද්‍යාව, ප්‍රජා විද්‍යාව, ජනගහන අධ්‍යයනය, පරිගණක විද්‍යාව, තොරතුරු තාක්ෂණය, භූගෝල විද්‍යාව, සමාජ විද්‍යාව හෝ සිතියම් විද්‍යාව යන විෂයයන්ගෙන් අවම වශයෙන් එක් විෂයක් ප්‍රධාන විෂයය ලෙස අන්තර්ගත වූ,

a) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් ලැබූ හෝ,
b) ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් ලැබූ හෝ,
c) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 A වගන්තිය යටතේ පිළිගත්,

පළමු හෝ දෙවන පන්ති (ඉහළ) සාමාර්ථයක් සහිත සාමාන්‍ය උපාධියක් ලබා තිබීම.

*සටහන :*

(i.) විශේෂ උපාධි සහතිකයක විශේෂිත විෂය ක්ෂේත්‍රය පිළිබඳ පැහැදිලි ව දක්වා නොමැති අවස්ථාවලදී, විශේෂිත ක්ෂේත්‍රය හැදෑරූ කාල සීමාව තුළදී උපයා ගත යුතු මුළු සම්භාරක අගයෙන් 2/3කට සමාන හෝ වඩා වැඩිවන අගයක් හිමි විෂයය ක්ෂේත්‍රය එම විශේෂ උපාධි පාඨමාලාවෙහි ප්‍රධාන විෂයය ලෙස සලකනු ලැබේ.

(ii.) සාමාන්‍ය උපාධියක් සඳහා අදාළ විෂයයන්ට හිමි මුළු සම්භාරක අගයෙන් 1/3කට සමාන හෝ වඩා වැඩි අගයක් හිමි වන විෂයයක් එම උපාධියේ ප්‍රධාන විෂයයක් ලෙස සලකනු ලැබේ.

**4. කායික සුදුසුකම් :**

I. සෑම අපේක්ෂකයකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා අන් සෑම අයුරකින් ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතු ය.

II. තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික යෝග්‍යතාවෙන් යුක්ත අය විය යුතු ය.

**5. වයස් සීමාව :**

**අවුරුදු 21ත් 35ත් අතර විය යුතු ය. "ඒ අනුව 2005.08.10 දිනට හෝ ඊට පෙර හා 1991.08.10 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත."**

**6. වෙනත් සුදුසුකම් :**

I. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

II. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

III. තනතුරට බඳවා ගැනීමට අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනයට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**7. බඳවා ගැනීමේ ක්‍රමය :**

7.1 **ලිඛිත විභාගය හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය**

7.1.1. විභාග කොමසාරිස් ජනරාල් විසින් විෂයානුබද්ධ සාමාන්‍ය දැනුම හා අභියෝග්‍යතාව යන විෂයයන් යටතේ පවත්වනු ලබන ලිඛිත විභාගයේ සමත් අයදුම්කරුවන් අතුරින් ඉහළ ම ලකුණු ලබාගත් අයදුම්කරුවන්ගේ සිට කුසලතා අනුපිළිවෙළට හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන අයදුම්කරුවන් සංඛ්‍යාවක් එම කොමිෂන් සභාව පත්කරනු ලබන සුදුසුකම් පරීක්ෂා කිරීමේ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත කැඳවනු ලබන අතර, එහිදී බඳවා ගැනීමේ පටිපාටි හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේ ද යන්න හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීමෙන් අනතුරු ව එසේ සුදුසුකම් සපුරා ඇති හා කායික යෝග්‍යතාවයෙන් යුතු අයදුම්කරුවන් ලිඛිත විභාගයේ ලකුණුවල කුසලතාවය අනුපිළිවෙළින් මෙම තනතුර සඳහා බඳවා ගනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දෙනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණයට කැඳවීම පත්වීම පිරිනැමීම සඳහා වූ සුදුසුකමක් ලෙස නොසැලකිය යුතු ය.

7.1.2 විෂය නිර්දේශය

විෂයානුබද්ධ සාමාන්‍ය දැනුම - කාලය පැය 2
(උපරිම ලකුණු 100)
(සමත් ලකුණු ප්‍රමාණය 40%)

- දේශීය හා ජාත්‍යන්තර සංඛ්‍යාලේඛන
- සංඛ්‍යාලේඛන හා ප්‍රජා සංවර්ධනය
- සංඛ්‍යාලේඛන සම්බන්ධිත නව ප්‍රවණතා
- සමාජ ආර්ථික තොරතුරු
- පරිසරය හා සමාජය
- භූගෝලීය සාධක හා ප්‍රජාව
- තොරතුරු තාක්ෂණය

අභියෝග්‍යතාව - කාලය පැය 1 (උපරිම ලකුණු 100) (සමත් ලකුණු ප්‍රමාණය 40%)

- ගැටලු හා ඒවාට හේතු හඳුනා ගැනීම, තීරණ ගැනීම, අන්තර් පුද්ගල සම්බන්ධතා පැවැත්වීම, සන්නිවේදන කුසලතාවය, ස්වයං විනය ප්‍රතිපත්ති හා උපාය මාර්ග සකස් කිරීම යනාදී වශයෙන් අපේක්ෂකයකු සතු විශිෂ්ට කළමනාකරණ කුසලතාවයන් යොමු කරනු ලබන සිද්ධි හා ප්‍රස්ථාවන් අනුසාරයෙන් නිර්ණය කිරීම මෙයින් අපේක්ෂා කෙරේ.

7.1.3 විභාග ප්‍රතිඵල නිකුත් කිරීම

**පත්වීම් බලධරයා විසින් ප්‍රතිඵල නිකුත් කිරීමට සුදුසු දිනය දන්වා එවූ පසු ලිඛිත විභාගයෙන් එක් එක් විෂයයට ලබා ගත් ලකුණු / මුළු ලකුණු සඳහන් කළ ප්‍රතිඵල සටහනක් විභාගයට ඉදිරිපත් වූ සියලුම අයදුම්කරුවන් වෙත තැපැල් මඟින් යැවීමට හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය හරහා ප්‍රතිඵල නිකුත් කිරීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පියවර ගනු ඇත.**

**8. විභාග කොන්දේසි**

**"විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ."**

I. විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකි ය. සෑම ප්‍රශ්න පත්‍රයකට ම පිළිතුරු සැපයිය යුත්තේ එකම භාෂා මාධ්‍යයකින් වන අතර, සෑම අපේක්ෂකයකුම ප්‍රශ්න පත්‍ර 02ට ම පෙනී සිටිය යුතුය. අපේක්ෂකයන්ට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. විභාග අයදුම්කරුවන් තමන්ට නියම කරන විභාග මධ්‍යස්ථානයේදී විභාගයට පෙනී සිටිය යුතු ය.

II. විභාග ගාස්තුව රු.1200/- කි. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම් සිදු කළ යුතුය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් ( Any Bank Debit Card with the Facility of Internet Transactions)
iii. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය / “Flex” යෙදවුම මගින් (Online Banking Method/ “Flex” App of Bank of Ceylon)
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් ( Any Branch of Bank of Ceylon)

- සටහන :-

(අ) ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

III. මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත විභාග දෙපාර්තමේන්තුවට ලැබුණු පසු එම මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

IV. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුරක් සඳහා හෝ සුදුසුකමක් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු වේ. තව ද මෙම නිවේදනයේ 3 ඡේදයේ (i) / (ii) සටහන්වල අවශ්‍යතා සපුරා නොමැති විටදී, නිවේදනයේ දැක්වෙන 7.1.2 අනුඡේදයේ දක්වා ඇති සමත් ලකුණු විභාගයෙන් ලබා ගත්තේ වුවද අපේක්ෂකයකු මෙම තනතුරට පත්කරනු ලැබීමට සුදුස්සකු නොවන්නේ ය.

**ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්:- ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.**

**V. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මගින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන**

**ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතු ය. විභාග ශාලාවේ දී / සම්මුඛ පරීක්ෂණයේදී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.**

**VI.** **විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුවන්ගේ අත්සන සහතික කර තිබිය යුතු අතර, අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රය විභාගය සඳහා පෙනී සිටි පළමු දිනයේදීම විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.**

**VII.** **රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත විභාගය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල් සතු වේ.**

VIII. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට / ඇයට සිදුවනු ඇත

09. අපේක්ෂකයාගේ අනන්‍යතාව: විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් සෑම අපේක්ෂකයකු ම විභාග ශාලාවේ දී තම අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍රවලින් එකක් පමණක් පිළිගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමකින් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළත් විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

10. **සම්මුඛ පරීක්ෂණය**

I. **ලිඛිත පරීක්ෂණයෙන් තෝරාගනු ලබන අපේක්ෂකයන් සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් ලියවිලි ඉදිරිපත් කළ යුතු ය.**

**a)** **උප්පැන්න සහතිකය**

**b)** **ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය**

c) උපාධි (උපාධි සහතිකය හා විස්තරාත්මක උපාධි සහතිකය) හා අනෙකුත් අදාළ අධ්‍යාපන සහතික

d) චරිත සහතික 02 ක් (මින් එක් සහතිකයක් ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද මාස 06 නොඉක්ම වූ සහතිකයක් විය යුතු ය)

e) ඔබ භාවිත කරන නමේ හා උප්පැන්න සහතිකයේ හෝ අනෙකුත් සහතිකවල සඳහන් කර ඇති නමේ සුළු හෝ වෙනසක් ඇත්නම් එම වෙනස පැහැදිලි කිරීම සඳහා විධිමත් ආකෘතියකින් යුත් දිවුරුම් ප්‍රකාශයක් (අදාළ සහතිකවල නම් වෙන වෙන ම සඳහන් කරමින් එම නම්වලින් සඳහන් වන්නේ එකම පුද්ගලයකු බව ප්‍රකාශ කරමින් රු.50/- ක අවලංගු නොකරන ලද මුද්දරයක් උඩ ඔබගේ අත්සන තබා සාමදාන විනිශ්චයකරුවකු හෝ දිවුරුම් කොමසාරිස්වරයකු එය සනාථ කළ යුතුය.) ඉදිරිපත් කළ යුතු ය.

f) වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික (ඇතොත්)

g) සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතිකය

II. අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන අවස්ථාවේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. ඉදිරිපත් කර ඇති යම්

කරුණක් සාවද්‍ය බව තනතුරකට තෝරා ගැනීමෙන් පසු හෙළිවුවහොත් හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින් ම යටපත් කර ඇත්නම් හෝ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

11. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙහි ඇතුළත් කර නොමැති සහ මෙම බඳවා ගැනීමට අදාළ වෙනත් කරුණු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය, අවසන් තීරණය විය යුතු ය.

12. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර, කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි විටක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි ,**

ලේකම්,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,

07 - 184